සැ. යු.- 2014.03.21 දින පළ වූ අංක 1,855 දරන ගැසට් පත්‍රයේ II සහ IV (අ) කොටස් පළ නොවීය.

# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

අංක 1,856 - 2014 මාර්තු මස 28 වැනි සිකුරාදා - 2014.03.28

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

## I වැනි කොටස : (IIඅ) වැනි ඡෙදය - පළකිරීම්

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත.)


| | පිටුව | | පිටුව |
|---|---|---|---|
| තනතුරු - ඇබෑර්තු ... ... ... ... | 428 | විභාග, විභාග ප්‍රතිඵල ආදිය ... ... ... | 435 |


**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

### වැදගත් නිවේදනයයි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ අවසන් පිටුවේ සෑම මාසයක ම මුල් සතියේ දී පළ කරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳව මින් අවධානය යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ පළ කිරීම සඳහා දැන්වීම් භාරගැනීම ගැසට් පත්‍රය පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි* දහවල් 12.00 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාල වේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලු ම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතු ය. **නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම් සහ පැමිණිලි ගැසට් පත්‍රය පළ වූ දින සිට තෙමසකට පසුව භාරගනු නොලැබේ.**

*ගැසට් පත්‍රයේ පළ කරන සෑම දැන්වීමක් ම ගැසට් පත්‍රය පළ කරනු ලබන දිනට සති දෙකකට පෙර එනම්,* 2014 අප්‍රේල් මස 17 වැනි දින පළ කෙරෙන ගැසට් පත්‍රයේ දැන්වීම් 2014 අප්‍රේල් මස 04 වැනි දින දහවල් 12.00ට හෝ ඊට පෙර තැපෑලෙන් හෝ ගෙනවිත් රජයේ මුද්‍රණාලයට භාරදිය යුතු ය.

**2006 අංක 19 දරන ඉලෙක්ට්‍රොනික ගනුදෙනු පනත - 9 වැනි වගන්තිය**

*''යම් ප්‍රකාශනයක්, රීතියක්, නියෝගයක්, නියමයක්, අතුරු ව්‍යවස්ථාවක්, නිවේදනයක් හෝ වෙනත් කිසිවක් ගැසට් පත්‍රයේ පළ කළ යුතු බවට යම් පනතකින් හෝ නීති ප්‍රඥප්තියකින් විධිවිධාන සලස්වා ඇති අවස්ථාවක, ඒ රීතිය, නියෝගය, නියමය, අතුරු ව්‍යවස්ථාව, නිවේදනය හෝ වෙනත් දෙය ඉලෙක්ට්‍රොනික ස්වරූපයේ වන ගැසට් පත්‍රයක පළ කරනු ලැබුවහොත් ඒ විධිවිධානය සම්පූර්ණ කර ඇත්තාක් සේ සැලකිය යුතුය."*

**පී. එච්. එල්. වී. ද සිල්වා,**
රජයේ මුද්‍රණාලයාධිපති. (වැ. බ.).

2014 ජනවාරි මස 01 වැනි දින,
කොළඹ 08,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ දී ය.

*මෙම ගැසට් පත්‍රය www. documents. gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

425- B 80824—3,274 (2014/03)
B1-

## ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයෙහි පළ කරනු ලබන රාජ්‍ය සේවා පත් කිරීම්වලට අදාළ වන පොදු කොන්දේසි

**අවශ්‍ය සාමාන්‍ය සුදුසුකම් :**

1.1 තමා ශ්‍රී ලාංකිකයෙකු බවට ප්‍රමාණවත් සාක්ෂි සෑම අයදුම්කරුවකු විසින් ම ඉදිරිපත් කළ යුතුය.

ශ්‍රී ලාංකික යනුවෙන් අදහස් කෙරෙනුයේ ලංකා පුරවැසි පනතේ අර්ථ දක්වා ඇති පරිදි පාරම්පරික වශයෙන් හෝ ලියාපදිංචි කරවා ගැනීමෙන් හෝ ශ්‍රී ලංකාවේ පුරවැසිකම් ලැබූවෙකි.

1.2 ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික පත්‍ර විභාගයෙන් හෝ ඊට සමාන හෝ ඊට වඩා උසස් විභාගයකින් සමත් වී තිබීම අවම අධ්‍යාපනික සුදුසුකමක් වශයෙන් නියම කොට ඇති යම් තනතුරක් සඳහා ඉල්ලුම් කරන අයදුම්කරුවෙකු සිංහල හෝ දෙමළ හෝ මාධ්‍යයෙන් අධ්‍යාපනය ලැබූ අයෙකු වේ නම්, ඔහු ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික පත්‍ර විභාගයෙන් හෝ ඊට සමාන විභාගයකින් හෝ සිංහල හෝ දෙමළ හෝ භාෂාව විෂයයෙන් අවස්ථාවෝචිත පරිදි සමත් වී සිටිය යුතු ය. (1961 ජනවාරි මස 01 වැනි දිනට පෙර දිනක සිට රාජ්‍ය සේවයෙහි යෙදී සිටින්නාවූත් රාජ්‍ය සේවයෙහි වෙනත් තනතුරුවලට ඉල්ලුම් කරන්නාවූත් නිලධාරීන් විෂයයෙහි මෙම නියමය අදාළ නොවන්නේ ය.)

*1.3 අයදුම් කරනු ලබන තනතුර සඳහා නියමිත ඉහළම රාජ්‍ය භාෂා ප්‍රවීණතා පරීක්ෂණවලින් නිදහස් කිරීමට හිමිකම් ලබන සුදුසුකම් පසු කලක දී ලබා තිබේ නම් මිස, නියමිත රාජ්‍ය භාෂා ප්‍රවීණතා පරීක්ෂණය සමත්වීමට අපොහොසත්වීම නිසා පරිවාස/පරීක්ෂණ කාලයකට යටත්ව දෙන ලද සිය පත්වීම අවසන් කරනු ලැබූ, සිංහල හෝ දෙමළ හෝ නොවන භාෂා මාධ්‍යයකින් රජයේ සේවයට ඇතුළත්ව සිටි නව ප්‍රවේශක නිලධාරීන්ගෙන් ලැබෙන අයදුම්පත් භාරගනු නොලැබේ.

**2. සේවා කොන්දේසි - සාමාන්‍ය :**

2.1 රාජ්‍ය සේවයෙහි යෙදී සිටින සියලු ම නිලධාරීහු මුදල් රෙගුලාසි, ආයතන සංග්‍රහය, දෙපාර්තමේන්තු නියෝග හෝ රෙගුලාසි සහ රජය විසින් වරින් වර නිකුත් කරනු ලැබිය හැකි වෙනත් නියෝග හෝ රෙගුලාසිවලට යටත් විය යුත්තා හ.

2.2 අදාළ අමාත්‍යාංශයෙහි ලේකම් විසින් තීරණය කරනු ලැබිය හැකි ප්‍රමාණයේ මුදලක් එම ලේකම් විසින් තීරණය කරනු ලැබිය හැකි අන්දමකින් ඇප තබන ලද රාජ්‍ය සේවා නිලධාරීන්ගේ (ඇප) ආඥාපනත යටතේ රාජ්‍ය නිලධාරියකුට නියම කරනු ලැබිය හැකි ය.

2.3 දිවයිනේ ඕනෑ ම තැනක සේවය කිරීමට රාජ්‍ය නිලධාරියෙකුට නියම කරනු ලැබිය හැකිය.

**3. ස්ථිර පත්වීම් දරන රාජ්‍ය නිලධාරීන්ට අදාළ සේවා කොන්දේසි**

3.1 ස්ථිර පත්වීම් දරන රාජ්‍ය නිලධාරිහු පූර්වෝක්ත 2 වැනි වගන්තියේ සඳහන් කොන්දේසිවලට අතිරේක වශයෙන් පහත දැක්වෙන අනිකුත් කොන්දේසිවලට ද යටත් විය යුතුය.

3.1.1 යම්කිසි තනතුරක පරිවාස කාලය අවුරුදු තුනකට වැඩි විය යුතු යැයි සලකනු ලබන්නේ නම් විනා එසේ නොමැති නම් සියලු ම පත් කිරීම් අවුරුදු තුනක පරිවාස කාලයකට යටත් වනු ඇත. පරිවාස කාලය තුළ හේතුවක් නොදක්වා සේවය නතර කරනු ලැබිය හැකිය.

3.1.2 සියලු ම රාජ්‍ය නිලධාරීහු රාජ්‍ය භාෂා ප්‍රතිපත්තියෙහි අවශ්‍යතාවයන් සඳහා ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ IV වන පරිච්ඡේදයේ විධිවිධාන සහ රජයේ භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම සඳහා දැනට පවත්නා වූ සහ මින් මතු පනවනු ලබන්නාවූ අනෙකුත් නීති, රෙගුලාසි සහ ව්‍යවස්ථා ද පිළිපැදිය යුත්තාහ.

3.1.3 රාජ්‍ය භාෂාවකින් වැඩ කිරීමට හැකිවන අන්දමේ දැනුමක් තමන්ගේ පරිවාස කාලය ඇතුළත ලබාගන්නා ලෙස සිංහල හෝ දෙමළ නොවන භාෂා මාධ්‍යයකින් රාජ්‍ය සේවයට ඇතුළත් වූ නිලධාරීන්ට නියම කෙරේ.

3.1.4 සිංහල හෝ දෙමළ හෝ නොවන වෙනත් භාෂා මාධ්‍යයකින් සේවයට ඇතුළත් වූ නිලධාරියෙකු පරිවාස කාලය අවසානයේ දී තනතුරෙහි ස්ථිර කරනු ලැබීමට අදාළ වන වෙනත් කරුණු අතර, අවුරුද්දක් ඇතුළත කවර හෝ රාජ්‍ය භාෂාවකින් නියමිත ප්‍රවීණතා පරීක්ෂණයෙහි I වැනි ශ්‍රේණියෙන් සමත්වීමත්, අවුරුදු දෙකක් ඇතුළත II වැනි ශ්‍රේණියෙන් සමත්වීමත් (අවශ්‍යනම්) අවුරුදු තුනක් ඇතුළත III වැනි ශ්‍රේණියෙන් සමත්වීමත් බලපවත්වනු ඇත.

නියමිත කාල සීමා ඇතුළත දී පරීක්ෂණයකින් අසමත් වුවහොත් වැටුප් වර්ධකයක් තාවකාලිකව අත්හිටුවනු ලැබිය හැකි ය. නියමිත කාලසීමාව ඉක්මවා තව මාස හයක කාලසීමාවක් ඇතුළත යථෝක්ත පරීක්ෂණයෙන් සමත්වීමට අසමත් වුවහොත් එසේ වැටුප් වර්ධක තාවකාලිකව අත්හිටුවීම, වැටුප් වර්ධක නතර කිරීමකට පරිවර්තනය කෙරෙනු ඇත. පරීක්ෂණයෙන් සමත්වන තෙක් හෝ පහත දැක්වෙන 3.1.6 වැනි වගන්තියේ විධිවිධානයන් බලපවත්වන තෙක් හෝ යථෝක්ත වැටුප් වර්ධකයන් නතර කිරීම ක්‍රියාත්මක වන්නේය.

3.1.5 මෙවැනි නිලධාරීන්ට පත්වීම ලැබීමෙන් පසු රාජ්‍ය භාෂාවක ප්‍රවීණතාවය ලබා ගැනීම පිණිස මාස හයක කාලයක් සඳහා පූර්ණ වැටුප් සහිත පහසුකම් සැලසිය යුතුය. ඉන් අනතුරුව අදාළ ප්‍රවීණතා විභාගයට ඔහු පෙනී සිටිය යුතු අතර, එම විභාගයෙන් අසමත් වුවහොත් පූර්ණ වැටුප් සහිත මාස හයක කාල පරිච්ඡේදයෙන් පසු ඒ සමගම එළඹෙන අවුරුදු දෙකක කාල පරිච්ඡේදය තුළ තමාගේ සාමාන්‍ය රාජකාරිවල නිරත වෙමින් සිටිය දී විභාගයෙන් සමත්වීමට ඔහුට අවස්ථාව සලසා දෙනු ලැබේ.

3.1.6 නියමිත අවුරුදු දෙකහමාරක කාල පරිච්ඡේදය තුළ විභාගයෙන් සමත්වීමට නොහැකි වුවහොත් ඔහුගේ සේවය අවසන් කරනු ලැබේ.

3.1.7 රාජ්‍ය සේවයෙහි ස්ථිර තනතුරක දැනටමත් ස්ථිර කරනු ලැබ සිටින රාජ්‍ය නිලධාරියෙකු රාජ්‍ය සේවයෙහි වෙනත් ස්ථිර තනතුරකට පත් කරනු ලැබූ විට යළි පරිවාස කාලසීමාවක් සේවය කරන ලෙස සාමාන්‍යයෙන් ඔහුට නියම කරනු නොලැබේ. එවැනි නිලධාරියෙකු සිය නව තනතුරෙහි කරන සේවය පරීක්ෂා කර බැලීම සඳහා ප්‍රථමයෙන් එම තනතුරෙහි නියමිත කාලසීමාවක් වැඩ බැලීම සඳහා ඔහු පත් කරනු ලැබිය හැකි ය.

3.1.8 (රාජ්‍ය සේවයෙහි දැනටමත් ස්ථිර/තාවකාලික තනතුරු දරන්නා වූ ද වෛද්‍ය පරීක්ෂණයකට භාජනය කරනු ලැබුවා වූ ද, අය හැර) තෝරාගනු ලැබූ අපේක්ෂකයන් දිවයිනේ ඕනෑම පෙදෙසක සේවය කිරීමට ශාරීරිකව සුදුසුද නැද්ද යනු පරීක්ෂා කිරීම පිණිස රජයේ වෛද්‍ය නිලධාරියෙකු විසින් පවත්වනු ලබන වෛද්‍ය පරීක්ෂණයකට ඉදිරිපත්වන ලෙස ඔවුනට නියම කරනු ඇත.

**4. සේවයට භාර ගැනීම පිළිබඳ කොන්දේසි**

4.1 ස්ථිර හා විශ්‍රාම වැටුප් සහිත තනතුරුවලට පත් කරනු ලබන රාජ්‍ය නිලධාරීන් විසින් ඔවුන්ගේ වැටුපෙන් අයකර ගතයුතු යැයි රජය විසින් නියම කරනු ලබන ප්‍රතිශතයක ප්‍රමාණයට සමාන මුදලක් ස්වකීය වැටුපෙන් වැන්දඹු සහ අනත්දරු විශ්‍රාම වැටුප් ක්‍රමයට දායක මුදල් වශයෙන් ගෙවිය යුතුය.

4.2 අර්ථසාධක අරමුදල් පදනම මත ස්ථිර හෝ තාවකාලික තනතුරුවලට පත්කරනු ලැබූ රාජ්‍ය නිලධාරීන් ස්වකීය ඒකාබද්ධ වැටුපෙන් 6%ක් රාජ්‍ය සේවා අර්ථසාධක අරමුදලට දායක මුදල් වශයෙන් ගෙවිය යුතු වන්නේ ය. මුදල් වර්ෂය අවසානයේ දී අනිවාර්ය දායක මුදල් වශයෙන් අරමුදලට බැරකර ඇති මුදල් ප්‍රමාණය මෙන් 150%ක මුදල් ප්‍රමාණයක් රජය විසින් එම අරමුදලට රජයේ දායක මුදල වශයෙන් ගෙවනු ඇත.

4.3 පළාත් පාලන සේවයේ විශ්‍රාම වැටුප් සහිත තනතුරුවලට මුදවා හරිනු ලබන රාජ්‍ය සේවයේ විශ්‍රාම වැටුප් සහිත තනතුරු උසුලන්නා වූ නිලධාරීන් සහ රාජ්‍ය සේවයේ විශ්‍රාම වැටුප් සහිත තනතුරුවලට මුදවා හරිනු ලැබ පළාත් පාලන සේවයේ (විශ්‍රාම වැටුප් සහිත) තනතුරු උසුලන්නා වූ නිලධාරීන්හට පිළිවෙලින් ඔවුන්ගේ පළාත් පාලන සේවයේ සහ රාජ්‍ය සේවයේ තනතුරු සහ විශ්‍රාම වැටුප් හිමිකම් දෙනු ලැබේ.

4.4 විශ්‍රාම වැටුප් ව්‍යවස්ථා සංග්‍රහය යටතේ රාජ්‍ය සේවයේ විශ්‍රාම වැටුප් සහිත තනතුරුවලට මුදවා හරිනු ලැබූ යුද, නාවික සහ ගුවන් හමුදාවේ නිත්‍ය සේවයෙහි නියුතු පිරිසට ඔවුන්ගේ රාජ්‍ය සේවයෙහි තනතුරු සඳහා විශ්‍රාම වැටුප් හිමිකම් දෙනු ලැබේ. මෙම ව්‍යවස්ථා සංග්‍රහය යටතේ විශ්‍රාම වැටුප් සහිත බවට ප්‍රකාශිත තනතුරක රාජ්‍ය නිලධාරියෙක් ලෙස පත්වීමක් භාර ගැනීම සඳහා මුදා හරිණු ලැබූ සන්නද්ධ හමුදාවක යම් සාමාජිකයෙකුගේ සම්පූර්ණ වැටුප් සහිත අහිමි නොවූ සේවා කාලසීමාව මේ ව්‍යවස්ථා සංග්‍රහයේ පටහැනිව කුමක් සඳහන්ව තිබුණ ද, මේ ව්‍යවස්ථා සංග්‍රහය යටතේ ගෙවිය යුතු යම් විශ්‍රාම වැටුප් පාරිතෝෂිකයක කාර්යය සඳහා ගණන් ගත යුතු ය.

**5. යුද්ධ සේවා අනුග්‍රහය**

5.1 එක්සත් රාජ්‍ය යුද්ධාවතීරණ හමුදාවන්හි සේවා මුක්ත භටයින් ද, සහාය ගිනි නිවන, ගගන ප්‍රහාර නිවාරණ සහ මහජන ආරක්ෂක සේවාවන්හි පූර්ණකාලීන සාමාජිකයන් වශයෙන් නියුක්තව සිටි තමන්ගේම ඕනෑකමින් එම සේවාවන්ගෙන් අස්ව නොගිය අයට ද ඉහත කී සියලු සුදුසුකම් තිබේ නම් ද ඔවුන් මෙම හමුදාවන්ට බැඳී ඇත්තේ 1954 අගෝස්තු මස 15 වැනි දිනට පෙරාතුව නම් ද, ඔවුන්ගේ එම සේවාවන් සතුටුදායක ලෙස සහ අඛණ්ඩව පැවතිණි නම් ද, වයස අතින් සුදුසුකම් ලබා ගැනීම සඳහා ඔවුන්ට තමන්ගේ වයස්වලින් 1939 සැප්තැම්බර් මස 03 වැනි දින සිට 1949 දෙසැම්බර් මස 31 වැනි දින දක්වා වූ කාලසීමාව තුළ තම තමන් සේවය කළ කාලයන් අඩුකර ගැනීමට ඉඩදෙනු ලැබේ.

**6. රාජ්‍ය සේවයෙහි දැනට සේවය කරන නිලධාරීහු**

6.1 රාජ්‍ය සේවයෙහි දැනට සේවයෙහි යෙදී සිටින්නාවූත්, අවශ්‍ය සියලු සුදුසුකම් ඇත්තාවූත්, නිලධාරීන් විසින් ඉදිරිපත් කරන අයදුම්පත් ඔවුන්ගේ දෙපාර්තමේන්තු ප්‍රධානීන්ගේ මාර්ගයෙන් එවිය යුතුය. නව තනතුරු සඳහා ඉල්ලුම් කරන්නා වූ ද, රාජ්‍ය සේවයෙහි දැනට ස්ථිර තනතුරු දරන්නා වූ ද, නිලධාරීන්ගෙන් යමෙකු නව තනතුරකට තෝරාගනු ලැබුවහොත් ඒ සඳහා ඔවුන් මුදවාලිය හැකි ද නොහැකි ද යන්න එම නිලධාරීන් සේවයෙහි යෙදී සිටින දෙපාර්තමේන්තුවල ප්‍රධානීන් විසින් ඔවුන්ගේ අයදුම්පත් ඉදිරිපත් කරන විට සඳහන් කළ යුතු ය.

6.2 නියමිත වේලාවක නියමිත ස්ථානයක දී සම්මුඛ පරීක්ෂණයක් සඳහා පෙනී සිටින ලෙස අයදුම්කරුවන්ට නියම කරනු ලැබිය හැක. මේ සම්බන්ධයෙන් දුරීමට සිදුවන ගමන් වියදම් හෝ වෙනත් වියදම් ආදියත් ගෙවනු නොලැබේ.

6.3 යම්කිසි අයදුම්කරුවකු නිර්දේශ කිරීමට අදහස් කරන කෙනෙකු විසින් අයදුම්කරුට චරිත සහතිකයක් දීමෙන් එසේ කළ යුතු ය. යම් අයදුම්කරුවකු තෝරා ගන්නා පරිද්දෙන් කවර අන්දමේ වුව ද අයථා අනුග්‍රහයන් පැතීම හෝ එහිලා යම් බලපෑමක් කිරීමට තැත් කිරීම හෝ එම අයදුම්කරු නුසුදුස්සකු කරනු ලැබීමට හේතුවනු ඇත.

6.4 අයදුම්කරුගේ අයදුම්පතෙහි කිසියම් සාවද්‍ය ප්‍රකාශයක් තිබෙන බැව් ඔහු තෝරා ගැනීමට කලින් දැන ගන්නට ලැබුණි නම් ඒ හේතුවෙන් ඔහු එම තනතුරට නුසුදුස්සකු බවට පත් කරනු ලැබීමටත්, තෝරා ගැනීමෙන් පසු ඒ බව අනාවරණය වුණි නම් ඔහු රාජකාරියෙන් පහකරනු ලැබීමටත් ඉඩ තිබේ.

6.5 මෙම දැන්වීමෙහි සඳහන් වන නියමයන්ට සෑම අතින් ම අනුකූල නොවන අන්දමේ අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

**7. සුදුසුකම් පිළිබඳ අවශ්‍යතාවයන් සඳහා වැටුප් යන්නෙහි අර්ථ දැක්වීම**

7.1 සුදුසුකම් පිළිබඳ අවශ්‍යතාවයන් සඳහා වැටුප යන්නෙන් අදහස් කෙරෙනුයේ ඒකාබද්ධ වැටුප පමණකි. වැඩ බැලීමේ වැටුපක් හෝ දීමනා ආදිය ඊට ඇතුළත් නොවන්නේ ය.

**8. බඳවා ගැනීම සහ උසස් කිරීම සම්බන්ධ නව ජාතික ප්‍රතිපත්තිය**

පසුව නිකුත් කෙරෙන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ මගින් සංශෝධනය කිරීමට යටත්ව 1990.08.09 දිනැති අංක 15/90, 1990.03.05 දිනැති අංක 15/90(I) සහ 1990.06.15 දිනැති අංක 15/90 (II) දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛවල දක්වා ඇති ප්‍රතිපත්තියට අනුකූලව රාජ්‍ය සේවයට, පළාත් රාජ්‍ය සේවයට, රාජ්‍ය සංස්ථා අංශයට සහ රජයට සම්පූර්ණයෙන්ම අයත් සමාගම්වලට බඳවා ගැනීම සහ උසස් කිරීම 1990.01.01 වැනි දින සිට සිදුකරනු ඇත.

# විභාග අපේක්ෂකයන් සඳහා නීති සහ උපදෙස්

"1968 අංක 25 දරන විභාග පනතේ දක්වා ඇති විධිවිධානයන්ට අනුකූලව කටයුතු කිරීමට සියලුම විභාගාපේක්ෂකයින් බැඳී ඇත"

සියලු ම විභාගාපේක්ෂකයින් පහත සඳහන් නීති පිළිපැදීමට බැඳී සිටිය යුතුය. මේ නීති කිසිවක් උල්ලංඝනය කරන විභාගාපේක්ෂකයෙකුට විභාග කොමසාරිස්ගේ අභිමතය පරිදි පහත සඳහන් දඬුවම් එකක් හෝ ඊට වැඩි ගණනක් හෝ පමුණුවනු ලැබිය හැකිය :-

(i) මුළු විභාගයටම හෝ ඉන් කොටසකට හෝ නැතහොත් එක් විෂයයකට හෝ ඉන් කොටසකට පෙනී සිටීම හෝ තහනම් කිරීම,
(ii) විභාගයේ එක් විෂයයකට හෝ මුළු විභාගයටම හෝ නුසුදුස්සෙකු කිරීම,
(iii) එක් අවුරුද්දකට හෝ අවුරුදු දෙකකට හෝ කිසිම විභාගයකට පෙනී සිටීම තහනම් කිරීම,
(iv) මුළු ජීවිත කාලයේ ම විභාගයකට පෙනී සිටීම තහනම් කිරීම,
(v) සහතික පත්‍රය යම්කිසි කාල සීමාවක් තුළ තහනම් කිරීම,
(vi) විභාගාපේක්ෂකයාගේ ක්‍රියා පරිපාටිය සම්බන්ධයෙන් ඔහු ගැන වගකිවයුත්තන්ට සැලකර සිටීම හෝ විභාගාපේක්ෂකයා පොලීසියට භාරදීම හෝ ඔහුගේ ක්‍රියාව සම්බන්ධයෙන් පොලීසියට පැමිණිලි කිරීම.

විභාගයට කලින් හෝ විභාගය පවත්වාගෙන යන අතරතුර හෝ විභාගයට පසුව හෝ කොයිම අවස්ථාවකදී වුවත් එවැනි විභාගාපේක්ෂකයෙකු සම්බන්ධයෙන් ක්‍රියා කිරීමේ බලය විභාග කොමසාරිස් සතු වේ. ඒ සම්බන්ධයෙන් ඔහුගේ තීරණය අවසාන තීරණය වන්නේ ය. එහෙත් රජයේ සේවකයන් බඳවා ගැනීම සඳහා පවත්වනු ලබන විභාග පිළිබඳ ව විභාග කොමසාරිස්ගේ තීරණය රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ සමීක්ෂණයට යටත් වන්නේ ය.

1. සියලු ම විභාගාපේක්ෂකයන් විභාග ශාලාව තුළදීත් ඒ අසලදීත් විභාග ශාලාධිපතීන්ට ද, ඔහුගේ සහකාරයින්ට ද, අනිකුත් විභාගාපේක්ෂකයින්ට ද බාධාවක් හෝ අවහිරයක් හෝ ඇති නොවන ලෙස ශාන්තදාන්තව හැසිරිය යුතුය. විභාග ශාලාවට ඇතුළු වන විටත්, ඉන් පිටවන විටත් ඉතා සන්සුන් ලීලාවෙන් හැසිරිය යුතුය.

2. විභාගාපේක්ෂකයෝ විභාග ශාලාධිපතීන්ට කීකරු විය යුත්තාහ. එබැවින් ඔවුන් විභාගය පවත්වාගෙන යන අතරතුරත්, විභාගය පටන් ගැනීමට පෙරත්, විභාගය අවසන් වූ විගසත් විභාග ශාලාධිපතීන්ගේ හා ඔහුගේ සහකාරයන්ගේ උපදෙස් අනුව ක්‍රියා කළ යුතු ය.

3. විභාගයේ දී ප්‍රශ්න පත්‍රයකට උත්තර ලිවීම පටන්ගෙන පැය භාගයක් ගතවූවාට පසු මොනම කාරණයක් නිසාවත් විභාගාපේක්ෂකයෙකු විභාග ශාලාවට ඇතුළු කරගනු නොලැබේ. විභාගය පටන් ගෙන පැය භාගයක් ගතවන තුරු ප්‍රශ්න පත්‍රයට පෙනී සිටින අපේක්ෂකයෙකුට විභාග ශාලාවෙන් පිටවී යාම තහනම්ය. ප්‍රායෝගික පරීක්ෂණවලට හෝ වාචික පරීක්ෂණවලට පමා වී පැමිණෙන අපේක්ෂකයන් විභාග ශාලාවට ඇතුළු නොකිරීමට ඉඩ තිබේ.

4. සෑම විභාගාපේක්ෂකයෙකුම තමාගේ විභාග අංකය දරන ආසනයේ හැර වෙන කිසිම තැනක වාඩි නොවිය යුතුය. විභාග ශාලාධිපතිගේ විශේෂ අවසරය නොමැතිව තමන්ගේ ස්ථානය වෙනස් නොකළ යුතුයි. තමන්ට නියම නොකරන ලද අසුනක් ගැනීම වංචනික අදහසින් කරන ලද ක්‍රියාවක් වශයෙන් සලකනු ලැබීමට සිදුවේ.

5. විභාග ශාලාව තුළ සම්පූර්ණයෙන් ම නිශ්ශබ්ද ව සිටිය යුතු ය. මොන ම කාරණයක් නිසාවත් විභාග ශාලාව ඇතුළත දී විභාග ශාලාවේ කාර්ය මණ්ඩලයේ කෙනෙකු සමග හැර, විභාග ශාලාව ඇතුළත හෝ පිටත හෝ සිටින කිසිවකු සමග මොනයම් කරුණක් නිසාවත් කතාබස් කිරීම හෝ පණිවුඩ හුවමාරු කර ගැනීම හෝ වෙනත් අන්දමේ ගනුදෙනු කිරීම හෝ සම්පූර්ණයෙන්ම තහනම්ය. යම් කිසි හදිසි වුවමනාවක් සඳහා කිසිවෙකු සමග කතාබස් කිරීමක් අවශ්‍ය වුවහොත් ප්‍රථමයෙන් ඒ සඳහා විභාග ශාලාධිපතින්ගේ අවසරය ලබා ගත යුතු යි.

6. විභාගාපේක්ෂකයෙකුගේ උත්තර පත්‍රය හඳුනාගනු ලබන්නේ ඔහුගේ විභාග අංකයෙන් පමණක් හෙයින් උත්තර පත්‍රවල තමන්ගේ නම නොලිවිය යුතුයි. තමාගේ උත්තර පත්‍රයෙහි අන්‍ය විභාගාපේක්ෂකයෙකුගේ විභාග අංකය ලිවීම වංචනික ක්‍රියාවක් කිරීමට ප්‍රයත්න දැරීමක් ලෙස සලකනු ලැබේ. හඳුනාගත නොහැකි පරිදි විභාග අංකය ලියා ඇති උත්තර පත්‍ර ප්‍රතික්ෂේප කිරීමට ද සිදුවෙනවා ඇත.

7. තමන් වෙත සපයන ලද කඩදාසි හැර තීන්ත පොවන කඩදාසියෙහි හෝ ප්‍රශ්න පත්‍රයෙහි හෝ මේසය මත හෝ වෙන කිසි තැනක හෝ කිසිවක් නොලිවිය යුතුය. මේ නීතිය නොසැලකීම වංචනික චේතනාවකින් යුක්තව ක්‍රියා කිරීමක් ලෙස සැලකිය හැකි වේ.

8. තමන් වෙත සපයන ලද කඩදාසියක් හෝ උත්තර ලියන පොතක් හෝ ඉරාදැමීම හෝ පොඩි කිරීම හෝ නමා දැමීම හෝ අකාමකා දැමීම හෝ නොකළ යුතුය. කටුවැඩ ආදිය සඳහා පාවිච්චි කරන ලද සෑම කඩදාසියක්ම උත්තර පත්‍රයට ඇමිණිය යුතු ය. ඒවා උත්තර පත්‍රයෙහිම කොටසක් විය යුතු ය. එබඳු කටුවැඩ පැහැදිලි ලෙස කපා හැරිය යුතුයි. විභාග ශාලාවේ දී ලියන ලද කිසිම දෙයක් ඉන් පිටත ගෙනයෑම තහනම් ය. එකම ප්‍රශ්නයකට පිළිතුරු දෙතැනක ලියැවී තිබේ නම් අනවශ්‍ය පිළිතුරු පැහැදිලි ලෙස කපා හැරිය යුතුයි. මේ කරුණු පැහැර හැරීම වංචාවක් කිරීමට ප්‍රයත්න දැරීමක් සේ සැළකීමට ඉඩ තිබේ.

9. ගණිත ප්‍රශ්නවල දී ගණන් වරදවා සාදා හෝ ගණනක් කොහෙත්ම නොසාදා හෝ නිවැරදි පිළිතුරු දැක්වීමත් චිත්‍ර කර්මයේ දී තමන්ගේ චිත්‍රය තවත් අපේක්ෂකයෙකුගේ චිත්‍රයට ආකල්ප මාත්‍රයෙන් හෝ ස්වරූපයෙන් හෝ ක්‍රියාකාරිත්වයෙන් හෝ යනාදියකින් සමානව, එසේ නැතිනම් බොහෝ සෙයින්ම කිට්ටුවම තිබීමත්, වංචා සහගත ක්‍රියාවක් සේ සලකනු ලැබීමට හේතු විය හැකිය.

10. විභාගයේ දී උත්තර ලිවීම සඳහා තමන්ට සපයනු ලබන කඩදාසි හෝ වෙනත් ද්‍රව්‍ය විභාග ශාලාවෙන් පිටතට ගෙනයාම තහනම්ය. මේ සියලුම දෑ විභාග කොමසාරිස් සතුය. මේ නීතිය කඩකිරීම වංචනික චේතනාවකින් යුත් ක්‍රියාවක් ලෙස සැලකීමට හේතු විය හැකිය.

11. තමන් වෙත සපයන ලද ලිපිද්‍රව්‍ය හැර වෙනත් පොත්පත්, සටහන් පොත්, සාක්කුවේ පාවිච්චි කරන නෝට් පොත්, ඇක්සයිස් පොත් හා කඩදාසි කොළ හෝ කැබලි ද, තමන්ගේ පාට පෙට්ටි හා පාර්සල් ආදිය ද, පයිල් කවර, කාඩ්බෝඩ් පෑඩ්, නැවූ ප්‍රවෘත්ති පත්‍ර, බ්‍රවුන් පේපර් යනාදිය ද, විභාග ශාලාව තුළ සිටින කිසි විටෙක තමා වෙත හෝ සමීපයෙහි හෝ තබා නොගත යුතුය. මේ නීතිය කඩ කිරීම දඬුවම් ලැබිය හැකි ක්‍රියාවකි.

12. විභාග ශාලාව තුළ කිසිම අපේක්ෂකයෙකු අත කිසිම පොතපතක් හෝ සටහන් පොතක් හෝ සටහන් ලියන කඩදාසියක් හෝ තබා ගැනීම සම්පූර්ණයෙන්ම තහනම් ය. විභාගශාලාධිපතීන් නියම කළහොත් සෑම අපේක්ෂකයෙක්ම තමන් සන්තකව තිබෙන දෑ මේ මේ යයි සහතික කිරීමට බැඳී සිටී. මේ අවශ්‍යතා කඩකිරීම වංචා සහගත ක්‍රියාවක් කිරීමට යත්න දැරීමක් ලෙස සලකනු ලැබේ.

13. වෙනත් අපේක්ෂකයෙකුගේ උත්තර පත්‍රයකින් හෝ පොතපතකින් හෝ පත්‍රයකින් හෝ සටහන් සහිත කොළයකින් හෝ වෙන කිසිවකින් හෝ ගෙන, හොර උත්තර ලිවීම හෙවත් කොපි කිරීම, හොර උත්තර ලිවීමට යත්න දැරීමද තහනම් ය. තවත් අපේක්ෂකයෙකුගේ උත්තර පත්‍රයක් දෙස බැලීම ද නොකළ යුතුය. වෙන අයදුම්කරුවෙකුට උදව් දීමෙන් ද, වෙන අයදුම්කරුවෙකුගෙන් හෝ පුද්ගලයෙකුගෙන් හෝ උදව් ලබා ගැනීමෙන් ද සම්පූර්ණයෙන්ම වැළකිය යුතුය. උත්තර ලියා සම්පූර්ණ වූ සෑම කඩදාසියක්ම ලියමින් සිටින කඩදාසිය යට තබා ගත යුතුය. ලියන කඩදාසි මේසය මත විසුරුවා නොදැමිය යුතුය.

14. ප්‍රශ්න පත්‍රයකට උත්තර ලියන අතරතුර මොනම කරුණක් නිසාවත් ස්වල්ප වේලාවකටවත් විභාග ශාලාවෙන් පිටවී යාමට කිසිම අපේක්ෂකයෙකු ඉඩදෙනු නොලැබේ. එහෙත් යම්කිසි හදිසි කරුණක් නිසා විභාගාපේක්ෂකයෙකුට ඉන් පිටත යන්නට උවමනා වුවහොත් විභාග ශාලාධිපතිගේ සහකාර නිලධාරියෙකුගේ සුපරීක්ෂාකාරීත්වය යටතේ විභාග ශාලාවෙන් ඔහුට ස්වල්ප වේලාවකට පිටතට යාමට අවසර දෙනු ලැබේ. එසේ පිටතට යාමට පෙරත් නැවත විභාග ශාලාවට ඇතුළු වන විටත් ඔහු සෝදිසියකට භාජනය විය යුතුය.

15. විභාග ශාලාවේ දී පිළිතුරු ලියන විට විභාගය පටන් ගැනීමට පෙර හෝ නියම විභාග අපේක්ෂකයෙකු වෙනුවට ව්‍යාජ අපේක්ෂකයෙකු පෙනී සිටීම දඬුවම් ලැබිය යුතු ක්‍රියාවකි. අනන්‍යතා පත්‍ර වෙනස් කිරීම හෝ බොරු අනන්‍යතා පත්‍ර ඉදිරිපත් කිරීමත්, කෙනෙකුගේ අනන්‍යතා සහතිකය වෙනස් කිරීමත් එබඳු වරදවල් ය. විභාගාපේක්ෂකයන් එවැනි වරදට අසු නොවිය යුතුය.

16. විභාග අපේක්ෂකයෙකු නොවන අයෙක් කිසිම අපේක්ෂකයෙකුට අයථා අන්දමින් වංචා සහගත ලෙස උදව් දීම බරපතල වරදක් ලෙස සලකනු ලැබේ.

විභාග අපේක්ෂකයන් විසින් තමන්ගේ පරෙස්සම සඳහා පහත සඳහන් උපදෙස් අනුව ක්‍රියා කළ යුතු ය. :—

(i) විභාගය පටන් ගන්නා නියමිත වේලාවට සෑහෙන පමණ කලින් විභාග ශාලාවට පැමිණෙන්න. එක් එක් ප්‍රශ්න පත්‍රය පටන් ගැනීමට නියමිත වේලාවට යටත් පිරිසෙයින් විනාඩි 10කට හෝ 15කට කලින් විභාග ශාලාවට පැමිණ සිටීම සෑහේ. විභාග ශාලාව පිහිටා ඇති ස්ථානය හරිහැටි නොදත් විට විභාගය පටන් ගන්නා දිනයට කලින් ඒ ගැන සොයා බලා නියම ස්ථානය හරි හැටි දැන සිටිය යුතුය.

(ii) යම්කිසි විෂයයකට ඇතුළත්වීම ගැන හෝ යම් විෂයයකට පෙනී සිටීමට ඇති සුදුසුකම් ගැන හෝ සැකයක් ඇති වූ විට එම ප්‍රශ්න පත්‍රයට පිළිතුරු සැපයීමට පටන් ගැනීමට පෙර විභාග ශාලාධිපතීන්ට ඒ බැව් සැළකර එම සැකය දුරුකර ගත යුතුයි. එලෙස ක්‍රියා නොකිරීම එම විෂයය හෝ විෂයයන් සම්බන්ධයෙන් තමන්ගේ විභාගාපේක්ෂකත්වය අවලංගු වී යාමට හේතු විය හැකිය.

(iii) විභාගයට පෙනී සිටීමේ දී අපේක්ෂකයන් සෑම විෂයයකටම පෙනී සිටින විට අනන්‍යතා පත්‍ර ඉදිරිපත් කළ යුතුය. අනන්‍යතාවය ඔප්පු කිරීම සඳහා අවශ්‍ය ලියවිලි විභාග ශාලාවේ දී ඉදිරිපත් නොකළහොත් ඔහුගේ විභාගාපේක්ෂකත්වය අවලංගු කිරීමට ඉඩ තිබේ. යම් හෙයකින් ඒ සඳහා අවශ්‍ය ලියවිලි විභාගශාලාවට ගෙන ඒමට අමතක වුවහොත් ඒ බැව් විභාගශාලාධිපතීන්හට දන්වා විභාගය අවසන් වීමට පෙර එය ඉදිරිපත් කිරීමට මං සළසා ගත යුතුය.

(iv) විභාගය සඳහා සාමාන්‍යයෙන් සම්මත වර්ගයකට අයත් ලිපිද්‍රව්‍ය (එනම් ලියන කඩදාසි, තීන්ත පොවන කඩදාසි, ලැජර් කඩදාසි, සාරාංශ ලියන කඩදාසි) ආදිය සපයනු ලැබේ. සාමාන්‍යයෙන් කාටත් බෙදා දෙන වර්ගයකට වෙනස් වූ හෝ අමුතු මෝස්තරයක ලිපි ද්‍රව්‍ය ඔබට ලැබුණහොත් ඒ බව නොපමාව විභාගශාලාධිපතිට දැන්විය යුතුයි. විභාග ශාලාවේ දී ඔබට දෙනු ලබන කඩදාසි හැර වෙන මොනම කඩදාසියක්වත් ප්‍රශ්නවලට උත්තර ලිවීම සඳහා පාවිච්චි නොකළ යුතුයි. ඉතිරි වන කඩදාසි සහ වෙනත් ද්‍රව්‍ය අපිරිසිදු නොකර නැවත ප්‍රයෝජනයට ගත හැකි වන සේ ඔබගේ ලියන මේසය මත තබන්න. ඔබට ලඝුගණක චක්‍ර සපයන ලද්දේ නම් ඒවා පරිස්සමින් පාවිච්චි කොට ඔබේ ලියන මේසය මත තිබෙන්නට හැරිය යුතුය.

(v) විභාගාපේක්ෂකයන් තම තමන්ගේ පෑන්, පැන්සල්, තීන්ත කූඩු, මකන, රෙදි කෑලි, අඩිකෝදු, ජ්‍යාමිතික උපකරණ, පාට පැන්සල් පෙට්ටි, පාට හුණු පෙට්ටි යනාදිය රැගෙන ආ යුතුයි.

(vi) තමන් පාවිච්චි කරන සෑම කඩදාසියකම පිළිතුරු ලිවීමට පටන් ගැනීමේ දී නොපමාව තමන්ගේ විභාග අංකය හා විභාගයේ නමත් පැහැදිලි ලෙස ලියන්න. කඩදාසියේ දෙපැත්තේම පැහැදිලිව ද පිරිසිදුව ද උත්තර ලියන්න. ප්‍රශ්නයක කොටසකට උත්තර ලිවීමෙන් පසු අනික් කොටස පටන් ගැනීමට පෙර එක රූලක්වත් හිස්ව තිබිය යුතුයි. සම්පූර්ණ ප්‍රශ්නයකට උත්තර ලිවීමෙන් පසු රූලක් හෝ රූල් කීපයක් හෝ හිස්ව තබන්න. ලියන සෑම දෙයක්ම එක ගොඩේ තෝරා බේරා ගන්නට නොහැකි ලෙස නොලිවිය යුතුයි.

(vii) උත්තර ලියන කඩදාසියෙහි වම් පැත්තේ තීරය වෙන්කර ඇත්තේ ප්‍රශ්නවල අංක ලිවීම සඳහා ය. දකුණු පැත්තේ තීරය වෙන්කර ඇත්තේ පරීක්ෂකවරයාගේ ප්‍රයෝජනය සඳහා බැවින් එහි කිසිවක් නොලිවිය යුතුයි. තමන් විසින් උත්තර ලියන ලද ප්‍රශ්නවල අංක වරදවා යෙදීම ව්‍යාකූලත්වයට හේතුවන බැවින් ප්‍රශ්න අංක ඉතා පරෙස්සමින් නිවැරදි ලෙස යෙදිය යුතුය.

(viii) අනිවාර්ය ප්‍රශ්න ද, තෝරා ගත යුතු අන් ප්‍රශ්න ද සම්බන්ධව ප්‍රශ්න පත්‍රයේ මුලින්ම සඳහන් කොට ඇති උපදෙස් ඉතා පරෙස්සමින් කියවා බැලිය යුතුයි. මෙය නොසලකා හැරීමෙන් බොහෝ විට පාඩු සිදුවිය හැකිය.

(ix) ගණිත ප්‍රශ්නවලට උත්තර සපයන විට ගැන බැලීම සහ කටුවැඩ ඒ ඒ ගණන් සෑදීමේ කොටසක් වශයෙන් අනුක්‍රමයෙන් විස්තර ලෙස දැක්විය යුතුය. අවශ්‍ය තැන්වල අඳිනු ලබන රූප සටහන් හා චිත්‍ර ආදිය නිවැරදිව ද සෑහෙන පමණ විශාලව ද තිබිය යුතුයි. පිටු කීපයකට යන දිග පිළිතුරුවල දී එක පිටුවක අඳින ලද රූප සටහන් සම්බන්ධයෙන් ඊළඟ පිටුවලදීත් සිත් යොමුකර විය යුතු අවස්ථාවල දී ඒ රූප සටහන් නැවතත් ඇඳ පෙන්වීම යෝග්‍ය වේ.

(x) එක් එක් ප්‍රශ්න පත්‍රයට පිළිතුරු සපයා අවසන් වූ විට උත්තර ලියන ලද කඩදාසි සියල්ලම ප්‍රශ්නවලට උත්තර ලියූ පිළිවෙල අනුව එකතුකොට වම් පැත්තේ ඉහළ කෙළවරේ තමන්ට සපයන ලද නූල් කැබැල්ලෙන් නොගැලවී යන පරිදි එකට තබා අමුණා ගැටගසන්න. දකුණු පැත්තේ උඩ කෙළවරවල් එකට තබා ගැට නොගසන්න.

(xi) ඔබගේ උත්තර පත්‍රය විභාගශාලාධිපතීන්ට හෝ ඔවුන්ගේ සහකාර මහතකුට හෝ සියතින්ම භාරදිය යුතුය. නැතහොත් ඒවා එකතු කරන තුරු ඔබේ අසුනේම වාඩි වී සිටිය යුතුය. එසේ නොකිරීම ඇතැම් විට ඔබගේ උත්තර පත්‍රය නැති වී යාමට ද ඔබ යම් විෂයයකට ඉදිරිපත් නොවූවකු සේ සලකනු ලැබීමට ද හේතු විය හැකිය. මොනම කරුණක් නිසාවත් ඔබගේ උත්තර පත්‍රය විභාග ශාලාවේ සේවය කරන පියුන් කෙනෙකුට හෝ වෙනයම් සේවකයෙකුට හෝ බාර නොදිය යුතුය.

(xii) යම්කිසි කරුණක් නිසා විභාග ශාලාධිපතීන්ට හෝ ඔහුගේ සහකාර මහතෙකුට හෝ කථා කිරීමට අවශ්‍ය වූ විට ද, කඩදාසි ආදිය අවශ්‍ය වූ විට ද තම ආසනයෙන් නොනැගිට අත පමණක් එසවිය යුතුය.

**විභාග කොමසාරිස් ජනරාල්.**

පැලවත්ත,
බත්තරමුල්ල,
ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවේ දී ය.

# තනතුරු - ඇබෑර්තු

## ජාතික පොලිස් කොමිෂන් සභාව

ජාතික පොලිස් කොමිෂන් සභාව විසින් පහත සඳහන් තනතුරු සඳහා අදාල සුදුසුකම් සපුරා ඇති නිලධාරීන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

01. පළාත් අධ්‍යක්ෂ තනතුර ඌව පළාත - තනතුරු 01 යි
02. පළාත් අධ්‍යක්ෂ තනතුර නැගෙනහිර පළාත - තනතුරු 01 යි
03. පළාත් අධ්‍යක්ෂ තනතුර උතුරු පළාත - තනතුරු 01 යි
04. දිස්ත්‍රික් අධ්‍යක්ෂ තනතුර කළුතර දිස්ත්‍රික්කය - තනතුරු 01 යි.

I දිප ව්‍යාප්ත සේවාවක I පංතියේ හෝ විශේෂ ශ්‍රේණියේ තනතුරක සේවය කර විශ්‍රාම ගිය වයස අවුරුදු 67 නොඉක්ම වූ නිලධාරියෙකු විය යුතු අතර වසරක කාලයක් සඳහා කොන්ත්‍රාත් පදනම මත බඳවා ගනු ලැබේ.

II සම්බන්ධීකරණ හා විමර්ශන කටයුතු පිළිබඳ පළපුරුද්දක් තිබිය යුතුය.

III තෝරාගනු ලබන නිලධාරීන් සඳහා සියළු දීමනා ඇතුලත්ව රු. 25,000 ක මාසික දීමනාවක් ගෙවනු ලැබේ.

තම ජීවදත්ත තොරතුරු ඇතුලත් අයදුම්පතක් 2014.04.28 දින හෝ ඊට පෙර ලේකම් ජාතික පොලිස් කොමිෂන් සභාව, අංක 09 ගොඩනැගිල්ල, බණ්ඩාරනායක සම්මන්ත්‍රණ ශාලා පරිශ්‍රය, බෞද්ධාලෝක මාවත, කොළඹ 07 යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතු අතර අයදුම්පත් එවනු ලබන ලියුම් කවරයේ වම්පස ඉහළ කෙළවරේ තමන් ඉල්ලුම් කරන තනතුර සඳහන් කර එවිය යුතුය.

ටී. එම්. කේ. බී. තෙන්නකෝන්,
ලේකම්,
ජාතික පොලිස් කොමිෂන් සභාව.

03-874

---

## රාජ්‍ය සේවා කොමිෂන් සභාව

### අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාව සහකාර අධ්‍යක්ෂ (නීති) තනතුරු පුරප්පාඩුවලට නිලධාරීන් බඳවා ගැනීම සඳහා අයදුම්පත් කැඳවීම - 2014

අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාවේ සහකාර අධ්‍යක්ෂ (නීති) තනතුරුවල පවතින පුරප්පාඩු 10 සඳහා සුදුස්සන් තෝරා ගැනීම පිණිස රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ නියමය පරිදි අයදුම්පත් කැඳවනු ලැබේ. මෙම නිවේදනය අවසානයේ ඇති ආදර්ශ ආකෘතිය අනුව පිළියෙල කරන ලද අයදුම්පත් පහත සඳහන් දිනට හෝ ඊට පෙර අධ්‍යක්ෂ ජනරාල්, අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාව, අංක 36, මලලසේකර මාවත, කොළඹ 07 වෙත ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය. අයදුම්පත අඩංගු කවරයේ වම් පස උඩ කෙළවරේ "සහකාර අධ්‍යක්ෂ (නීති) තනතුර" යනුවෙන් පැහැදිලිව සටහන් කළ යුතුය.

(අ) අයදුම්පත් කැඳවන අවසාන දිනය 2014.05.01 දින වේ.

සටහන.- ඉල්ලුම්පත්‍රයක් හෝ ඒ සම්බන්ධිත ලිපියක් තැපෑලේදී නැති වූ බවට හෝ ප්‍රමාද වූ බවට කෙරෙන පැමිණිලි ගැන සලකා බැලිය හැකි නොවේ. අවසාන දිනය දක්වා ඉල්ලුම්පත්‍ර ප්‍රමාද කිරීමෙන් සිදුවිය හැකි අලාභහානි අයදුම්කරුවන් විසින්ම විඳදරා ගත යුතුය.

1. *සේවයට බඳවා ගැනීමේ ක්‍රමය :*

ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයකින් අනතුරුව පවත්නා පුරප්පාඩු සංඛ්‍යාව මත කුසලතා අනුපිළිවෙල අනුව බඳවා ගනු ලැබේ.

පත් කරනු ලබන සංඛ්‍යාව හා පත්වීම ක්‍රියාත්මක වන දිනය රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ නියෝගය අනුව තීරණය කරනු ලැබේ.

2. *සේවයේ නියුක්ත කරවීමේ කොන්දේසි :*

(i) මෙම තනතුර ස්ථිර හා විශ්‍රාම වැටුප් සහිතය. වැන්දඹු හා අනත්දරු/වැන්දඹු පුරුෂ හා අනත්දරු විශ්‍රාම වැටුපට දායක මුදල් ගෙවිය යුතුය.

(ii) මෙම තනතුරට පත්වීම් ලබන නිලධාරීන් වසර තුනක (03) පරිවාස කාලයකට යටත් වන අතර එම වසර තුන (03) ඇතුලත පළමු වැනි කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය සමත්විය යුතුය. දැනට රජයේ ස්ථිර තනතුරක් දරන්නෙකු තෝරා පත් කර ගනු ලැබුවහොත් ඔහු හෝ ඇය එක් අවුරුද්දක පරීක්ෂණ කාලයකට යටත්ව පත් කරනු ලැබේ.

(iii) රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 7/2007 හා ඊට අනුශාංගික චක්‍රලේඛ අනුව අනෙක් භාෂාව පිළිබඳ ප්‍රවීනතා මට්ටම වසර 05ක් තුළදී ලබාගත යුතුය. රාජ්‍ය භාෂාවකින් නොවන භාෂා මාධ්‍යයකින් සේවයට බැදුනු නිලධාරීන් විසින් වසර 03ක් තුළදී එක් රාජ්‍ය භාෂාවක් පිළිබඳව ප්‍රවීනතාවය ලබාගත යුතු අතර අනෙක් රාජ්‍ය භාෂාව පිළිබඳ ප්‍රවීනතාවය වසර හයක් (06) ඇතුලත ලබාගත යුතුය.

(iv) රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්ය පරිපාටික රීතිවලට ද, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහයට ද, රජයේ මුදල් රෙගුලාසිවලට ද, දෙපාර්තමේන්තුගත අනෙකුත් නියෝගවලට ද මෙම පත්වීම යටත් වේ.

3. *වැටුප් පරිමාණය :*

මෙම තනතුරට අදාළ මාසික වැටුප් පරිමාණය රු. 28,095- 5 x 645 - 5 x 750 - රු. 35,270 (වැටුප් කේතය - SL 5-2006)

4. *අවශ්‍ය සුදුසුකම් :*

(i) අධ්‍යාපන/වෘත්තීය සුදුසුකම් :

ශ්‍රේෂ්ඨාධිකරණයේ නීතිඥයෙකු වීම/විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්ව විද්‍යාලයක නීතිය පිළිබඳ උපාධියක් ලබා තිබීම.

(ii) පළපුරුද්ද :

ශ්‍රේෂ්ඨාධිකරණයේ නීතිඥයෙකු වශයෙන් දිවුරුම් දීමෙන් පසු වසර තුනකට (03) නොඅඩු සක්‍රිය වෘත්තිය පළපුරුද්දක් තිබීම.

5. *වයස් සීමාව* .- 2014.05.01 දිනට වයස අවුරුදු 22ට නොඅඩු සහ අවුරුදු 45ට නොවැඩි විය යුතුය. (දැනටමත් රාජ්‍ය සේවයේ /පළාත් රාජ්‍ය සේවයේ නියුක්ත නිලධාරීන්ට උපරිම වයස් සීමාව බල නොපානු ඇත.)

6. *කායික සුදුසුකම්* :

(i) සෑම අපේක්ෂකයෙකුම ශ්‍රී ලංකාවේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමටත් ;

(ii) තනතුරෙහි රාජකාරි ඉටු කිරීමටත් ප්‍රමාණවත් ශාරීරික හා මානසික යෝග්‍යතාවයෙන් යුක්ත විය යුතුය.

7. *වෙනත් සුදුසුකම්* :

(i) අයදුම්කරුවන් ශ්‍රී ලංකාවේ පුරවැසියන් විය යුතුය ;
(ii) අයදුම්කරුවන් විශිෂ්ඨ චරිතයකින් යුක්ත විය යුතුය ;
(iii) මෙම තනතුරට බඳවා ගැනීම සඳහා අවශ්‍ය සියලුම සුදුසුකම් සම්පූර්ණ කල යුතු බවට අයදුම්පත් කැඳවීමේ නිවේදනයේ/*ගැසට් පත්‍රයේ* සඳහන් කරනු ලබන අවසන් දිනට අයදුම්කරුවන් විසින් එම සුදුසුකම් සෑම අකාරයකින්ම සම්පූර්ණ කර තිබිය යුතුය.

8. *සම්මුඛ පරීක්ෂණය* :

8.1 **ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණය**
රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් පත් කරනු ලබන සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයක් මගින් ලකුණු ලබාදීම සිදු කරනු ලැබේ.
8.2 සම්මුඛ පරීක්ෂණය සඳහා වන සවිස්තරාත්මක ලකුණු ලබාදීමේ ක්‍රමය පහත දක්වා ඇත.

| | *විෂයය* | | *උපරිම ලකුණු* |
|---|---|---|---|
| 01 | **අතිරේක අධ්‍යාපන සුදුසුකම්** | | 10 |
| | පිළිගත් විශ්ව විද්‍යාලයකින් ලද නීතිය පිළිබඳ උපාධිය | | |
| | - පළමු පන්තියේ සාමාර්ථයක් සඳහා | 10 | |
| | - දෙවන පන්තියේ ඉහළ සාමාර්ථයක් සඳහා | 08 | |
| | - දෙවන පන්තියේ පහළ සාමාර්ථයක් සඳහා | 06 | |
| | නීති විද්‍යාලයේ අවසාන වසරේ පළමු පන්තියේ සාමාර්ථයක් සඳහා | 08 | |
| | නීති විද්‍යාලයේ අවසාන වසරේ දෙවන පන්තියේ සාමාර්ථයක් සඳහා (උපරිම සුදුසුකම් සඳහා පමණක් ලකුණු ලබාදේ, උපාධිය හෝ නීති විද්‍යාල සුදුසුකම්වලින් එකක් සඳහා පමණක්) | 06 | |
| 02. | අතිරේක වෘත්තීය සුදුසුකම් | | 10 |
| | පිළිගත් ආයතනයක් විසින් ලබාදෙන අදාළ ක්ෂේත්‍රය පිළිබඳ අවුරුද්දකට නොඅඩු පශ්චාත් උපාධි ඩිප්ලෝමාවක් හෝ පශ්චාත් නීති ඩිප්ලෝමා පාඨමාලාවක් සඳහා (එක් ඩිප්ලෝමාවකට ලකුණු 05 බැගින්) | | |
| | පිළිගත් ආයතනයක් විසින් ලබාදෙන අදාළ ක්ෂේත්‍රය පිළිබඳ මාස 06කට නොඅඩු ඩිප්ලෝමා පාඨමාලාවක් සඳහා (එක් ඩිප්ලෝමාවකට ලකුණු 03 බැගින්) | | |
| | පිළිගත් ආයතනයක් විසින් ලබාදෙන අදාළ ක්ෂේත්‍රය පිළිබඳ මාස 03කට නොඅඩු සහතිකපත්‍ර පාඨමාලාවක් සඳහා (එක් පාඨමාලාවකට ලකුණු 02 බැගින්) | | |
| 03. | **නීති ක්ෂේත්‍රය පිළිබඳ පළපුරුද්ද** | | 40 |
| | මූලික සුදුසුකම ලබා ගැනීම සඳහා අවශ්‍ය වන නීතිඥයකු ලෙස කටයුතු කළ වසර 03ක සේවා කාලය හැර නීතිඥවරයෙකු ලෙස පළපුරුද්ද - එක් වසරකට ලකුණු 05 බැගින් උපරිමය ලකුණු 10 | 10 | |
| | (අවුරුදු 20කට නොඅඩු සේවා කාලයක් සම්පූර්ණ කරන ලද නීතිඥවරයෙකුගේ හෝ ජනාධිපති නීතිඥවරයෙකුගේ හෝ අධිකරණ නිලධාරිවරයෙකුගෙන් ලබාගත් සහතිකයක් මගින් අතිරේක පළපුරද්ද සනාථ කළ යුතුය. | | |
| | **අධිකරණයේ නඩු මෙහෙයවීම පිළිබඳ පළපුරුද්ද** එක් වසරකට ලකුණු 05 බැගින් උපරිමය ලකුණු 10 (අවුරුදු 20කට නොඅඩු සේවා කාලයක් සම්පූර්ණ කරන ලද නීතිඥවරයෙකුගේ හෝ ජනාධිපති නීතිඥවරයෙකුගේ හෝ අධිකරණ නිලධාරිවරයෙකුගෙන් ලබාගත් සහතිකයක් මගින් අතිරේක පළපුරුද්ද සනාථ කළ යුතුය.) | 10 | |
| | **නීති නිලධාරියෙකු ලෙස නීතිපති දෙපාර්තමේන්තුවේ නොවන රාජ්‍ය ආයතනයක පළපුරුද්ද** | 10 | |
| | එක් වසරකට ලකුණු 05 බැගින් උපරිමය ලකුණු 10 (දෙපාර්තමේන්තු ප්‍රධානියා හෝ ප්‍රධාන නීති නිලධාරිවරයා විසින් පළපුරුද්ද සනාථ කළ යුතුය. | | |
| | **නීතිපති වෙනුවෙන් නඩු පැවරීම හා පෙනී සිටීම වෙනුවෙන් ලබා ඇති පළපුරුද්ද** | 10 | |
| | එක් වසරකට ලකුණු 05 බැගින් උපරිමය ලකුණු 10 (නීතිපති හෝ නීතිපති දෙපාර්තමේන්තුවේ අධීක්ෂණ නිලධාරිවරයෙකු විසින් පළපුරුද්ද සනාථ කළ යුතුය) | | |
| 04 | **පරිගණක සාක්ෂරතාව** | | 10 |
| | විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් | 10 | |
| | පිළිගන්නා විශ්ව විද්‍යාලයක උපාධියක් සඳහා තොරතුරු තාක්ෂණය ප්‍රධාන විෂයක් ලෙස හදාරා තිබීම සඳහා | | |
| | රජයේ පිළිගත් ආයතනයක මාස 06කට නොඅඩු තොරතුරු තාක්ෂණය පිළිබඳ ඩිප්ලෝමා පාඨමාලාවක් සඳහා | 07 | |
| | රජයේ පිළිගත් ආයතනයක මාස 03කට නොඅඩු තොරතුරු තාක්ෂණය පිළිබඳ සහතික පත්‍ර පාඨමාලාවක් සඳහා | 05 | |

| | | |
|---|---|---|
| 05. | **ඉංග්‍රීසි භාෂා ප්‍රවීණතාව** | 10 |
| | ඉංග්‍රීසි මාධ්‍යයෙන් හදාරන ලද උපාධිය/පශ්චාත් උපාධිය/නීතිවේදී උපාධිය/පශ්චාත් නීතිවේදී උපාධිය (අදාල විභාග ප්‍රශ්න පත්‍ර සියල්ල සඳහා ඉංග්‍රීසි මාධ්‍යයෙන් පිළිතුරු සපයා තිබිය යුතුය) | 10 |
| | විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්ව විද්‍යාලයක හෝ රජයේ පිළිගත් ආයතනයක ඉංග්‍රීසි භාෂාව පිළිබඳ ඩිප්ලෝමා පාඨමාලාවක් සඳහා | 07 |
| | විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්ව විද්‍යාලයක හෝ රජයේ පිළිගත් ආයතනයක ඉංග්‍රීසි භාෂාව පිළිබඳ සහතික පත්‍ර පාඨමාලාවක් සඳහා | 05 |
| 06 | අදාළ අණපනත් සහ තීරණය කරන ලද නඩු පිළිබඳ දැනුම මැනීම සඳහා සිද්ධි අධ්‍යයනය පිළිබඳ ව්‍යුහගත ප්‍රශ්න සම්මුඛ පරීක්‍ෂණයේදී ලබාදීම | 15 |
| | (සම්මුඛ පරීක්‍ෂණ මණ්ඩලය විසින් අදාළ ප්‍රශ්න සැකසිය යුතුය) | |
| 07 | සම්මුඛ පරීක්‍ෂණයේදී දක්වන කුසලතාව | 05 |
| | මුළු එකතුව | 100 |

9.

I. ඉල්ලුම්පත්‍රය සෙ. මී. 22-29 ප්‍රමාණයේ A4 කඩදාසි භාවිතා කරමින් 1 සිට 9 තෙක් ශීර්ෂ පළමු වන පිටුවෙහි අඩංගු වන ලෙස ගෙන සකස් කළ යුතු අතර, අදාළ තොරතුරු තම අත් අකුරෙන්ම පැහැදිලිව ඇතුලත් කළ යුතුය. ආදර්ශ ඉල්ලුම්පත්‍රයට අනුකූල නොවන ඉල්ලුම්පත්‍රත්, අසම්පූර්ණ ඉල්ලුම්පත්‍රත් දැනුම් දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ. අදාළ ඉල්ලුම්පත්‍රයේ පිටපතක් ළඟ තබා ගැනීම ප්‍රයෝජනවත් වනු ඇත. තව ද සම්පූර්ණ කරනු ලබන ඉල්ලුම්පත්‍රය ගැසට් නිවේදනයට යා කර ඇති ආදර්ශ ඉල්ලුම්පත්‍රයට අනුකූලද යන්න පිළිබඳව අයදුම්කරු විසින් විමසා බැලිය යුතු බවත්, එසේ නොවුනහොත් අයදුම්පත ප්‍රතික්ෂේප වන බවත් වැඩි දුරටත් දන්වමි.

II. *අපේක්‍ෂකයාගේ අනන්‍යතාවය* .- දැනුම් දීමක් කළ විට අයදුම්කරුවන් පහත සඳහන් සහතිකවල මුල් පිටපත් ඉදිරිපත් කළ යුතුය.

(i) අධ්‍යාපන සහතික ;
(ii) උප්පැන්න සහතිකය ;
(iii) ජාතික හැඳුනුම්පත ;
(iv) පළපුරුද්ද පිළිබඳ සහතික (අධිකරණ නිලධාරියෙකු හෝ අවම වශයෙන් වසර 20කට නොඅඩු වෘත්තීය පළපුරුද්ද ඇති නීතිඥවරයෙකු විසින් නිකුත් කරන ලද සහතිකවලින් සනාථ විය යුතුය ;
(v) චරිත සහතික දෙකක් (මින් එකක් ප්‍රාදේශීය ලේකම් අනු අත්සන් කරන ලද ග්‍රාම නිලධාරි සහතිකයක් විය යුතුය.

*සැළකිය යුතුය* .- (අ) අයදුම්පතට කිසිම ලියවිල්ලක් හෝ එහි පිටපතක් නොඇමිණිය යුතුය.

(ආ) ඉල්ලූ අවස්ථාවක දී ලියවිලි ඉදිරිපත් කිරීමට අපොහොසත් වන අපේක්‍ෂකයන්ගේ අයදුම්පත්‍ර ගැන සලකා බලනු නොලැබේ.

රාජ්‍ය සේවයේ නියුක්ත නිලධාරීන් විසින් තම අයදුම්පත් දෙපාර්තමේන්තු/ආයතන ප්‍රධානීන් මාර්ගයෙන් එවිය යුතුය. අයදුම්පත්‍රයේ අපේක්‍ෂකයාගේ අත්සන රජයේ විදුහලක විදුහල්පතිවරයෙකු/සාමදාන විනශ්චයකාරවරයෙකු/දිවුරුම් කොමසාරිස්වරයෙකු/ නීතිඥවරයෙකු/ ප්‍රසිද්ධ නොතාරිස්වරයෙකු/ත්‍රිවිධ හමුදාවේ අධිකාරිලත් නිලධාරියකු හෝ රු. 22,935 ක මාසික ඒකාබද්ධ වැටුපක් ලබන රජයේ ස්ථිර තනතුරක් දරන නිලධාරියකු විසින් සහතික කළ යුතුය.

10. රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්ය පරිපාටික රීති, කලින් කලට රාජ්‍ය සේවය සම්බන්ධයෙන් නිකුත් කර ඇති චක්‍රලේඛ, සේවා ව්‍යවස්ථාව හා ඊට සිදු කර ඇති සංශෝධනයන්හි කොන්දේසි මෙම තනතුර සඳහා අදාළ වේ.

11. පුරප්පාඩු පිරවීම නොපිරවීම හෝ කොටසක් පමණක් පිරවීම පිළිබඳ අවසාන තීරණය රාජ්‍ය සේවා කොමිෂන් සභාව සතු වේ.

රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ නියමය පරිදි,

ලක්ෂ්මි ජයවික්‍රම,
අධ්‍යක්‍ෂ ජනරාල්
අල්ලස් හෝ දූෂණ චෝදනා
විමර්ශන කොමිෂන් සභාව.

2014 මාර්තු මස 05 වැනි දින,
අංක 36,
මලලසේකර මාවත,
කොළඹ 07.
අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභා කාර්යාලයේ දී ය.

**ආදර්ශ අයදුම් පත්‍රය**

**අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාව**

*සහකාර අධ්‍යක්‍ෂ (නීති) තනතුරු*

01 (i) මුලකුරු සමග නම :————. මහතා/මිය/මෙනවිය

(ii) සම්පූර්ණ නම :————. මහතා/මිය/මෙනවිය

02 ලිපිනය :-

(i) පුද්ගලික ලිපිනය :————.

(ii) රාජකාරි ලිපිනය :————.
(රාජ්‍ය සේවයේ නියුක්ත නම්)

03 (i) උපන් දිනය
අවුරුද්ද :————. මාසය :————. දිනය :————.

(ii) 2014.04.17 දිනට වයස

අවු. :————. මාස :————. දින :————.

04. ජාතික හැඳුනුම්පත් අංකය :————.

05. ජන වර්ගය :————.

06. ස්ත්‍රී/පුරුෂ භාවය :————.

07. (i) අධ්‍යාපන සුදුසුකම් :————.

(ii) වෘත්තීය සුදුසුකම් :————.

(iii) 2014.05.01 වැනි දිනට වෘත්තීය පළපුරුද්ද ඃ
අවු. :————. මාස :————. දින :——,

08. රාජ්‍ය සේවයෙන් පහ කරනු ලැබූ හෝ ධුරය හැරගිය අයෙකු ලෙස සළකනු ලැබූ කෙනෙක්ද යන වග :————.

09. (i) කිසියම් වරදකට උසාවියෙන් දඬුවම් ලබා තිබේද? :————.

(ii) පිළිතුර "ඔව්" නම් ඒ පිළිබඳ විස්තර :————.

මෙම අයදුම්පත්‍රයේ මා විසින් සඳහන් කරන ලද විස්තර සත්‍ය බවත්, නිවැරදි බවත් මෙයින් සහතික කරමි. මෙහි සඳහන් කිසියම් කරුණක් අසත්‍ය හෝ වැරදි බව මා තෝරා ගැනීමට පෙර දැනගතහොත් මා නුසුදුස්සෙකු වීමට හේතු වන බවත් පත් කිරීමෙන් පසු දැනගතහොත් කිසිදු වන්දියක් නොගෙවා සේවයෙන් පහ කිරීමට යටත් වන බවත් මම දනිමි.

————,
අයදුම්කරුගේ අත්සන.

දිනය :————.

අයදුම්කරු රාජ්‍ය සේවයේ නියුක්ත නම් ඃ

**දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ සහතිකය**

.......................මයා/ මිය/මෙනවිය මෙම දෙපාර්තමේන්තුවේ සේවය කරන බවත් ඔහු/ඇය මෙම තනතුර සඳහා තෝරා ගනු ලැබුවහොත් ඔහු/ඇය සේවයෙන් නිදහස් කළ හැකිය/නොහැකිය.

————,
දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ අත්සන.

දිනය :————.
නම :————.
තනතුර :————.
දෙපාර්තමේන්තුව :————.
(නිල මුද්‍රාව සහිතව)

03-691

02. මෙම තනතුර සඳහා මුස්ලිම් පුරුෂ පක්ෂයට පමණක් ඉල්ලුම් කළ හැකිය.

03. ඉල්ලුම්කරුවන්ගේ වයස අවුරුදු 30 ට නොඅඩු විය යුතු අතර, අවුරුදු 60 ට නොවැඩි විය යුතු ය.

04. ඉල්ලුම්කරුවන් විවාහක අය විය යුතු ය.

05. අධ්‍යාපන හා අනෙකුත් සුදුසුකම් ආදිය පිළිබඳ අමතර විස්තර අදාළ දිස්ත්‍රික් ලේකම් කාර්යාල, ඉඩම් හා දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් කාර්යාල, ප්‍රාදේශීය ලේකම් කාර්යාල, ග්‍රාම නිලධාරි කාර්යාල, ග්‍රාම සංවර්ධන සමිති සහ සමුපකාර සමිති ආදී කොට්ඨාසයේ ප්‍රසිද්ධ ස්ථානවල ප්‍රදර්ශනය කර ඇති දැන්වීම්වලින් බලාගත හැකිය.

06. මේ සඳහා අවශ්‍ය ඉල්ලුම්පත් අදාළ දිස්ත්‍රික්කයේ දිස්ත්‍රික් ලේකම් (දිසාපති) කාර්යාලයෙන් සහ ඉඩම් රෙජිස්ට්‍රාර් සහ දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් කාර්යාලයෙන් ලබාගත හැක.

07. සම්පූර්ණ කරන ලද ඉල්ලුම්පත් 2014 අප්‍රේල් මස 28 වැනි දින හෝ එදිනට පෙර උපලේඛනයේ සඳහන් ලිපිනයට ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් යැවිය යුතු ය.

ඊ. එම්. ගුණසේකර,
රෙජිස්ට්‍රාර් ජනරාල්.

2014 මාර්තු මස 12 වැනි දින,
බත්තරමුල්ල, ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත,
අංක 234/A3, රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුවේ දී ය.

**උපලේඛනය**

| *දිස්ත්‍රික්කය* | *ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය* | *ඉල්ලුම්පත් කැඳවන කොට්ඨාසය හා තනතුර* | *ඉල්ලුම්පත් යැවිය යුතු ලිපිනය* |
|---|---|---|---|
| අනුරාධපුර | තිරප්පනේ | හුරුළු පළාත කොට්ඨාසයේ නාච්චාදුව ප්‍රදේශයේ මුස්ලිම් විවාහ රෙජිස්ට්‍රාර් තනතුර | දිස්ත්‍රික් ලේකම්/ අතිරේක රෙජිස්ට්‍රාර් ජනරාල්, දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, අනුරාධපුර. |

03-916

---

## රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව

### මුස්ලිම් විවාහ ලියාපදිංචි කිරීමේ රෙජිස්ට්‍රාර් තනතුරු අනුරාධපුර දිස්ත්‍රික්කය

මෙහි පහත උපලේඛනයේ සඳහන් කොට්ඨාසවල ඇති විවාහ, උප්පැන්න හා මරණ ලියාපදිංචි කිරීමේ රෙජිස්ට්‍රාර් තනතුරු සඳහා ඉල්ලුම්පත් කැඳවනු ලැබේ.

01. ඉල්ලුම්කරුවන් අදාළ උප්පැන්න හා මරණ ලියාපදිංචි කිරීමේ කොට්ඨාසය තුළ ස්ථිර පදිංචියක් ඇත්තා වූ හා සෑහෙන දේපළක් හිමි ප්‍රදේශවාසීන්ගේ සැලකිල්ල ලබන අය ද විය යුතු ය.

---

## රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව

### විවාහ, උප්පැන්න හා මරණ ලියාපදිංචි කිරීමේ රෙජිස්ට්‍රාර් තනතුරු — කොළඹ දිස්ත්‍රික්කය

මෙහි පහත උපලේඛනයේ සඳහන් කොට්ඨාසවල ඇති විවාහ, උප්පැන්න හා මරණ ලියාපදිංචි කිරීමේ රෙජිස්ට්‍රාර් තනතුරු සඳහා ඉල්ලුම්පත් කැඳවනු ලැබේ.

01. ඉල්ලුම්කරුවන් අදාළ උප්පැන්න හා මරණ ලියාපදිංචි කිරීමේ කොට්ඨාසය තුළ ස්ථිර පදිංචියක් ඇත්තා වූ හා සෑහෙන දේපළක් හිමි ප්‍රදේශවාසීන්ගේ සැලකිල්ල ලබන අය ද විය යුතු ය.

02. මෙම තනතුර සඳහා ස්ත්‍රී/පුරුෂ දෙපක්ෂයටම ඉල්ලුම් කළ හැකි ය.

03. ඉල්ලුම්කරුවන්ගේ වයස අවුරුදු 30 ට නොඅඩු විය යුතු අතර, අවුරුදු 60 ට නොවැඩි විය යුතු ය.

04. ඉල්ලුම්කරුවන් විවාහක අය විය යුතු ය.

05. අධ්‍යාපන හා අනෙකුත් සුදුසුකම් ආදිය පිළිබඳ අමතර විස්තර අදාළ දිස්ත්‍රික් ලේකම් කාර්යාල, ඉඩම් හා දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් කාර්යාල, ප්‍රාදේශීය ලේකම් කාර්යාල, ග්‍රාම නිලධාරි කාර්යාල, ග්‍රාම සංවර්ධන සමිති සහ සමුපකාර සමිති ආදී කොට්ඨාසයේ ප්‍රසිද්ධ ස්ථානවල ප්‍රදර්ශනය කර ඇති දැන්වීම්වලින් බලාගත හැකි ය.

06. මේ සඳහා අවශ්‍ය ඉල්ලුම්පත් අදාළ දිස්ත්‍රික්කයේ දිස්ත්‍රික් ලේකම් (දිසාපති) කාර්යාලයෙන් සහ ඉඩම් රෙජිස්ට්‍රාර් සහ දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් කාර්යාලයෙන් ලබාගත හැකි ය.

07. සම්පූර්ණ කරන ලද ඉල්ලුම්පත් 2014 අප්‍රේල් මස 28 වැනි දින හෝ එදිනට පෙර උපලේඛනයේ සඳහන් ලිපිනයට ලැබෙන සේ ලියාපදිංචි තැපැල් මගින් යැවිය යුතු ය.

ඊ. එම්. ගුණසේකර,
රෙජිස්ට්‍රාර් ජනරාල්.

2014 මාර්තු මස 13 වැනි දින,
බත්තරමුල්ල, ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත,
අංක 234/A3, රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුවේ දී ය.

**උපලේඛනය**

| *දිස්ත්‍රික්කය* | *ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය* | *ඉල්ලුම්පත් කැඳවන කොට්ඨාසය හා තනතුර* | *ඉල්ලුම්පත් එවිය යුතු ලිපිනය* |
|---|---|---|---|
| කොළඹ | තිඹිරිගස්යාය | හැව්ලොක් ටවුන්, කිරුළපන, නාරාහේන්පිට, තිඹිරිගස්යාය, බොරැල්ල සහ වැල්ලවත්ත ප්‍රදේශය තුළ (දෙමළ මාධ්‍ය) අතිරේක විවාහ (සාමාන්‍ය) රෙජිස්ට්‍රාර්ධුරය | දිස්ත්‍රික් ලේකම්/ අතිරේක රෙජිස්ට්‍රාර් ජනරාල්, දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, කොළඹ |

03-1025

---

## රාජ්‍ය සේවා කොමිෂන් සභාව

### අධිකරණ අමාත්‍යාංශයේ භාෂා පරිවර්තක අධිකාරි තනතුර සඳහා බඳවා ගැනීම

අධිකරණ අමාත්‍යාංශයේ පුරප්පාඩුව පවතින භාෂා පරිවර්තක අධිකාරි තනතුර සඳහා බඳවා ගැනීමට පහත සුදුසුකම් සපුරාලන ශ්‍රී ලාංකිකයන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

02. *අධ්‍යාපන සුදුසුකම් :* විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්ව විද්‍යාලයකින් උපාධිය සමත් වී තිබීම :

සහ

සිංහල/දෙමළ/ඉංග්‍රීසි භාෂාව සඳහා අ. පො. ස. (සා. පෙළ) විභාගයේ දී සම්මාන සාමාර්ථයක් ලබා තිබීම ;

හෝ

අ. පො. ස. (උ. පෙළ) සිංහල/ ඉංග්‍රීසි/ දෙමළ සමත්ව තිබීම.

*වෘත්තීය සුදුසුකම් :* භාෂා පරිවර්තක සේවයේ විශේෂ පංතියේ නිලධාරියෙකු වීම ;

හෝ

භාෂා පරිවර්තක සේවයේ I වන පන්තියේ නිලධාරියෙකු වීම හා එම සේවයේ වසර 08ක සේවා පලපුරුද්දක් තිබීම.

*03. වෙනත් සුදුසුකම් :-*

1. අයදුම්කරුවන් විශිෂ්ඨ චරිතයකින් යුක්ත විය යුතුයි.
2. කායික සුදුසුකම් : සෑම අපේක්ෂකයෙකුම ශ්‍රී ලංකාවේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමටත් තනතුරේ රාජකාරි ඉටු කිරීමටත් ප්‍රමාණවත් ශාරීරික හා මානසික යෝග්‍යතාවයෙන් යුක්ත විය යුතුයි.

*තනතුරට බඳවා ගැනීම සඳහා අවශ්‍ය සුදුසුකම්, අයදුම්පත් කැඳවීමේ අවසන් දින වන විට සෑම ආකාරයකින්ම සම්පූර්ණ කර තිබිය යුතුය.*

*04. වැටුප් පරිමාණය :* MN-7-2006-A
මාසයකට රු. 20,030-11 x 365-18 x 500-රු.33,045

05. *සේවයට බඳවා ගැනීමේ ක්‍රමය:-*රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් පත් කරනු ලබන සම්මුඛ පරීක්‍ෂණ මණ්ඩලයක් මගින් පවත්වනු ලබන ව්‍යුහගත සම්මුඛ පරීක්‍ෂණයක් මගින් ලබාදෙන ලකුණු මත තෝරා ගනු ලබයි.

06. සේවයේ නියුක්ත කරවීමේ කොන්දේසි :-

(අ) මෙම තනතුර ස්ථිරය, විශ්‍රාම වැටුප් සහිතය. වැන්දඹු අනත්දරු/වැන්දඹු පුරුෂ හා අනත්දරු, විශ්‍රාම වැටුප් ක්‍රමයට දායක මුදල් ගෙවිය යුතු ය.

(ආ) තෝරාගනු ලබන අයදුම්කරුවන් ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ විධිවිධාන සහ රජයේ භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම පිණිස දැනට පවත්නා වූ සහ මින්මතු පනවනු ලබන්නා වූ නීතිරීති හා ව්‍යවස්ථාවන්ට අනුකූලව ක්‍රියා කළ යුතුය. එමෙන්ම ආයතන සංග්‍රහයේ විධිවිධාන, මුදල් රෙගුලාසි, දෙපාර්තමේන්තු නියෝග හා රජය මගින් නිකුත් කර ඇති හා නිකුත් කරනු ලබන නියෝගවලට යටත් විය යුතුය. 2009.02.20 දිනැති ගැසට් පත්‍රයේ පළ කරන ලද රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ නියෝගවලට තෝරාගත් අයදුම්කරුවන් යටත් විය යුතුය.

(ඇ) අයදුම්පත් භාර ගන්නා අවසන් දිනය 2014.04.28 වේ. තෝරාගනු ලබන අයදුම්කරුවන් ශ්‍රී ලංකාවේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමටත් තනතුරේ රාජකාරි ඉටු කිරීමටත් ප්‍රමාණවත් ශාරීරික හා මානසික යෝග්‍යතාවයෙන් යුක්ත විය යුතු අතර රජයේ වෛද්‍ය පරීක්ෂණයකින් සමත් විය යුතුයි.

07. මෙම නිවේදනයේ ආදර්ශ ආකෘතිය අනුව 4 ප්‍රමාණයේ කඩදාසි වල සකස් කළ අයදුම්පත් තම දෙපාර්තමේන්තු/ආයතන ප්‍රධානීන් මාර්ගයෙන් 2014.04.28 දින හෝ ඊට පෙර ලියාපදිංචි තැපෑලෙන් මෙහි අවසානයේ දැක්වෙන ලිපිනයට එවිය යුතුය. අයදුම්පත් බහාලන කවරයේ වම්පස උඩ කෙළවරේ "අධිකරණ අමාත්‍යාංශයේ භාෂා පරිවර්තක අධිකාරි තනතුර" යනුවෙන් සඳහන් කළ යුතුය.

08. සම්මුඛ පරීක්ෂණයේදී ලකුණු ලබාදීමේ ක්‍රමය

| *ලකුණු දීමේ රටාව* | | *උපරිම ලකුණු* |
|---|---|---|
| 01. **අතිරේක අධ්‍යාපන සුදුසුකම් :** | | |
| * පිළිගත් විශ්වවිද්‍යාලයකින් නීති ක්ෂේත්‍රයට අදාළ උපාධියක් ලබා තිබීම | 20 | |
| * පිළිගත් විශ්වවිද්‍යාලයකින් නීති ක්ෂේත්‍රයට අදාළ පශ්චාත් උපාධියක් ලබා තිබීම | 15 | |
| * පිළිගත් විශ්වවිද්‍යාලයකින් නීති ක්ෂේත්‍රයට අදාළ ඩිප්ලෝමාවක් ලබා තිබීම | 05 | 20 |
| * පිළිගත් විශ්වවිද්‍යාලයක/ආයතනයක නීති ක්ෂේත්‍රය පිළිබඳ සහතික පත්‍ර පාඨමාලාවක් හදාරා තිබීම | 03 | |
| (උපරිම වශයෙන් ලකුණු 20ක් ලබාදිය හැකිය.) | | |
| 02. **භාෂා ප්‍රවීණතාව :** | | |
| * විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ අනුමත විශ්ව විද්‍යාලයකින් ලබාගත් උපාධියේ/ ශ්‍රී ලංකා නීති විද්‍යාල විභාගයේ ප්‍රධාන විෂයයක් ලෙස සිංහල/දෙමළ/ඉංග්‍රීසි භාෂාව හදාරා තිබීම | 25 | |
| (මූලික සුදුසුකමක් වශයෙන් සළකා බලනු ලැබූ උපාධිය මෙහි දී නැවත වරක් සලකා නොබැලිය යුතුය.) | | |
| * පිළිගත් විශ්වවිද්‍යාලයකින් සිංහල/දෙමළ/ඉංග්‍රීසි භාෂාව පිළිබඳ වසරකට නොඅඩු ඩිප්ලෝමාවක් ලබා තිබීම | 15 | 25 |
| * පිළිගත් විශ්වවිද්‍යාලයක සිංහල/දෙමළ/ඉංග්‍රීසි භාෂාව පිළිබඳ මාස 06කට නොඅඩු සහතික පත්‍ර පාඨමාලාවක් හදාරා තිබීම | 10 | |
| 03. **අතිරේක සුදුසුකම් :** | | |
| (i) භාෂා පරිවර්තක සේවය : | | |
| * භාෂා පරිවර්තක සේවයේ විශේෂ ශ්‍රේණියේ පළපුරුද්ද (එක් එක් වර්ෂයක් සඳහා ලකුණු 05 බැගින් හිමිවේ.) | 20 | |

*ලකුණු දීමේ රටාව* *උපරිම ලකුණු*

| | | |
|---|---|---|
| භාෂා පරිවර්තක සේවයේ 1 වැනි පන්තියේ පළපුරුද්ද, (මෙම නිවේදනයේ වෘත්තීය සුදුසුකම් යටතේ මූලික, සුදුසුකම් ලෙස දක්වා ඇති භාෂා පරිවර්තන සේවයේ වසර 08 ක පළපුරුද්දට අමතරව එක් එක් වර්ෂයක් සඳහා ලකුණු 02 බැගින් උපරිම වශයෙන් ලකුණු 20 ක් | | |
| (ii) අධිකරණ ක්ෂේත්‍රයේ භාෂා පරිවර්තක සේවය : | | 30 |
| * අධිකරණ ක්ෂේත්‍රයේ භාෂා පරිවර්තක සේවයේ පළපුරුද්ද (එක් එක් වර්ෂයක් සඳහා ලකුණු 02 බැගින් හිමිවේ.) | 10 | |
| 04. **අතිරේක සුදුසුකම් - පරිගණක සාක්ෂරතාව :** | | |
| * රජයේ පිළිගත් ආයතනයක තොරතුරු තාක්ෂණය පිළිබඳ මාස 06 කට නොඅඩු ඩිප්ලෝමාවක් හදාරා තිබීම (එක් එක් සහතික පත්‍ර පාඨමාලාවක් සඳහා ලකුණු 10 බැගින් හිමි වේ.) | | 20 |
| * රජයේ පිළිගත් ආයතනයක තොරතුරු තාක්ෂණය පිළිබඳ මාස 03කට නොඅඩු සහතික පත්‍ර පාඨමාලාවක් හදාරා තිබීම. (එක් එක් සහතික පත්‍ර පාඨමාලාවක් සඳහා ලකුණු 05 බැගින් හිමි වේ.) | | |
| 05. සම්මුඛ පරීක්ෂණයේ දී දක්වන ලද කුසලතාව | | 05 |

09. සෑම ආකාරයකින්ම සම්පූර්ණ නොවන, මූලික සුදුසුකම් නොමැති සහ නියමිත දිනට පසුව ලැබෙන අයදුම්පත් දැනුම් දීමකින් තොරව ප්‍රතික්ෂේප කරන අතර, ඉල්ලුම්පත්‍රය හෝ ඒ හා සම්බන්ධ ලිපි තැපෑලේ දී නැති වූ බවට කරන පැමිණිලි සලකා බලනු නොලැබේ.

10. යම් අයදුම්කරුවකුගේ අයදුම්පතෙහි කිසියම් සාවද්‍ය ප්‍රකාශයක් තිබීම හේතුවෙන් ඔහු/ඇය නුසුදුස්සකු බවට පත් කරනු ලැබීමටත්, තෝරා ගැනීමෙන් පසු ඒ බව අනාවරණය වුවහොත් ඔහු/ඇය සේවයෙන් පහ කිරීමටත් ඉඩ ඇත.

මෙහි සඳහන් නොවන කරුණක් සඳහා තීරණ ගැනීමේ බලධාරියා රාජ්‍ය සේවා කොමිෂන් සභා ලේකම් වේ.

රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ නියෝග පරිදි මෙම දැන්වීම ප්‍රසිද්ධ කරන ලදී.

කමලිනී ද සිල්වා,
අධිකරණ අමාත්‍යාංශ ලේකම්.

අධිකරණ අමාත්‍යාංශය,
උපරිමාධිකරණ සංකීර්ණය,
කොළඹ 12

**ආදර්ශ අයදුම්පත්‍රය**

***අධිකරණ අමාත්‍යාංශය***

*භාෂා පරිවර්තක අධිකාරී තනතුර සඳහා අයදුම්පත්‍රය*

අංකය :————.
(කාර්යාලයීය ප්‍රයෝජනය සඳහා)

01. (අ) මුලකුරු සමග නම (සිංහලෙන්/දෙමළෙන්) :————.
මුලකුරු සමග නම (ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්) :————.
(ආ) සම්පූර්ණ නම (සිංහලෙන්/දෙමළෙන්) :————.
සම්පූර්ණ නම (ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්) :————.

02. ස්ථිර ලිපිනය (සිංහලෙන්/දෙමළෙන්) :————.

03. ස්ථිර ලිපිනය (ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්) :————.

04. දුරකථන අංකය :————.

05. ජාතික හැඳුනුම්පත් අංකය : | | | | | | | | | | |

06. ස්ත්‍රී/පුරුෂ භාවය :————.

07. උපන් දිනය : වර්ෂය :————. මාසය :————. දිනය :————.

08. ඉල්ලුම්පත් භාර ගන්නා අවසාන දිනට වයස :
වර්ෂ :————. මාස :————. දින :————.

09. ජාතිය :————.

10. විවාහක/අවිවාහක බව :————.

11. අධ්‍යාපන සුදුසුකම් :

**අ. පො. ස. (සාමාන්‍ය පෙළ) විභාගය**

වර්ෂය :————. විභාග අංකය :————.

| *විෂයය* | *සාමාර්ථය* | *විෂයය* | *සාමාර්ථය* |
|---|---|---|---|
| | | | |

**අ. පො. ස. (උසස් පෙළ) විභාගය**

වර්ෂය :————. විභාග අංකය :————.

| *විෂයය* | *සාමාර්ථය* | *විෂයය* | *සාමාර්ථය* |
|---|---|---|---|
| | | | |

**උපාධිය පිළිබඳ විස්තර**

උපාධිය :————.
විෂයයන් :————.
විශ්ව විද්‍යාලය :————.
උපාධිය පිරිනැමූ දිනය :————.
භාෂා මාධ්‍යය :————.

12. වෘත්තීය සුදුසුකම් :
භාෂා පරිවර්තක සේවයේ 1 පන්තියට/විශේෂ පන්තියට පත් වූ දිනය :————.
පළපුරුද්ද (වසර ගණන) :————.
අධිකරණ ක්ෂේත්‍රයේ භාෂා පරිවර්තකයකු ලෙස සේවා පළපුරුද්ද (වසර ගණන) :————.

13. වෙනත් අධ්‍යාපන සුදුසුකම් :
(i) ————.
(ii) ————.
(iii) ————.

14. භාෂා ප්‍රවීණතාව : (අදාළ තීරුවේ ✓ ලකුණ යොදන්න)

| | ඉතා හොඳයි | හොඳයි | සාමාන්‍යයි | දුර්වලයි |
|---|---|---|---|---|
| සිංහල | | | | |
| දෙමළ | | | | |
| ඉංග්‍රීසි | | | | |

**අයදුම්කරුගේ සහතිකය**

…………………… වන මම මෙහි සඳහන් කරන ලද සියලුම කරුණු සත්‍ය හා නිවැරදි බව ප්‍රකාශ කරමි. මම රජයේ සේවයෙන් පහකර හෝ සානුකම්පිත විකල්පයක් වශයෙන් ආකාර්යක්ෂමතාවය මත සේවයෙන් විශ්‍රාම ගන්වා හෝ නොමැති බවත්, තනතුරු අතහැර ගිය අයෙකු සේ සලකා නැති බවත් සහතික කරමි. මෙහි අන්තර්ගත කරුණු කිසිවක් අසත්‍ය බව හෝ වැරදි බව මා තෝරා ගැනීමට කලින් හෙළිවුවහොත් නුසුදුසු කිරීමට යටත් වන බවත්, තෝරා ගැනීමෙන් අනතුරුව එවැනි තත්ත්වයක් අනාවරණය වුවහොත් කිසිදු වන්දියක් නොගෙවා රැකියාවෙන් ඉවත් කළ හැකි බවත් මම දනිමි.

————,
අයදුම්කරුගේ අත්සන.

දිනය :————.

**දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ සහතිකය**

…………………… මහතා/මෙනවිය/මිය දැනට මෙම අමාත්‍යාංශයේ/දෙපාර්තමේන්තුවේ භාෂා පරිවර්තක සේවයේ/පන්තියේ/විශේෂ ශ්‍රේණියේ නිලධාරියෙකු/නිලධාරිණියක වශයෙන් සේවය කරන බවත්, මෙම තනතුර සඳහා තෝරාගනු ලැබුවහොත් ඔහු/ඇය සේවයෙන් නිදහස් කළ හැකි/නොහැකි බවත් දන්වමි.

————,
දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ අත්සන.

දිනය :————.
නම :————.
තනතුර :————.
අමාත්‍යාංශය/දෙපාර්තමේන්තුව :————.

03-937

# විභාග, විභාග ප්‍රතිඵල ආදිය

## ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව

### ජාතික නැටුම්/සංගීත විභාගය - 2014 වර්ෂය

උක්ත විභාගය 2014 ජූලි මස පැවැත්වීම සඳහා ම විසින් ඉල්ලුම්පත් කැඳවනු ලැබේ. මෙම විභාගය ලිඛිත පරීක්ෂණයකින් හා ප්‍රායෝගික පරීක්ෂණයකින් සමන්විත ය. ලිඛිත පරීක්ෂණය පවත්වනු ලබන්නේ ප්‍රධාන විෂයය සඳහා වන අතර, ප්‍රායෝගික පරීක්ෂණය ප්‍රධාන විෂයය සහ අනුවිෂයය යන දෙකටම පවත්වනු ලැබේ.

02. දිවයිනේ සෑම දිස්ත්‍රික්කයක් තුළ ම, අයැදුම්කරුවන්ගේ සංඛ්‍යාව අනුව විභාග මධ්‍යස්ථාන පිහිටුවනු ලැබේ. එහෙත් යම් නගරයක් සඳහා ප්‍රමාණවත් අයැදුම්කරුවන් සංඛ්‍යාවක් ඉදිරිපත් නොවන අවස්ථාවක දී එකී විභාග මධ්‍යස්ථාන අවලංගු කොට අදාළ අයැදුම්කරුවන් යාබද විභාග මධ්‍යස්ථාන පිහිටි නගරය වෙත යොමු කිරීමට සිදු වනු ඇත. 5.6 ඡේදයේ සඳහන් නගරවල මෙම විභාගය පැවැත්වේ.

03. මෙම විභාගය පවත්වනු ලබන්නේ සිංහල මාධ්‍යයෙන් පමණි.

04. මෙම විභාගය පරිගණකගත විභාගයක් බැවින්, අයදුම්පත් පහත දැක්වෙන ආකෘතියට අනුකූලව ඒ 4 ප්‍රමාණයේ කඩදාසියක දෙපැත්තම භාවිත කරමින්, පිළියෙල කර දෙපැත්තම භාවිතා කරමින්, පිළියෙල කර ඇමුණුම 01 හා ඇමුණුම 02 පදනම් කර ගනිමින් පැහැදිලිව ද නිවැරදිව ද සම්පූර්ණ කර ඉදිරිපත් කළ යුතුය. දී ඇති උපදෙස් පරිදි ප්‍රධාන විෂයයට අනුකූල නොවන අනුවිෂයන් තෝරා ගැනීමෙන් වැළකි සිටිය යුතු ය. එසේ නොවන අයැදුම්පත් අසම්පූර්ණ අයදුම්පත් සහ අයැදුම්පත් භාර ගන්නා අවසාන දිනට පසුව ලැබෙන අයැදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ. (ඇමුණුම 01 සහ ඇමුණුම 02 බලන්න.)

05. *අයැදුම්කරුවන්ට උපදෙස් :*

5.1 *සුදුසුකම් .-* සෑම අයැදුම්කරුවෙකුම පහත සඳහන් විභාග අතරින් එකක දී සිංහල භාෂාව විෂයයෙන් සමත් වී සිටිය යුතු ය.

(*අ*) අ. පො. ස. (සා/පෙළ) විභාගය ;
(*ආ*) ජා. පො. අ. ස. විභාගය ;
(*ඇ*) ප්‍රාචීන ප්‍රාරම්භ විභාගය ;
(*ඈ*) මූලික පිරිවෙන් අවසාන විභාගය.

ඉහත විභාගවලට සමාන හෝ ඉහළ මට්ටමේ හෝ විභාගයකින් සිංහල භාෂාව විෂයයෙන් සාමාර්ථ්‍යය ලබා ඇත්නම් එය ද වලංගු වේ.

සැ. යු..-අයැදුම්පත් භාර ගන්නා අවසාන දිනට 5.1 හි සඳහන් සුදුසුකම් සම්පූර්ණ කර නොමැති සෑම අයැදුම්කරුවකුම මෙම විභාගයේ දී සිංහල භාෂාව විෂයය ප්‍රශ්න පත්‍රයට පෙනී සිටිය යුතු ය. නැටුම් විභාගයට පෙනී සිටින අයැදුම්කරුවන් ශාස්ත්‍රීය අවබෝධය (නැටුම් සම්ප්‍රදාය හා සංස්කෘතික පසුබිම) ප්‍රශ්න පත්‍රය සඳහා පෙනී සිටිය යුතු ය.

5.2 *වයස් සීමාව .-* 2014.04.30 වැනි දිනට වයස අවුරුදු 15 සම්පූර්ණ විය යුතු අතර, උපරිම වයස් සීමාවක් නොමැත. අත්සන සහතික කරන බලධාරියා ලවා උප්පැන්න සහතිකය පරීක්ෂා කරවා නිරවද්‍යතාව සහතික කිරීමට වග බලා ගත යුතු ය. නියමිත වයස් සීමාව සම්පූර්ණ කර නොමැති අයැදුම්කරුවන්ගේ ඉල්ලුම්පත් ප්‍රතික්ෂේප වනු ඇත.

5.3 *අයැදුම්පත් .-* ව්‍යවස්ථා සංග්‍රහයට අනුව, ප්‍රාරම්භ පරීක්ෂණයේ දී තෝරා ගන්නා ගණය (ප්‍රධාන විෂයය හා ඊට අනුකූල අනුවිෂයය) මධ්‍යම හා අවසාන පරීක්ෂණ සඳහා ද යෙදේ. අයැදුම්කරුවන් ප්‍රාරම්භ පරීක්ෂණයේ දී තෝරාගත් ගණය හෝ එම ගණයට අයත් තෝරාගත් විෂයන් හෝ මධ්‍යම හා අවසාන පරීක්ෂණ සඳහා වෙනස් කළ නොහැකි ය. එසේ කරනු ලබන අයැදුම්කරුවන්ගේ අපේක්ෂකත්වය අවලංගු කරනු ඇත. ප්‍රාරම්භ පරීක්ෂණයේ ප්‍රධාන විෂයයට අනුකූල වන පරිදි අනුවිෂයය ද තෝරා ගැනීම කෙරෙහි අයැදුම්කරුවන් විශේෂයෙන් සැළකිලිමත් විය යුතු ය. සම්පූර්ණ කරන ලද අයැදුම්පත් 2014.04.30 වැනි දිනට හෝ ඊට ප්‍රථම "විභාග කොමසාරිස් ජනරාල්, සංවිධාන හා විදේශ විභාග ශාඛාව, ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව, පැලවත්ත, බත්තරමුල්ල" යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතු ය. මෙදිනට පසුව ලැබෙන අයැදුම්පත් හා අසම්පූර්ණ අයැදුම්පත් දැනුම් දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ.

5.4 අයැදුම්පත් බහා එවන කවරයේ වමත් පස ඉහල කෙළවරේ "ජාතික නැටුම්/සංගීත විභාගය - 2014" යනුවෙන් සඳහන් කළ යුතු ය.

5.5 අයැදුම්පත සම්පූර්ණ කිරීමට පෙර පෙනී සිටිය යුතු විෂයන් හා අනෙකුත් විස්තර සඳහා අදාළ ව්‍යවස්ථා හා නිර්දේශ කෙරෙහි ඔබගේ අවධානය යොමු කරවනු ලැබේ. ප්‍රධාන විෂයය හා අනුවිෂයය සඳහා විවිධ වූ විෂය අංක භාවිත වන බැවින් ඉහත 5.3හි සඳහන් කරුණු පිළිබඳව මනා අවධානයෙන් හා සැළකිල්ලෙන් යුතුව ඇමුණුම 01 හා 02 පරිශීලනය කරමින් ඉතා නිවැරදිව අයැදුම්පත්‍රය සම්පූර්ණ කළ යුතු බව අවධාරණය කරමි. තව ද ආදර්ශ අයැදුම්පත්‍රයේ අංක 01 සිට 08 තෙක් පළමුවන පිටුවට ද ඉතිරිය 02 වන පිටුවට ද වන ලෙස, ඒ - 4 ප්‍රමාණයේ කඩදාසියක ඇයදුම්පත්‍රය සකස් කළ යුතු වේ. ආදර්ශ අයැදුම්පත්‍රය දෙපාර්තමේන්තු වෙබ් අඩවියෙන් ද (www.doenets.lk) ලබා ගත (Download) හැක.

5.6 විභාගය පැවැත්වෙන නගර සහ ඊට අදාළ අංක පහත දැක්වේ. :-

| *නගරය* | *නගර අංකය* | *නගරය* | *නගර අංකය* |
|---|---|---|---|
| කොළඹ | 01 | මහනුවර | 10 |
| ගම්පහ | 02 | කෑගල්ල | 11 |
| කළුතර | 03 | මාතලේ | 12 |
| ගාල්ල | 04 | බදුල්ල | 13 |
| මාතර | 05 | අනුරාධපුරය | 14 |
| තංගල්ල | 06 | පොළොන්නරුව | 15 |
| රත්නපුර | 07 | කුරුණෑගල | 16 |
| අම්පාර | 08 | කුලියාපිටිය | 17 |
| මොනරාගල | 09 | | |

5.7 *විභාග ගාස්තු .-* ලිඛිත විභාගය සඳහා විභාග ගාස්තු පහත සඳහන් පරිදි වේ.

| | | *රු. ශ.* |
|---|---|---|
| ප්‍රාරම්භ | - | 300 0 |
| මධ්‍යම | - | 400 0 |
| අවසාන | - | 500 0 |

අදාළ විභාග ගාස්තු "විභාග කොමසාරිස් ජනරාල්" නමින් දිවයිනේ ඕනෑම තැපැල් කාර්යාලයකට ගෙවිය හැකි අතර, එසේ අයැදුම්කරුගේ නමින්ම මුදල් ගෙවා ලබා ගන්නා ලද ලදුපත අයැදුම්පත්‍රයේ නියමිත ස්ථානයේ අලවා එවිය යුතු ය. විභාග ගාස්තු කුමන හේතුවක් නිසාවත් ආපසු නොගෙවන අතර, එම ගාස්තු වෙනත් විභාගයක් සඳහා මාරු කිරීමට ද නොහැකි ය. නියමිත ගාස්තු ගෙවා නැති ඉල්ලුම්පත්‍ර හා මුද්දර, මුදල් ඇණවුම් සහිත ඉල්ලුම්පත්‍ර ප්‍රතික්ෂේප කරනු ලැබේ. මුදල් ගෙවා ලබාගන්නා ලදුපතේ හා අයැදුම්පත්‍රයේ ඡායා පිටපත් ළඟ තබා ගැනීම ප්‍රයෝජනවත් වනු ඇත.

5.8 *ප්‍රවේශ පත්‍ර .-* අයැදුම්කරුවන් වෙත ප්‍රවේශ පත්‍ර නිකුත් කළ වහාම ඒ බව සඳහන් කරමින් පුවත්පත් නිවේදනයක් ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව මගින් පළකරනු ඇත. නිවේදනය පළ වී දින 02 හෝ 03ක් ගත වූ පසුවත් ප්‍රවේශ පත්‍රය නොලැබුණි නම් දැන්වීමේ සඳහන් ආකාරයට ඒ බව ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව වෙත දන්වා සිටිය යුතුයි. එහි දී ඔබ වෙත තබාගත් අයදුම්පත්‍රයේ පිටපත, විභාග ගාස්තු ගෙවා ලබාගත් ලදුපතේ පිටපත හා අයදුම්පත්‍රය තැපැල් කිරීමේ දී ලියාපදිංචි කරන ලද කුවිතාන්සියද ළඟ තබාගෙනම ඔබගේ සම්පූර්ණ නම, ලිපිනය හා ඉල්ලුම්කරන ලද විභාගය සඳහන් කරමින් විමසා සිටිය යුතු ය. ඔබ කොළඹින් බැහැර ප්‍රදේශයක අයදුම්කරුවෙකු නම් ප්‍රවේශ පත්‍රයේ පිටපතක් ෆැක්ස් මගින් ඔබ වෙත එවීම සඳහා ෆැක්ස් අංකයක් ද සඳහන් කරන ලද ඉල්ලීම් ලිපියක් හා ඉහත සඳහන් ලේඛනවල පිටපත් ෆැක්ස් මගින් ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව වෙත යොමු කරමින් විමසා සිටීම වඩාත් ඵලදායි වේ.

5.9 ප්‍රායෝගික පරීක්ෂණය සඳහා අවශ්‍ය වාද්‍ය භාණ්ඩ අයැදුම්කරුවන් විසින් සපයා ගත යුතු ය.

5.10 කිසියම් අයැදුම්කරුවකු වෙත ප්‍රවේශ පත්‍රයක් නිකුත් කිරීම අදාළ අයැදුම්කරු විභාගය සඳහා සියලු සුදුසුකම් සපුරා ඇති බව තහවුරු කිරීමක් නොවේ. අයැදුම්කරු සපයා ඇති තොරතුරු සාවද්‍ය බව හැඟී ගියහොත්, ඒ සම්බන්ධයෙන් අවසන් තීරණය විභාග කොමසාරිස් ජනරාල් සතුවේ. කිසියම් විභාග අපේක්ෂකයකු විභාගය සමත්වීම සඳහා ප්‍රධාන විෂයය සඳහා අවම වශයන් ලකුණු 40%ක්'ද,, ප්‍රායෝගික පරීක්ෂණයේ එක් එක් විෂයයක් සඳහා අවම වශයෙන් 40 ක් බැගින් ද ලබාගත යුතු ය.

ඩබ්ලිව්. එම්. එන්. ජේ. පුෂ්පකුමාර,
විභාග කොමසාරිස් ජනරාල්.

2014 මාර්තු මස 11 වැනි දින.
පැලවත්ත, බත්තරමුල්ල. ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවේ,
සංවිධාන හා විදේශ විභාග ශාඛාවේ දී ය.

*ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව*

*ජාතික නැටුම් විභාගය - 2014 "D"*

නැටුම්

කාර්යාලීය ප්‍රයෝජනය සඳහා

ඉල්ලුම් කරන විභාගය
ප්‍රාරම්භ - P, මධ්‍යම - M, අවසාන - F
(අදාළ පරිදි කොටු තුළ ලියන්න)

අකුරින් | ඉංග්‍රීසි සංකේත අක්‍ෂරය

| *ඉල්ලුම් කරන නගරයේ නම (ඉංග්‍රීසියෙන්)* | *එහි අංකය* |
|---|---|
| | |

1. (අ) සම්පූර්ණ නම :

(ඉංග්‍රීසි කැපිටල් අකුරෙන් සඳහන් කරන්න.)

(ආ) මුලකුරු අගට යොදා මුලකුරු සමග නම :
*උදා* : HERATH MUDALIGE
SUPUN PERERA ⟶ PERERA H. M. S.

(ඉංග්‍රීසි කැපිටල් අකුරෙන් සඳහන් කරන්න.)

(සිංහලෙන් පැහැදිලි අකුරෙන් සඳහන් කරන්න.)

2. ස්ථිර ලිපිනය :

(ඉංග්‍රීසි කැපිටල් අකුරෙන් සඳහන් කරන්න.)

3. ස්ත්‍රී/පුරුෂභාවය : ස්ත්‍රී - 1, පුරුෂ - 0

(අදාළ අංකය කොටුව තුළ ලියන්න)

4. ජාතික හැඳුනුම්පත් අංකය :

5. ඉල්ලුම් කරන විෂයයන් හා විෂය අංක පහත දැක්වෙන කොටු තුළ ලියන්න. (*ගැසට් නිවේදනයේ ඇමුණුම 01 බලන්න.*)

| ප්‍රධාන විෂයයේ නම | *විෂය අංකය* |
|---|---|
| | |

| *අනු විෂයයේ නම* | *විෂය අංකය* |
|---|---|
| | |

6. සිංහල භාෂා විශේෂ ප්‍රශ්න පත්‍රයට පෙනී සිටින්නේ නම් අංක 001, මෙම කොටුව තුළ සඳහන් කරන්න.
(*ගැසට් නිවේදනයේ* 05 *වැනි ඡේදය බලන්න.*)

7. සමත් වී ඇති ප්‍රාරම්භ/මධ්‍යම/අවසාන විභාග පිළිබඳ විස්තර :

| | ප්‍රාරම්භ | මධ්‍යම | අවසාන |
|---|---|---|---|
| විභාග අංකය | | | |
| වර්ෂය | | | |

8. ඌන සාමාර්ථ්‍යය සම්පූර්ණ කිරීමට මෙම විභාගයට ඉදිරිපත් වන්නේ නම් ඌන සාමාර්ථ්‍යය ලැබූ විභාගය පිළිබඳ විස්තර :—

1. වර්ෂය :
2. විභාග අංකය :
3. ඌන සාමාර්ථ්‍යය ලත් * විභාගය :
4. ඌන සාමාර්ථ්‍යය ලත් *අනු විෂයය : විෂයය අංකය :

(මෙහි ඇතුළත් ඇමුණුම 01 ලේඛනයේ සඳහන් විෂය අංකය ම සඳහන් කරන්න. ඌන සාමාර්ථ්‍යය ලද ප්‍රතිඵල සටහනේ ඡායා පිටපතක් අමුණා එවිය යුතු ය.)

* ඌන සාමාර්ථ්‍යයලත් අයදුම්කරුවන් යනු පසුගිය වර්ෂයේ පැවති ප්‍රායෝගික පරීක්ෂණයෙන් ප්‍රධාන විෂයය සමත් වී අනු විෂයය අසමත් වූ අයදුම්කරුවන් පමණක් වේ.

9. (අ) උපන් දිනය :

අවුරුද්ද : මාසය : දිනය :

(ආ) 2014.04.30 වැනි දිනට වයස :

අවුරුදු : මාස : දින :

(ප්‍රාරම්භ කොටසට පෙනී සිටින්නේ නම් පමණක් උප්පැන්න සහතිකයේ සහතික කරන ලද ඡායා පිටපතක් අමුණා එවිය යුතු ය.)

10. දුරකථන අංකය :

11. ගෙවන ලද විභාග ගාස්තු : (වචනයෙන්) රු. ————.
(ඉලක්කමෙන් රු. ————. )
විභාග ගාස්තු ගෙවූ තැපැල්/උප තැපැල් කාර්යාලය :————.
තැපැල් කාර්යාලයෙන් නිකුත් කළ කුවිතාන්සි අංකය :————.
දිනය :————.
(මුද්දර හා මුදල් ඇණවුම් අලවා එවන අයදුම්පත් දැන්වීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ඇත.)

12. විභාග ගාස්තු තැපැල් කාර්යාලයට ගෙවා ලබාගත් රිසිට් පත නොගැළවෙන සේ එහි දාරයක් පහත කොටුවේ අලවන්න.

රිසිට් පත මෙහි අලවන්න.

(එහි අංකය සහ දිනය පැහැදිලිව සඳහන් ඡායා පිටපතක් ළඟ තබාගන්න.)

අයදුම්පතේ සඳහන් කරුණු සත්‍ය හා නිවැරදි බව ප්‍රකාශ කරමි. මෙම විභාගය සම්බන්ධව විභාග කොමසාරිස් ජනරාල් විසින් පනවනු ලබන නීති රීතිවලට මම එකඟ වෙමි.

————,
අයදුම්කරුගේ අත්සන.

*අයදුම්කරුගේ අත්සන සහතික කිරීම :*

ඉහත විස්තර දක්වා ඇති අයදුම්කරු .................................... දින මා ඉදිරිපිට දී මෙහි අත්සන් තබන ලද බව ද, ඔහුගේ/ඇයගේ ජාතික හැඳුනුම්පත් අංකය .............. බව ද, උප්පැන්න සහතිකයේ සඳහන් පරිදි ඔහුගේ/ඇයගේ උපන් දිනය ............................. බව ද, අයදුම්පත් භාර ගන්නා අවසාන දිනට වයස අවුරුදු 15ට වැඩි බව ද, සහතික කරමි. (උප්පැන්න සහතිකය බලන්න.)

අත්සන සහතික කරන අයගේ නම :————.
තරාතිරම :————.
(රබර් මුද්‍රාවකින් සනාථ කරන්න.)

ලිපිනය :————.

දිනය :————.

————,
අත්සන සහතික කරන අයගේ අත්සන.

*සැලකිය යුතුයි* - (අයදුම්කරුගේ අත්සන අනුමත පාසලක ප්‍රධානියෙකු, ග්‍රාම නිලධාරියෙකු, සාමදාන විනිශ්චයකාරවරයෙකු, දිවුරුම් කොමසාරිස්වරයෙකු, නීතිඥවරයකු, ප්‍රසිද්ධ නොතාරිස් කෙනෙකු රජයේ හෝ පළාත් පාලන සේවාවක වාර්ෂිකව රුපියල් 240,360.00 හෝ ඊට වැඩි ඒකාබද්ධ වැටුපක් ලබන මාණ්ඩලික නිලධාරියෙකු හෝ පරිවේණාධිපති, විහාරාධිපති හෝ පූජ්‍ය ස්ථානයක් භාර ප්‍රධාන පූජකවරයෙකු විසින් හෝ සහතික කළ හැකිය.)

*ජාතික නැටුම් විභාගය - 2014* " **D** "

**නැටුම් - විෂය ලේඛනය හා විෂය අංක**

| *විෂය ලේඛනය* | *විෂය අංකය* | | |
|---|---|---|---|
| (අ) ප්‍රධාන විෂයය : | ප්‍රාරම්භ | මධ්‍යම | අවසාන |
| | **නැටුම්** | | |
| සබරගමු නැටුම් | 110 | 210 | 310 |
| පහතරට නැටුම් | 120 | 220 | 320 |
| උඩරට නැටුම් | 130 | 230 | 330 |
| | **බෙර වාදනය** | | |
| පහතරට බෙර වාදනය | 140 | 240 | 340 |
| උඩරට බෙර වාදනය | 150 | 250 | 350 |
| (ආ) අනු විෂයය : | | | |
| සංගීතය | 112 | 212 | 312 |
| | **බෙර වාදනය** | | |
| සබරගමු දවුල් වාදනය | 113 | 213 | 313 |
| පහතරට බෙර වාදනය | 141 | 241 | 341 |
| උඩරට බෙර වාදනය | 151 | 251 | 351 |
| ජන ගායනා | 114 | 214 | 314 |
| | **භාරතීය නැටුම්** | | |
| කථක් | 115 | 215 | 315 |
| කථකලි | 116 | 216 | 316 |
| මනිපූරි | 117 | 217 | 317 |
| භරත | 118 | 218 | 318 |
| | **සාම්ප්‍රදායික නැටුම්** | | |
| සබරගමු නැටුම් | 111 | 211 | 311 |
| පහතරට නැටුම් | 121 | 221 | 321 |
| උඩරට නැටුම් | 131 | 231 | 331 |
| නිර්මාණ | 119 | 219 | 319 |

| ( | ප්‍රාරම්භ | මධ්‍යම | අවසාන |
|---|---|---|---|
| **ශාස්ත්‍රීය අවබෝධය** | | | |
| නැටුම් සම්ප්‍රදාය හා සංස්කෘතික පසුබිම | 122 | 222 | 322 |
| සිංහල භාෂාව විශේෂ ප්‍රශ්න පත්‍රය | | 001 | |

ප්‍රධාන විෂයයට අනුකූල නොවන අනුවිෂයය ලේඛනය

(මෙම විෂයයන් තෝරා ගැනීමෙන් වැළකිය යුතුය.)

| *ප්‍රධාන විෂයය හා විෂය අංකය* | | *අනුවිෂයය හා විෂය අංකය* | |
|---|---|---|---|
| සබරගමු නැටුම් | 110/210/310 | සබරගමු නැටුම් | 111/211/311 |
| පහතරට නැටුම් | 120/220/320 | පහතරට නැටුම් | 121/221/321 |
| උඩරට නැටුම් | 130/230/330 | උඩරට නැටුම් | 131/231/331 |
| පහතරට බෙර වාදනය | 140/240/340 | පහතරට බෙර වාදනය | 141/241/341 |
| උඩරට බෙර වාදනය | 150/250/350 | උඩරට බෙර වාදනය | 151/251/351 |

**ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව**

ජාතික සංගීත විභාගය - 2014 'M'

**සංගීත**

(කාර්යාලීය ප්‍රයෝජනය සඳහා)

ඉල්ලුම් කරන විභාගය :
ප්‍රාරම්භ - P, මධ්‍යම - M, අවසාන - F
(අදාළ පරිදි කොටු තුළ ලියන්න)

අකුරින් :

ඉංග්‍රීසි සංකේත අක්ෂරය :

| *ඉල්ලුම් කරන නගරයේ නම (ඉංග්‍රීසියෙන්)* | *එහි අංකය* |
|---|---|
| | |

1. (අ) සම්පූර්ණ නම :

(ඉංග්‍රීසි කැපිටල් අකුරෙන් සඳහන් කරන්න.)

(ආ) මුලකුරු අගට යොදා මුලකුරු සමග නම :
උදා :HERATH MUDALIGE.
SUPUN PERERA ⟶ PERERA H. M. S.

(ඉංග්‍රීසි කැපිටල් අකුරෙන් සඳහන් කරන්න.)

(සිංහලෙන් පැහැදිලි අකුරෙන් සඳහන් කරන්න.)

2. ස්ථිර ලිපිනය :

(ඉංග්‍රීසි කැපිටල් අකුරෙන් සඳහන් කරන්න.)

3. ස්ත්‍රී/පුරුෂභාවය : ස්ත්‍රී - 1, පුරුෂ - 0

(අදාළ අංකය කොටුව තුළ ලියන්න)

4. ජාතික හැඳුනුම්පත් අංකය :

5. ඉල්ලුම් කරන විෂයයන් හා විෂය අංක පහත දැක්වෙන කොටු තුළ ලියන්න. (*ගැසට් නිවේදනයේ ඇමුණුම 02 බලන්න.*)

| *ප්‍රධාන විෂයයේ නම* | *විෂය අංකය* |
|---|---|
| | |

| *අනු විෂයයේ නම* | *විෂය අංකය* |
|---|---|
| | |

6. සිංහල භාෂා විශේෂ ප්‍රශ්න පත්‍රයට පෙනී සිටින්නේ නම් අංක 001, මෙම කොටුව තුළ සඳහන් කරන්න.
(*ගැසට් නිවේදනයේ* 05 වැනි ඡේදය බලන්න.) [ ]

7. සමත් වී ඇති ප්‍රාරම්භ/මධ්‍යම/අවසාන විභාග පිළිබඳ විස්තර :

| | *ප්‍රාරම්භ* | *මධ්‍යම* | *අවසාන* |
|---|---|---|---|
| විභාග අංකය | | | |
| වර්ෂය | | | |

8. ඌන සාමාර්ථය සම්පූර්ණ කිරීමට මෙම විභාගයට ඉදිරිපත් වන්නේ නම් ඌන සාමාර්ථය ලැබූ විභාගය පිළිබඳ විස්තර :

1. වර්ෂය : [ ]
2. විභාග අංකය : [ ]
3. ඌන සාමාර්ථය ලත් * විභාගය : [ ]
4. ඌන සාමාර්ථය ලත් * අනු විෂයය : [ ] විෂයය අංකය : [ ]

(මෙහි ඇතුළත් ඇමුණුම 02 ලේඛනයේ සඳහන් විෂය අංකය ම සඳහන් කරන්න. ඌන සාමාර්ථය ලද ප්‍රතිඵල සටහනේ ඡායා පිටපතක් අමුණා එවිය යුතු ය.)

* ඌන සාමාර්ථයලත් අයදුම්කරුවන් යනු පසුගිය වර්ෂයේ පැවති ප්‍රායෝගික පරීක්ෂණයෙන් ප්‍රධාන විෂයය සමත් වී අනු විෂයය අසමත් වූ අයදුම්කරුවන් පමණක් වේ.

9. (*අ*) උපන් දිනය :

අවුරුද්ද : [ | | | ] මාසය : [ | ] දිනය : [ | ]

(*ආ*) 2014.04.30 වැනි දිනට වයස :

අවුරුදු : [ | | | ] මාස : [ | ] දින : [ | ]

(ප්‍රාරම්භ කොටසට පෙනී සිටින්නේ නම් පමණක් උප්පැන්න සහතිකයේ සහතික කරන ලද ඡායා පිටපතක් අමුණා එවිය යුතු ය.)

10. දුරකථන අංකය : [ | | | | | | | | | ]

11. ගෙවන ලද විභාග ගාස්තු : (වචනයෙන්) රු. ————.
(ඉලක්කමෙන් රු. ————. )
විභාග ගාස්තු ගෙවූ තැපැල්/උප තැපැල් කාර්යාලය :————.
තැපැල් කාර්යාලයෙන් නිකුත් කළ කුවිතාන්සි අංකය :————.
දිනය :————.
(මුද්දර හා මුදල් ඇණවුම් අලවා එවන අයදුම්පත් දැන්වීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ඇත.)

12. විභාග ගාස්තු තැපැල් කාර්යාලයට ගෙවා ලබාගත් රිසිට් පත නොගැලවෙන සේ එහි දාරයක් පහත කොටුවේ අලවන්න.

රිසිට් පත මෙහි අලවන්න.

(එහි අංකය සහ දිනය පැහැදිලිව සඳහන් ඡායා පිටපතක් ළඟ තබාගන්න.)

අයදුම්පතේ සඳහන් කරුණු සත්‍ය හා නිවැරදි බව ප්‍රකාශ කරමි. මෙම විභාගය සම්බන්ධව විභාග කොමසාරිස් ජනරාල් විසින් පනවනු ලබන නීති රීතිවලට මම එකඟ වෙමි.

—————,
අයදුම්කරුගේ අත්සන.

*අයදුම්කරුගේ අත්සන සහතික කිරීම*

ඉහත විස්තර දක්වා ඇති අයදුම්කරු ................................... දින මා ඉදිරිපිට දී මෙහි අත්සන් තබන ලද බව ද, ඔහුගේ/ඇයගේ ජාතික හැඳුනුම්පත් අංකය .............. බව ද, උප්පැන්න සහතිකයේ සඳහන් පරිදි ඔහුගේ/ඇයගේ උපන් දිනය ............................. බව ද, අයදුම්පත් භාර ගන්නා අවසාන දිනට වයස අවුරුදු 15ට වැඩි බව ද, සහතික කරමි. (උප්පැන්න සහතිකය බලන්න.)

අත්සන සහතික කරන අයගේ නම :—————.
තරාතිරම :—————.
(රබර් මුද්‍රාවකින් සනාථ කරන්න.)

ලිපිනය :—————.

දිනය :—————.

—————,
අත්සන සහතික කරන අයගේ අත්සන.

***සැලකිය යුතුයි*** - (අත්සන සහතික කිරීම අනුමත පාසලක ප්‍රධානියෙකු, ග්‍රාම නිලධාරියෙකු, සාමදාන විනිශ්චයකාරයෙකු, දිවුරුම් කොමසාරිස්වරයෙකු, නීතිඥවරයකු, ප්‍රසිද්ධ නොතාරිස් කෙනෙකු රජයේ හෝ පළාත් පාලන සේවාවක වාර්ෂිකව රුපියල් 2,40,360 හෝ ඊට වැඩි ඒකාබද්ධ වැටුපක් ලබන මාණ්ඩලික නිලධාරියකු හෝ පරිවේණාධිපති, විහාරාධිපති හෝ පූජ්‍ය ස්ථානයක් භාර ප්‍රධාන පූජකවරයෙකු විසින් හෝ සහතික කළ හැකිය.)

*ඇමුණුම 02*

**ජාතික සංගීත විභාගය - 2014 " M "**

සංගීත - විෂය ලේඛනය හා විෂය අංක

| *විෂය ලේඛනය* | *විෂය අංකය* | | |
|---|---|---|---|
| *(අ) ප්‍රධාන විෂයය* | *ප්‍රාරම්භ* | *මධ්‍යම* | *අවසාන* |
| ගායනය | 160 | 260 | 360 |
| ස්වර වාදනය | | | |
| වයලීන් | 171 | 271 | 371 |
| එස්රාජ් | 172 | 272 | 372 |
| සරෝද් | 174 | 274 | 374 |
| සිතාර් | 175 | 275 | 375 |
| බටනලා | 176 | 276 | 376 |
| සාරංගි | 177 | 277 | 377 |
| ගිටාර් | 178 | 278 | 378 |
| තාල වාදනය | | | |
| තබ්ලා | 190 | 290 | 390 |

(ආ) අනු විෂයය

| | | | |
|---|---|---|---|
| ගායනය | 161 | 261 | 361 |
| | ස්වර වාදනය | | |
| වයලීන් | 181 | 281 | 381 |
| එස්රාජ් | 182 | 282 | 382 |
| සරෝද් | 184 | 284 | 384 |
| සිතාර් | 185 | 285 | 385 |
| බටනලා | 186 | 286 | 386 |
| සාරංගි | 187 | 287 | 387 |
| ගිටාර් | 188 | 288 | 388 |
| | තාල වාදනය | | |
| තබ්ලා | 191 | 291 | 391 |
| සිංහල භාෂාව විශේෂ ප්‍රශ්න පත්‍රය | | 001 | |

* ප්‍රධාන විෂයය හා සමාන වන ලෙස අනුවිෂයය තෝරාගත නොහැකිය.

*උදා* :- (i) ප්‍රධාන විෂයය "ගායනය" හා අනුවිෂයය "ගායනය "
(ii) ප්‍රධාන විෂයය වාදනය "වයලීනය" හා අනුවිෂයය වාදනය "වයලීනය" ආදී වශයෙනි.

03-1024

---

**රාජ්‍ය සේවා කොමිෂන් සභාව**

ශ්‍රී ලංකා ගණකාධිකාරී සේවයේ III ශ්‍රේණියට බඳවා ගැනීමේ සීමිත/ විවෘත තරග විභාගය - 2014

මෙම නිවේදනයේ "සේවයේ" යන පදයෙන් ශ්‍රී ලංකා ගණකාධිකාරී සේවය (ශ්‍රී.ලං.ග.සේ.) අදහස් කෙරේ.

1. *විභාග දිනය* :

විභාග කොමසාරිස් ජනරාල් විසින් 2014 ජුනි මස කොළඹ දී හා යාපනයේ දී විභාගය පවත්වනු ඇත. මෙම විභාගය කල් දැමීමට හෝ අවලංගු කිරීමට හෝ රාජ්‍ය සේවා කොමිෂන් සභාවට බලය ඇත.

2. මෙම විභාගය මගින් සම්පූර්ණ කිරීමට අපේක්ෂා කරන පුරප්පාඩු ප්‍රමාණය පහත පරිදි වේ.
විවෘත - 62
සීමිත - 43

3. *බඳවා ගැනීමේ ක්‍රමය* :

පත්වීම සඳහා තෝරාගනු ලබන්නේ ලිඛිත පරීක්ෂණයේ එක් එක් විෂයෙන් ලකුණු 40% කට නොඅඩුව ලබා, මුළු ලකුණු වල කුසලතා අනුපිළිවෙල අනුව සුදුසුකම් පරීක්ෂා කිරීමේ පරීක්ෂණයට කැඳවා පත්වීම් සඳහා රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් පත්කරනු ලබන සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයක් මගින් සුදුසුකම් තිබේ දැයි පරීක්ෂා කිරීමෙන් අනතුරුවය.

3.1 මෙම තනතුර සඳහා පත්කරනු ලබන සංඛ්‍යාව හා පත්වීම් ක්‍රියාත්මක වන දිනය රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ නියෝගය අනුව තීරණය කරනු ලැබේ. කිසියම් පුරප්පාඩු සංඛ්‍යාවක් හෝ පුරප්පාඩු සියල්ල පිරවීමට හෝ රාජ්‍ය සේවා කොමිෂන් සභාවට බලය ඇත.

4. *සුදුසුකම්* :

4.1 විවෘත තරග විභාගය

(අ) *අධ්‍යාපන සුදුසුකම්* :

(i) විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයකින් වාණිජ්‍යය, කළමනාකරණ, ගණකාධිකරණ, ආර්ථික විද්‍යා යන විෂය ක්ෂේත්‍රයන්ට අදාළ උපාධියක් ලබා තිබීම ;

*හෝ*

(ii) ශ්‍රී ලංකා කාර්මික විද්‍යාලයේ/ශ්‍රී ලංකා උසස් කාර්මික අධ්‍යාපන ආයතනයේ ගණකාධිකරණය හෝ වාණිජ්‍යය පිළිබඳ උසස් ඩිප්ලෝමාලාභියකු විය යුතු ය ;

*හෝ*

(iii) ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනයේ හෝ වෙනත් යම් පොදු රාජ්‍ය මණ්ඩලයීය රටක වරලත් ගණකාධිකාරී ආයතනයක ආවසරික හෝ අන්තර් මාධ්‍ය පරීක්ෂණය හෝ ඊට වඩා ඉහළ පරීක්ෂණයකින් හෝ සමත් වී සිටිය යුතු ය ;

*හෝ*

(iv) එක්සත් රාජධානියේ හෝ වෙනත් යම් පොදු රාජ්‍ය මණ්ඩලයීය රටක වරලත් කළමනාකරණ ගණකාධිකාරීත්ව ආයතනයක් මගින් පවත්වන පිරිවැය සහ කළමනාකරණ පරීක්ෂණයේ I හා II වැනි කොටස් හෝ අන්තර් මාධ්‍ය පරීක්ෂණය හෝ ඊට වඩා ඉහළ පරීක්ෂණයකින් හෝ සමත් වී සිටිය යුතු ය ;

*හෝ*

(v) එක්සත් රාජධානියේ හෝ වෙනත් යම් පොදු රාජ්‍ය මණ්ඩලයීය රටක සහතිකලත් ගණකාධිකාරීවරුන්ගේ ගණකාධිකරණ ආයතනයේ I වැනි වෘත්තීය මට්ටමේ හෝ වඩා උසස් මට්ටමක පරීක්ෂණයකින් සමත් වී සිටිය යුතු ය ;

*හෝ*

(vi) එක්සත් රාජධානියේ හෝ වෙනත් යම් පොදු රාජ්‍ය මණ්ඩලයීය රටක සහතිකලත් ගණකාධිකාරීවරුන්ගේ වරලත් සංගමයේ I වැනි II වැනි කොටසට අයත් පරීක්ෂණය හෝ ඊට ඉහළ පරීක්ෂණයකින් සමත් වී සිටිය යුතු ය ;

*හෝ*

(vii) එක්සත් රාජධානියේ ලේකම්වරුන්ගේ හා පරිපාලකයින්ගේ වරලත් ආයතනයේ අවසාන පරීක්ෂණය.

(ආ) *කායික සුදුසුකම් :*

සෑම අපේක්ෂකයෙකුම ශ්‍රී ලංකාවේ ඕනෑම ප්‍රදේශයක සේවය සඳහා අන් සෑම අයුරකින්ම ශාරීරික වශයෙන් යෝග්‍ය විය යුතු ය.

(ඇ) *වෙනත් සුදුසුකම් :*

(i) ශ්‍රී ලංකාවේ පුරවැසියකු විය යුතුය.
(ii) අයදුම්කරුවන් විශිෂ්ට චරිතයකින් යුක්ත විය යුතු ය.
(iii) විවෘත තරග විභාගය සඳහා දෙවරකට වඩා පෙනී සිටීමට කිසිදු තැනැත්තකුට අවසර නොමැත.
(iv) යම් ආගමික නිකායක පැවිදිවරයක් දරණ කිසිදු තැනැත්තකු මෙම විභාගය සඳහා පෙනී සිටීමට සුදුසුකම් නොලබයි.
(v) සේවයට පත්කිරීම සඳහා වන තරග විභාගයට පෙනී සිටීම සඳහා අවශ්‍ය සුදුසුකම් සපුරා ඇති ලෙසට පිළිගනු ලැබීමට අයදුම්කරු, 5.1 (අ) ඡේදයෙහි සඳහන් සුදුසුකම් 2014.03.28 දිනට (නිවේදනය ගැසට් පත්‍රයේ පල කරන දිනට) සෑම ආකාරයකින්ම සම්පූර්ණ කර තිබිය යුතු ය.

(ඈ) *වයස :*

2014.03.28 දිනට (නිවේදනය ගැසට් පත්‍රයේ පල කරන දිනට) වයස අවුරුදු 22ට නොඅඩු විය යුතු අතර, අවුරුදු 28ට නොවැඩි විය යුතු ය.

4.2 සීමිත තරග විභාගය

(අ) *පළපුරුද්ද සඳහා වූ සුදුසුකම් :*

(i) ඉහත 5.1 (අ) ඡේදයෙහි දැක්වෙන කවර හෝ සුදුසුකමක් සහිතව 2014.03.28 දිනට (නිවේදනය ගැසට් පත්‍රයේ පළ කරන දිනට) රජයේ/පළාත් රාජ්‍ය සේවයේ වසර 05කට නොඅඩු සතුටුදායක, අඛණ්ඩ, ස්ථිර සේවා කාලයක් සහිත අදාල දිනට අවම වශයෙන් වැටුප් වර්ධක 05ක් උපයාගෙන තිබීම ;

*හෝ*

(ii) රජයේ හෝ පළාත් රාජ්‍ය සේවයේ ස්ථිර විශ්‍රාම වැටුප් සහිත MN 1-2006(ඒ) දරණ වැටුප් පරිමාණය හෝ ඊට ඉහළ වැටුප් පරිමාණයක් හිමි තනතුරක වසර 10කට නොඅඩු සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම හා අදාල දිනට වැටුප් වර්ධක 10ක් අවම වශයෙන් උපයා ගෙන තිබීම.

(ආ) *කායික සුදුසුකම් :*

සෑම අපේක්ෂකයකුම ශ්‍රී ලංකාවේ ඕනෑම ප්‍රදේශයක සේවය සඳහා අන් සෑම අයුරකින්ම ශාරීරික වශයෙන් යෝග්‍ය විය යුතුය.

(ඇ) *වෙනත් සුදුසුකම් :*

(i) අයදුම්කරුවන් විශිෂ්ඨ චරිතයකින් යුක්ත විය යුතු ය.

(ii) අයදුම්කිරීමට සුදුසුකම් ලැබීමට පූර්වාසන්නයෙන් වූ වසර පහක කාලසීමාව තුළ නියමිත දිනයන්හි සියළුම වැටුප් වර්ධක උපයාගෙන තිබීම.

(iii) 2014.03.28 දිනට (නිවේදනය ගැසට් පත්‍රයේ පල කරන දිනට) පූර්වාසන්නයෙන් වූ වසර පහක කාලසීමාව තුළ සතුටුදායක සේවා කාලයක් තිබීම.

(iv) සීමිත තරග විභාගය සඳහා දෙවරකට වඩා පෙනී සිටීමට කිසිදු තැනැත්තකුට අවසර නොමැත.

(v) යම් ආගමික නිකායක පැවිදිවරයක් දරණ කිසිදු තැනැත්තකු මෙම විභාගය සඳහා පෙනී සිටීමට සුදුසුකම් නොලබයි.

(vi) සේවයට පත්කිරීම සඳහා වන තරග විභාගයට පෙනී සිටීම සඳහා අවශ්‍ය සුදුසුකම් සපුරා ඇති ලෙසට පිළිගනු ලැබීමට අයදුම්කරු, 5.2 (අ) ඡේදයෙහි සඳහන් සුදුසුකම් 2014.03.28 දිනට (නිවේදනය ගැසට් පත්‍රයේ පළ කරන දිනට) සෑම ආකාරයකින්ම සම්පූර්ණ කර තිබිය යුතු ය.

5. *සේවා කොන්දේසි :*

රජයේ සේවයේ පත්වීම් පාලනය කෙරෙන පොදු කොන්දේසිවලට ද, අංක 1670/33 සහ 2010 සැප්තැම්බර් 10 දින දරණ ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද ශ්‍රී ලංකා ගණකාධිකාරී සේවා ව්‍යවස්ථා සංග්‍රහයේ පනවා ඇති කොන්දේසිවලට ද, එම ව්‍යවස්ථාවට කර ඇති හෝ මින් මතු කෙරෙන සංශෝධනවලට ද යටත්ව තෝරා ගනු ලබන අපේක්ෂකයකු ශ්‍රී ලංකා ගණකාධිකාරී සේවයේ I II ශ්‍රේණියට පත් කරනු ලැබේ.

(අ) මෙම පත්වීම ස්ථිරය. විශ්‍රාම වැටුප් සහිතය. තවද ඔබ වැන්දඹු හා අනත්දරු විශ්‍රාම වැටුප් ක්‍රමයට/වැන්දඹු පුරුෂ හා අනත්දරු විශ්‍රාම වැටුප් ක්‍රමයට දායක විය යුතු ය;

(ආ) බඳවා ගන්නා නිලධාරීන් ශ්‍රී ලංකා ගණකාධිකාරී සේවයේ නිලධාරීන් සඳහා වූ 1 වැනි කාර්යක්ෂමතා කඩඉම් විභාගය පත්වීම් දින සිට වසර 03 ක් ඇතුළත සමත්විය යුතු ය.

(ඇ) රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 07/2007 අනුව හා ඊට ආනුශාංගික චක්‍රලේඛ අනුව තනතුරට බැඳී වසර 05 ක් ඇතුළත සේවාවට බැඳුණ භාෂාවට අතිරේකව අනෙක් රාජ්‍ය භාෂාව පිළිබඳ අදාළ ප්‍රවීණතාව ලබා ගත යුතු අතර රාජ්‍ය භාෂාවක් නොවන භාෂා මාධ්‍යයකින් සේවයට බැඳුණ නිලධාරීන් විසින් පරිවාස කාලය තුළ නියමිත රාජ්‍ය භාෂා ප්‍රවීනතාවය ලබාගත යුතුය.

6. *වැටුප හා මාසික වැටුප් පරිමාණය :*

2006.04.25 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 06/2006 හි එස්.එල්.1-2006 වැටුප් කාණ්ඩය අනුව,
මාසික වැටුප් පරිමාණය :

SL 1-2006 - රු.22,935 - 10 x 645 - 8 x 790 - 17 x 1,050 - රු.53,555/-

7. *විභාග ගාස්තු*

විවෘත තරග විභාගයට ගාස්තුව රු.1000/-කි. සීමිත තරග විභාග ගාස්තුව රු.1000/-කි. අපේක්ෂකයෙකු විභාග දෙකටම ඉල්ලුම් කළහොත් ගාස්තුව රු.1500/-කි. මෙම ගාස්තුව විභාග ඉල්ලුම් පත්‍ර භාර ගන්නා අවසාන දිනට පළමුව ආදායම් ශීර්ෂ 2003-02-13 යනුවෙන් බැර කිරීම සඳහා ප්‍රාදේශීය ලේකම් කාර්යාලයකට ගෙවිය යුතුය. ප්‍රාදේශීය ලේකම් කාර්යාලයෙන් ලබා ගන්නා ලදුපත ඉල්ලුම් පත්‍රයේ අදාල කොටුවෙහි ඇලවිය යුතුය. ලදුපතෙහි ඡායාපිටපතක් අයදුම්කරුවන් විසින් තමන් ලඟ තබා ගැනීම ඉතාම යෝග්‍ය වේ. මෙම විභාග ගාස්තු කිසිම හේතුවක් මත ආපසු ගෙවනු නොලැබේ.

8. *ඉල්ලුම් කිරීමේ ක්‍රමය :*

(අ) ඉල්ලුම්පත්‍රය මෙම නිවේදනයට යාකොට ඇති ආදර්ශ ආකෘතියට අනුකූලව කඩදාසියේ දෙපැත්තම පාවිච්චි කරමින් ඒ-4 ප්‍රමාණයේ කඩදාසියක පිළියෙල කර අපේක්ෂකයා විසින්ම පිරවිය යුතුය.

(ආ) ඉල්ලුම්පත්‍රයේ අංක 01 සිට 03 තෙක් මුල් පිටුවේ සඳහන් කළ යුතුය. ඉල්ලුම්පත්‍රය අපේක්ෂකයා විභාගයට පෙනී සිටීමට සුදුසුකම් ඇති භාෂාවෙන්ම පිරවිය යුතුය. කෙසේ වෙතත් ඉල්ලුම්පත්‍රය සකස් කරනවිට එහි ශීර්ෂය ඉංග්‍රීසි භාෂාවෙන් ද (ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්) සඳහන් කිරීම අත්‍යාවශ්‍ය වේ. (12 ඡේදය බලන්න)

(ඇ) විවෘත තරග විභාගය සඳහා වූ ඉල්ලුම්පත්‍ර ලියාපදිංචි තැපෑලෙන් 2014.04.28 වැනි දින හෝ ඊට පෙර හෝ ලැබෙන පිණිස **විභාග කොමසාරිස් ජනරාල්, සංවිධාන හා විදේශ විභාග ශාඛාව, ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව, පැලවත්ත, බත්තරමුල්ල** ලිපිනයට එවිය යුතුය. ඉල්ලුම්පත්‍රය බහා ඇති කවරයේ වමත් පස ඉහළ කෙලවරේ "විවෘත තරග විභාගය, ගණකාධිකාරී" යනුවෙන් පැහැදිලි ලෙස ලිවිය යුතුය. මෙදිනට පසුව ලැබෙන කිසිම ඉල්ලුම්පත්‍රයක් භාරගනු නොලැබේ.

සටහන : රජයේ සේවයේ/පළාත් රාජ්‍ය සේවයේ නියුක්ත, විවෘත තරග විභාගයට පෙනී සිටින ඉල්ලුම්කරුවන් ස්වකීය ඉල්ලුම්පත්‍ර තම දෙපාර්තමේන්තු ප්‍රධානීන්/ආයතන ප්‍රධානීන් මාර්ගයෙන් ඉදිරිපත් කළ යුතුය.

(ඈ) සීමිත තරග විභාගය සඳහා වූ ඉල්ලුම්පත්‍ර දෙපාර්තමේන්තු ප්‍රධානීන් මාර්ගයෙන් ලියාපදිංචි තැපෑලෙන් 2014.04.28 වැනි දින හෝ ඊට පෙර හෝ ලැබෙන පිණිස **විභාග කොමසාරිස් ජනරාල්, සංවිධාන හා විදේශ විභාග ශාඛාව, ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව, පැලවත්ත, බත්තරමුල්ල** ලිපිනයට එවිය යුතුය. ඉල්ලුම්පත්‍රය බහා ඇති කවරයේ වමත් පස ඉහළ කෙලවරේ " සීමිත තරග විභාගය, ගණකාධිකාරී" යනුවෙන් පැහැදිලි ලෙස ලිවිය යුතුය. මෙදිනට පසුව ලැබෙන කිසිම ඉල්ලුම්පත්‍රයක් භාරගනු නොලැබේ.

සීමිත හා විවෘත තරග විභාග දෙකටම පෙනී සිටින්නේ නම් ලිපි කවරයේ වමත් පස ඉහළ කෙලවරේ "සීමිත/විවෘත තරග විභාගය, ගණකාධිකාරී" යනුවෙන් සඳහන් කළ යුතුය.

(ඉ) විභාගය ඉල්ලුම්කරන අවස්ථාව වන විට පැවති අයැදුම්කරුවන්ගේ තනතුර සහ සේවා ස්ථානය, විභාගය සම්බන්ධ සියලු කටයුතු සඳහා අදාළ වන අතර, අයැදුම්පත් එවීමෙන් පසුව ඒ සම්බන්ධව සිදුවන වෙනස්වීම් කිසිවක් පිළිබඳව සලකනු නොලැබේ.

(ඊ) අයැදුම්කරුවන් වෙත ප්‍රවේශ පත්‍ර නිකුත් කළ වහාම ඒ බව සඳහන් කරමින් පුවත්පත් නිවේදනයක් ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව මගින් පළ කරනු ඇත. නිවේදනය පළ වී දින 2 ක් හෝ 3ක් ගත වූ පසුවත් ප්‍රවේශ පත්‍රය නොලැබුණි නම් එහි සඳහන් ආකාරයට ඒ බව ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව වෙත දන්වා සිටිය යුතුයි. එහිදී අයදුම්කරුගේ සම්පූර්ණ නම, ලිපිනය, ජාතික හැඳුනුම්පත් අංකය හා විභාගයේ නම සඳහන් කළ යුතු අතර එසේ විමසන අවස්ථාවේ අයදුම්කරු විසින් ළඟ තබාගත් අයදුම්පත්‍රයේ පිටපත, මුදල් ගෙවීමෙන් ලද කුවිතාන්සියේ පිටපත හා ඉල්ලුම්පත්‍රය තැපැල් කිරීමේදී ලියාපදිංචි කරන ලද කුවිතාන්සිය අතැතිව සිටීම වැදගත් වේ. කොළඹින් බැහැර අයදුම්කරුවෙකු නම් ෆැක්ස් මගින් ප්‍රවේශ පත්‍රයේ පිටපතක් ලබා ගැනීම සඳහා ඔබගේ ෆැක්ස් අංකයක් හා ඉහත දක්වා ඇති තොරතුරු ද සඳහන් කරන ලද ඉල්ලීම් ලිපියක් ෆැක්ස් මගින් විභාග දෙපාර්තමේන්තුව වෙත යොමු කරමින් විමසා සිටීම ද ප්‍රතිඵලදායි වනු ඇත.

9. *විභාගයට ඇතුළත්වීම :*

(අ) අදාල විභාග ගාස්තු ගෙවා, නිසි ලෙස ඉල්ලුම්පත් සම්පූර්ණ කර, නියමිත දිනට පෙර එවා ඇති සියලුම ඉල්ලුම්කරුවන් වෙත විභාග කොමසාරිස් ජනරාල් විසින් ප්‍රවේශ පත්‍ර නිකුත් කරනු ඇත. විභාගයට පෙනී සිටින අපේක්ෂකයෙකු නිසි පරිදි අත්සන සහතික කළ තම ප්‍රවේශ පත්‍රය විභාග ශාලාධිපතිට ඉදිරිපත් කළ යුතුය. තම ප්‍රවේශ පත්‍රය ඉදිරිපත් නොකරන අපේක්ෂකයෙකුට විභාගයට පෙනී සිටීමට අවසර දෙනු නොලැබේ.

(ආ) අපේක්ෂකයෙකු තමාට නියම කර ඇති විභාග ශාලාවේදී විභාගයට පෙනී සිටිය යුතු අතර, සෑම අපේක්ෂකයෙකුම නියමිත විභාග ශාලාවට අදාල ප්‍රවේශ පත්‍රය පළමුවෙන් එම ශාලාවේදී පෙනී සිටින දින එහි ශාලාධිපතිට භාර දිය යුතුය. සෑම අපේක්ෂකයෙකුම අනුගමනය කළ යුතු නීති මාලාවක් මෙම ගැසට් පත්‍රයේ පළ කර ඇත.

(ඇ) අපේක්ෂකයෙකුට ප්‍රවේශ පත්‍රයක් නිකුත් කිරීම, ඔහු හෝ ඇය විභාගයට ඉදිරිපත්වීමට සුදුසුකමක් සපුරා ඇති බවට පිළිගැනීමක් ලෙස නොසැලකිය යුතුය.

(ඈ) විභාගය පැවැත්වීම සම්බන්ධයෙන් විභාග කොමසාරිස් ජනරාල් විසින් නියම කරන ලද නීතිරීතිවලට විභාග අපේක්ෂකයින් යටත්වේ. එම නීතිරීති උල්ලංඝනය කළහොත් විභාග කොමසාරිස් ජනරාල් විසින් පනවනු ලබන දඬුවමකට යටත් වීමට ඔවුනට සිදු වනු ඇත.

10. *අපේක්ෂකයාගේ අනන්‍යතාව :*

තමා පෙනී සිටින සෑම විෂයයක් සම්බන්ධයෙන්ම විභාග ශාලාධිපති සෑහීමට පත්වන අයුරින් අපේක්ෂකයෙකු විභාග ශාලාවේදී තම අනන්‍යතාව ඔප්පු කර සිටිය යුතුය. මේ සඳහා පහත සඳහන් ලේඛනවලින් එකක් පමණක් පිළිගනු ඇත. :-

(අ) පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුව මගින් නිකුත් කර ඇති ජාතික හැඳුනුම්පත,

(ආ) ආගමන හා විගමන දෙපාර්තමේන්තුව විසින් නිකුත් කරන ලද වලංගු විදේශ ගමන් බලපත්‍රය,

අයදුම්කරුවන්ගේ කාර්යාලයීය හැඳුනුම්පත් පිළිගනු නොලැබේ.

11. *සාවද්‍ය තොරතුරු සැපයීම :*

අපේක්ෂකයෙකු සුදුසුකම් නොමැති බව අනාවරණය වුවහොත්, විභාගයට පෙර හෝ විභාගය පවත්වන කාලයේදී හෝ විභාගයෙන් පසුව හෝ ඕනෑම අවස්ථාවකදී ඔහුගේ අපේක්ෂකත්වය අවලංගු කිරීමට ඉඩ ඇත. අපේක්ෂකයෙකු ඉදිරිපත් කර ඇති කිසියම් කරුණක්, ඔහු එය සාවද්‍ය බව දැන දැනම ඉදිරිපත් කර ඇති බව හෙළි වුවහොත්, එසේ නැතිනම් යම් වැදගත් කරුණක් ඔහු ඕනෑකමින් යටපත් කර ඇති නම්, ඔහු රජයේ සේවයෙන් පහ කිරීමට ඉඩ ඇත.

12. මෙම රෙගුලාසිවල සලසා නොමැති කරුණු පිළිබඳව රාජ්‍ය සේවා කොමිෂන් සභාව තීරණය කරන පරිදි කටයුතු කෙරෙනු ඇත.

13. *විභාග ක්‍රමය :*

විභාග මාධ්‍යය :

(අ) විභාගය සිංහල, දෙමළ හා ඉංග්‍රීසි භාෂාවන්ගෙන් පවත්වනු ලැබේ.

(ආ) අපේක්ෂකයින් කැමති එක් භාෂාවකින් විභාගයට පෙනී සිටිය හැකිය.

*සටහන :*

(i) අපේක්ෂකයින් මෙම විභාගයේ සියළුම ප්‍රශ්න පත්‍රවලට පෙනී සිටිය යුත්තේ එක් භාෂාවකින් පමණි.

(ii) අපේක්ෂකයෙකුට ස්වකීය අයදුම්පතෙහි දැක්වෙන විභාග මාධ්‍ය වෙනස් කිරීමට අවසර දෙනු නොලැබේ.

14. *පරීක්ෂා කිරීමේ ක්‍රමය :*

(අ) පහත සඳහන් විෂයයන්ගෙන් සමන්විත ලිඛිත විභාගයක් : මෙම ප්‍රශ්න පත්‍ර සියල්ලම අනිවාර්ය ප්‍රශ්නවලින් සමන්විත වේ. ප්‍රශ්න සියල්ලටම පිළිතුරු සැපයීම අනිවාර්ය වේ.

1. මූල්‍ය ගණකාධිකරණය - I වන පත්‍රය - කාලය පැය 03යි - ලකුණු 100
2. මූල්‍ය ගණකාධිකරණය - II වන පත්‍රය - කාලය පැය 03යි - ලකුණු 100
3. පිරිවැය හා කළමනාකරණ ගණකාධිකරණය - කාලය පැය 03යි - ලකුණු 100
4. රාජ්‍ය මූල්‍ය කළමනාකරණය - කාලය පැය 03යි - ලකුණු 100
5. විගණනය හා විමර්ශනය - කාලය පැය 03යි - ලකුණු 100
6. සාමාන්‍ය බුද්ධිය හා අවබෝධය - කාලය පැය 03යි - ලකුණු 100

විෂය නිර්දේශයන් මෙම නිවේදනය අවසානයේ දැක්වේ.

(ආ) *සම්මුඛ පරීක්ෂණය :*

ලිඛිත ප්‍රශ්නපත්‍රවලින් එක් එක් විෂය සඳහා අවම වශයෙන් 40% ක ප්‍රතිශතයක් ලබා ඇත්තා වූ අපේක්ෂකයින් පමණක් සම්මුඛ පරීක්ෂණයට කැඳවනු ලැබේ. සම්මුඛ පරීක්ෂණය සඳහා කැඳවිය යුතු අයදුම්කරුවන් සංඛ්‍යාව, අවස්ථාවෝචිත පරිදි ලිඛිත විභාගයේදී ලබා ගත් ලකුණුවල කුසලතා අනුපිළිවෙල හා අදාල පුරප්පාඩු සංඛ්‍යාව අනුව රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් තීරණය කරනු ලැබේ. ලිඛිත විභාගයේ ප්‍රතිඵල සියලු අයදුම්කරුවන් වෙත දන්වා යැවීම රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ උපදෙස් පරිදි විභාග කොමසාරිස් ජනරාල් මගින් සිදු කෙරේ.

15. සිංහල, දෙමළ හා ඉංග්‍රීසි මාධ්‍යවලින් පළකරනු ලබන මෙම දැන්වීමෙහි එක් එක් භාෂාවලින් පළකිරීමේදී යම් නොගැලපීමක් ඇතිවුවහොත් සිංහල මාධ්‍යයෙන් පළ කරන ලද දැන්වීම බලාත්මක වේ.

16. *පත් කිරීම පිණිස තෝරා ගැනීමේ ක්‍රමය :*

විවෘත හා සීමිත තරග විභාගවලට ලිඛිත පරීක්ෂණවලින් ඉහළම ලකුණු ලබා ගෙන ඇති කුසලතා අනුපිළිවෙල අනුව හා සම්මුඛ පරීක්ෂණයේදී මූලික සුදුසුකම් සපුරා ඇති බවට තහවුරු කෙරෙන අයදුම්කරුවන් තෝරා ගනු ලැබේ. සම්මුඛ පරීක්ෂණය සඳහා ලකුණු දෙනු නොලැබේ. අපේක්ෂකයින් කිහිප දෙනෙකුට එකම ලකුණු ලැබී ඇත්නම් තෝරා ගැනීම පිළිබඳ අවසාන තීරණය රාජ්‍ය සේවා කොමිෂන් සභාව සතුවේ.

රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ නියමය පරිදි,

ආචාර්ය බී.එම්.එස්. බටගොඩ,
භාණ්ඩාගාරයේ නියෝජ්‍ය ලේකම්.

මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යාංශය,
කොළඹ 01.

අයදුම්පත

*ශ්‍රී ලංකා ගණකාධිකාරී සේවයේ III ශ්‍රේණියේ තනතුරු සඳහා බඳවා ගැනීමේ සීමිත/විවෘත තරග විභාගය - 2014*

OPEN/LIMITED COMPETITIVE EXAMINATION FOR RECRUITMENT TO GRADE III OF THE SRI LANKA ACCOUNTANTS' SERVICE - 2014

| විභාග අංකය : (කාර්යාලයීය ප්‍රයෝජනය සඳහා) | |
|---|---|
| *විභාගයට පෙනී සිටින නගරය* | *එම නගර අංකය* |
| | |

ඉල්ලුම්කරු විභාගයට පෙනී සිටීමට අපේක්ෂා කරන නගරය හා නගර අංකය සඳහන් කරන්න. (කොළඹ - 1, යාපනය - 2)

* නගරය පසුව වෙනස් කිරීමට ඉඩ දෙනු නොලැබේ.

විභාගයට පෙනී සිටින මාධ්‍යය :

සිංහල - 2 , දෙමළ - 3, ඉංග්‍රීසි - 4 [ ]

(අදාල අංකය කොටුව තුළ ලියන්න)

* විභාග මාධ්‍යය පසුව වෙනස් කිරීමට ඉඩ දෙනු නොලැබේ.

ඔබ අයදුම් කරන්නේ විවෘත විභාගයටද/සීමිත විභාගයටද නැතහොත් දෙකටමද යන වග [ ]

සීමිත - 1, විවෘත -2, දෙකටම -3

(අදාල අංකය කොටුව තුළ ලියන්න)

* අයදුම්කරන විභාගය පසුව වෙනස් කිරීමට ඉඩදෙනු නොලැබේ.

1.0 නම : 1.1 මුලකුරු සමග නම : Mr./Mrs./Miss.:———.
(ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්) :————.
*උදා :* Mr. SILVA, A. B.

1.2 සම්පූර්ණ නම :————.
(ඉංග්‍රීසි කැපිටල් අකුරින්)

1.3 සම්පූර්ණ නම :————.
(සිංහලෙන්/දෙමළෙන්)

1.4 ජාතික හැඳුනුම්පත් අංකය : [ | | | | | | | | | ]

2.0 ස්ථිර ලිපිනය :————.
(ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්)

2.1 ස්ථිර ලිපිනය :————.
(සිංහලෙන්/දෙමළෙන්)

2.2 රාජකාරී ලිපිනය :————.
(ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්)

2.3 රාජකාරී ලිපිනය :————.
(සිංහලෙන්/දෙමළෙන්)

2.4 ප්‍රවේශ පත්‍ර එවිය යුතු ලිපිනය (ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්) :————.
(රජයේ සේවයේ/පළාත් රාජ්‍ය සේවයේ නියුක්ත නිලධාරියෙකු ඔහුගේ රාජකාරී ලිපිනය ලිවිය යුතුයි. ලිපිනයෙහි වෙනසක් වුනි නම්, එය වහාම දැන්විය යුතු ය.)

3.0 3.1 ස්ත්‍රී/පුරුෂ භාවය : ස්ත්‍රී - 1, පුරුෂ - 2 [ ]
(අදාල අංකය ලියන්න)

3.2 විවාහක/අවිවාහක බව : විවාහක - 1, අවිවාහක - 2 [ ]
(අදාල අංකය ලියන්න)

3.3 උපන් දිනය :

වර්ෂය : [ | | | ] මාසය : [ | ] දිනය : [ | ]

3.4 2014.03.28 වැනි දිනට වයස :
(අයදුම්පත්‍රය ගැසට් පත්‍රයේ පළ කරන දිනට)

අවුරුදු : [ | ] මාස [ : | ] දින : [ | ]

4.0 (විවෘත තරග විභාගයට පෙනී සිටින අපේක්ෂකයින් විසින් පිරවීම සඳහාය) පහත විස්තර සපයන්න.-

4.1 නිවේදනයේ 5.1 ඡේදය යටතේ මෙම විභාගයට පෙනී සිටීමට සුදුස්සෙකු වීම පිණිස ලැබූ සුදුසුකම් :————.

4.2 එම සුදුසුකම් ලබා ගත් ආයතන :————.

5.0 (සීමිත තරග විභාගයට පෙනී සිටින අපේක්ෂකයින් විසින් පිරවීම සඳහාය) පහත විස්තර සපයන්න.-

5.1 නිවේදනයේ 5.2 ඡේදය යටතේ මෙම විභාගයට පෙනී සිටීමට සුදුස්සෙකු වීම පිණිස ලැබූ සුදුසුකම් :————.

5.2 එම සුදුසුකම් ලබා ගත් ආයතන :

(අ)

| *සේවය කර ඇති දෙපාර්තමේන්තුව* | *තනතුර* | *සිට* | *දක්වා* | *කාල සීමාව* |
|---|---|---|---|---|
| | | | | |

(ආ) (i) සේවය/තනතුර :————.
(ii) පන්තිය :————. වැනි දින සිට
(iii) පන්තිය :————. වැනි දින සිට

(iv) 2014.03.28 වැනි දිනට (නිවේදනය ගැසට් පත්‍රයේ පළ කරන දිනට) රජය යටතේ මුළු සේවා කාලය :

අවුරුදු :————. මාස :————.

(අ) ඉහත ii හි සේවය : අවුරුදු :———. මාස :———.

(ආ) ඉහත iii හි සේවය : අවුරුදු :———. මාස :———.

(v) 2014.03.28 දිනට (නිවේදනය ගැසට් පත්‍රයේ පළ කරන දිනට) වාර්ෂික වැටුප : ........................

6.0 6.1 ශ්‍රී ලංකා ගණකාධිකාරී සේවයට බඳවා ගැනීම සඳහා වන සීමිත තරඟ විභාගයට ඔබ පෙනී සිටි වර්ෂ:

1. ————.
2. ————.
3. .————.

6.2 ශ්‍රී ලංකා ගණකාධිකාරී සේවයට බඳවා ගැනීම සඳහා වන විවෘත තරඟ විභාගයට ඔබ පෙනී සිටි වර්ෂ:

1. ————.
2. ————.
3. ————.

7.0 මුදල් කුවිතාන්සිය නොගැලවෙන ලෙස අයදුම්පතට අලවන්න.

කුවිතාන්සිය ඇලවීම සඳහා

(i.) ගෙවන ලද මුදල : රුපියල් :——. (iii) ලදුපත් අංකය :——.

(ii) මුදල් ගෙවූ ස්ථානය :————. (iv) මුදල් ගෙවූ දිනය:————.

8.0 අයදුම්කරුගේ සහතිකය :

8.1 මෙහි සඳහන් කර ඇති තොරතුරු මගේ දැනීමේ හා විශ්වාසය පරිදි සත්‍ය බවත්, විභාග ගාස්තුව ගෙවන ලද අංක .............................. හා ............................. දින දරන මුදල් කුවිතාන්සිය මීට අමුණා ඇති බවත්, ප්‍රකාශ කරමි. තව ද, විභාග නීතිරීති අනුව ක්‍රියා කිරීමටත්, මෙම විභාගය පිළිබඳ කොන්දේසි අනුව මා නුසුදුස්සෙකු බව පෙනී ගියහොත් විභාගයට පෙර හෝ එය පවත්වද්දී හෝ ඉන් පසු හෝ මගේ අපේක්ෂකත්වය අවලංගු කිරීමට ගනු ලබන යම් තීරණයකටත් මම එකඟ වෙමි.

8.2 2014.03.28 වැනි දිනට (නිවේදනය ගැසට් පත්‍රයේ පළ කරන දිනට) පූර්වාසන්නයෙන් වූ පස් අවුරුද්දක් තුළ (සේවා හෝ දෙපාර්තමේන්තුමය පරීක්ෂණ සමත්වීම කොන්දේසියක් වන වේතනාධිකය හැර) වේතනාධික සියල්ල මා විසින් උපයා ගෙන ඇති බවත්, (අවවාද කිරීම හැර) මොනම ආකාරයක හෝ විනයානුකූල දඬුවමකට මා භාජනය වී නොමැති බවත් මම ප්‍රකාශ කරමි.

————,
අයදුම්කරුගේ අත්සන.

දිනය :————.

90. 9.1 *දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ සහතිකය* : (සීමිත තරඟ විභාගයට පෙනී සිටින සියලුම අයදුම්කරුවන් හා අදාළ වන විට පමණක් විවෘත තරඟ විභාගයට පෙනී සිටින අයදුම්කරුවන් විසින් සම්පූර්ණ කළ යුතුය.) තමන්ගේ පෞද්ගලික ලිපිගොනු පවත්වාගෙන යන කාර්යාලයේ ප්‍රධානියා ආයතන ප්‍රධානියා වශයෙන් අත්සන් කළ යුතුය.

මෙම ඉල්ලුම්පත්‍රය ඉදිරිපත් කරන ..................................................... නැමැති අයදුම්කරු ................................. වැනි දින සිට මෙම කාර්යාලයේ සේවය කරන බවත්, ඔහුගේ/ඇයගේ වැඩ සහ හැසිරීම නිරන්තරයෙන්ම සතුටුදායක බවත්, ඉහත 06 හි සඳහන් කර ඇති සියල්ලම මෙම කාර්යාලයේ ඇති වාර්තා ආශ්‍රයෙන් මම පුද්ගලිකව පරීක්ෂා කර බැලූ බවත්, ඒවා නිවැරදි බවත්, නියමිත විභාග ගාස්තුව ගෙවා ඇති බවත්, එම ලදුපත අලවා ඇති බවත්, 2014 ........................... මස .............. වැනි දින ඔහු/ඇය මා ඉදිරිපිටදී අත්සන් කළ බවත් මෙයින් සහතික කරමි.

————,
දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ අත්සන.

දිනය :————.

සහතික කරන අයගේ සම්පූර්ණ නම :————.
පදවිය :————.
ලිපිනය :————. (රබර් මුද්‍රාවකින් සනාථ කරන්න)

9.2 සහතික කිරීම.— (විවෘත තරඟ විභාගය සඳහා පෙනී සිටින අයදුම්කරුවන් විසින් අදාළ වන විටදී පමණක් සම්පූර්ණ කළ යුතුය.)

මෙම ඉල්ලුම්පත්‍රය ඉදිරිපත් කරන ............................................................. නැමැති අයදුම්කරු මා පෞද්ගලිකව දන්නා හඳුනන බවත්, ඔහු/ඇය මා ඉදිරිපිටදී මෙහි අත්සන තැබූ බවත් සහතික කරමි.

————,
සහතික කරන අයගේ අත්සන හා මුද්‍රාව.

සහතික කරන අයගේ සම්පූර්ණ නම :————.
තනතුර :————.
ලිපිනය :————.
දිනය :————.

*සටහන.*—සහතික කරන අය සමාදාන විනිශ්චයකාරවරයෙකු, දිවුරුම් කොමසාරිස්වරයකු, නීතිඥයෙකු, නොතාරිස්වරයෙකු හෝ වසරකට රු.2,30,700/-කට නොඅඩු ඒකාබද්ධ වැටුපක් ලබන රජයේ නිලධාරියෙකු විය යුතුය.

### 1 වැනි පරිශිෂ්ඨය

ශ්‍රී ලංකා ගණකාධිකාරී සේවයේ III ශ්‍රේණියේ පත් කිරීම් සඳහා පවත්වනු ලබන විවෘත/සීමිත තරඟ විභාගයේ විෂය නිර්දේශ පිළිබඳ විස්තර :

මෙම විභාගය පහත සඳහන් ප්‍රශ්න පත්‍රවලින් සමන්විත වේ.

| *අංකය* | *විෂයයන්* | *උපරිම ලකුණු ප්‍රමාණය* | *සමත් ලකුණු ප්‍රමාණය* | *කාලය* |
|---|---|---|---|---|
| 1 | මූල්‍ය ගණකාධිකරණය - I | 100 | 40 | පැය 03 යි. |
| 2 | මූල්‍ය ගණකාධිකරණය - II | 100 | 40 | පැය 03 යි. |
| 3 | පිරිවැය සහ කළමනාකරණ ගණකාධිකරණය | 100 | 40 | පැය 03 යි. |
| 4 | රාජ්‍ය මූල්‍ය කළමනාකරණය | 100 | 40 | පැය 03 යි. |
| 5 | විගණනය හා විමර්ශනය | 100 | 40 | පැය 03 යි. |
| 6 | සාමාන්‍ය බුද්ධිය හා අවබෝධය | 100 | 40 | පැය 03 යි. |

*විෂයය නිර්දේශයන්* :

විෂයය අංක 01 හා 02 - මූල්‍ය ගණකාධිකරණය I හා II

මූල්‍ය ගණකාධිකරණයේ අභිප්‍රාය සහ
ගිණුම් භාවිතා කරන්නන් හා ඔවුන්ට අවශ්‍ය වන තොරතුරු

ගිණුම්කරණ පිළිවෙත

ගිණුම් සමීකරණය, ද්විත්ව සටහන් පොත් තැබීම හා ගිණුම් ක්‍රම, මූලික සටහන් පොත් හා ලෙජර්, ශේෂ පිරික්සුම, සමුච්චිත පූර්ව ගෙවීම් හා ගැලපුම්, ප්‍රාග්ධන හා ආදායම් වියදම්, ක්ෂය වීම්, අවිනිශ්චිත ගිණුම් හා වරද නිවැරදි කිරීම, පාලන ගිණුම්, සැසඳුම් ප්‍රකාශන, අසම්පූර්ණ වාර්තා

*අවසාන ගිණුම් :*

නිෂ්පාදන ගිණුම්, වෙළඳ ලාභලාභ ගිණුම්, ශේෂ පත්‍රය, අරමුදල් ගැලීම් ප්‍රකාශනය සහ විසර්ජන ගිණුම

*හවුල් ව්‍යාපාර ගිණුම් :*

හවුල් ව්‍යාපාර ගිවිසුම්, හවුල් ව්‍යාපාර හා සම්බන්ධ පොත් තැබීම පිළිබඳ කරුණු, ස්ථාවර ප්‍රාග්ධන ගිණුම්, ජංගම ගිණුම්, ණය ගිණුම්, ආපසු ගැණුම් ගිණුම, හවුල් අවසාන ගිණුම් පිළියෙල කිරීම, හවුලක සංයුතියේ වෙනස්කම් - හවුල්කරුවන් ඇතුළත් කර ගැනීමේ දී හා ඉවත් කිරීමේ දී කීර්තිනාමය හා අනිකුත් වත්කම් හා බැරකම් සම්බන්ධයෙන් කටයුතු කිරීම, හවුල් විසුරුවා හැරීම, බද්ධ ව්‍යාපාර

*සීමාසහිත සමාගම්වල ගිණුම් :*

සීමාසහිත සමාගම්වල ස්වභාවය, නිල ලැයිස්තුගත සමාගම් හා කොටස් වෙළඳ පොළ/කොටස් හා ණය ප්‍රාග්ධනය, බෙදිය හැකි ලාභ, අභ්‍යන්තර හා බාහිර ප්‍රයෝජනය සඳහා අවසාන ගිණුම්, ගිණුම් ප්‍රකාශ අර්ථකථනය, ගිණුම් කට්ටලයක් විවරණය කිරීම, ගිණුම් අනුපාතයන්

*විශේෂිත ගනුදෙනු සඳහා ගිණුම් :*

සමිති හා සමාගම්, තොග, ශාඛා, කුලී සින්නයට මිලදී ගැනීම හා ණයට විකිණීම, කල් බදු දීම, ආයෝජන, විනිමය බිල්පත්, දීර්ඝ කාලීන කොන්ත්‍රාත්තු, රාජ්‍ය භාග, හිස් භාජන ගිණුම්, විදේශ මුදල් ගනුදෙනු

*ගිණුම්කරණය සඳහා පරිගණක යොදා ගැනීම :*

පරිගණක වර්ග/දෘඩාංග හා මෘදුකාංග, පරිගණක කාර්ය බද්ධ මෘදුකාංග, විද්‍යුත් කාරක විස්තර පත්‍රය, පරිගණකමය ගිණුම්කරණය

*විෂයය අංක 03 - පිරිවැය සහ කළමනාකරණ ගණකාධිකරණය :*

පිරිවැය ගණකාධිකරණය, මූල්‍ය ගණකාධිකරණය හා කළමනාකරණ ගණකාධිකරණය,
පිරිවැය ගණකාධිකරණයේ අභිප්‍රාය,
ගණකාධිකරණය කළමනාකාරිත්ව සහායක් වශයෙන් යොදා ගැනීම

*ද්‍රව්‍ය පිරිවැය :*

මිලදී ගැනීම් පිළිවෙත්, ගබඩා පිළිවෙත්, ද්‍රව්‍ය නිකුත් කිරීම ඇගයීමේ ක්‍රම, දිරි දීමනා හා ප්‍රසාද දීමනා

*ශ්‍රම පිරිවැය :*

වේලා සටහන් කිරීම් හා වේලා වෙන් කිරීම්, වැටුප් ගෙවීම් ක්‍රම, දිරි දීමනා හා ප්‍රසාද මුදල් ගෙවීම, වේතන හා වැටුප් ගිණුම් තැබීම

*පොදු කාර්ය පිරිවැය :*

වර්ගීකරණ වෙන් කිරීම් හා බෙදා හැරීම්, අවශෝෂණ ක්‍රම, පොදු කාර්ය පරිපාලනය, වෙළඳාම් හා බෙදා හැරීම් පොදු කාර්ය පිරිවැය

*ඒකාබද්ධ හා ඒකාබද්ධ නොවන ගිණුම් :*

පිරිවැය පාලන ගිණුම, පිරිවැය හා මූල්‍ය ගිණුම් සැසඳීම්, පූර්ණ ගිණුම්

*පිරිවැයකරණ ක්‍රම :*

කොන්ත්‍රාත් පිරිවැයකරණය, කාර්ය පිරිවැයකරණය, දෙපාර්තමේන්තුමය පිරිවැයකරණය, භාණ්ඩ පිරිවැයකරණය, ක්‍රියාවලි පිරිවැයකරණය, ඒකක පිරිවැයකරණය, සේවා පිරිවැය-කරණය, විවිධ පිරිවැයකරණ ක්‍රම යටතේ උපලබ්ධි නොවූ ලාභ

*ආන්තික පිරිවැයකරණය :*

දායකවීම්/විකුණුම්, සමච්ඡේදන සටහන්, ආන්තික පිරිවැයකරණය යොදා ගැනීම, ආන්තික පිරිවැයකරණය හා සම්බන්ධ ගිණුම් සටහන්

*ප්‍රමිති පිරිවැයකරණය :*

ප්‍රමිති පිරිවැය, තථ්‍ය පිරිවැය, මූලික විචල්‍යයන්, ගිණුම්කරණ පරිපාටිය

*අයවැය පාලනය :*

ශ්‍රිතගත අයවැය, ප්‍රධාන අයවැය, නම්‍ය අයවැය පාලනය, අඛණ්ඩ අයවැයකරණය, අයවැය පාලනය මෙහෙයුම

***විෂයය අංක 04 - රාජ්‍ය මූල්‍ය කළමනාකරණය :***

*රජයේ මුදල් පිළිබඳ නෛතික රාමුව :*

ඒකාබද්ධ අරමුදල, විශේෂ නීති විෂයගත වියදම්, ප්‍රතිශ්චිත අවසාන අරමුදල, රාජ්‍ය ණය, විදේශ ආධාර, මූල්‍යමය පියවර

*කාර්යභාරය*

පාර්ලිමේන්තුවේ, මුදල් අමාත්‍යවරයාගේ, භාණ්ඩාගාරයේ, විගණකාධිපතිවරයාගේ, රාජ්‍ය ගිණුම් කාරක සභාවේ, රාජ්‍ය ව්‍යාපාර කාරක සභාවේ, ප්‍රධාන ගණක නිලධාරියාගේ, ජාතික සැලසුම් දෙපාර්තමේන්තුවේ, මුදල් මණ්ඩලයේ

*වාර්ෂික විසර්ජන කෙටුම්පත :*

අයවැය ක්‍රමය හා පටිපාටි/වාර්ෂික ආදායම් හා වියදම් ඇස්තමේන්තු

*අයවැය ක්‍රියාත්මක කිරීම :*

අයවැය ක්‍රියාත්මක කිරීම සඳහා සංවිධාන ව්‍යූහය, ආදායම් රාශිකරණ පටිපාටිය, ගෙවීම් කිරීම සඳහා අග්‍රිමය, මූල්‍ය කටයුතු මෙහෙයුම් අධීක්ෂණය, කාර්ය පැවරුම, වීරමොං පටිපාටිය, පරිපූරක ඇස්තමේන්තු, අයවැය පාලනය, සැපයීම් පටිපාටිය

*රජයේ ගිණුම් ක්‍රමය හා පටිපාටි :*

රජයේ දේපළ භාරය, ආරක්ෂාව හා පාලනය, ආදායම් හා අනිකුත් ලැබීම් සඳහා ගිණුම්කරණය, වියදම් හා අනිකුත් ගෙවීම් සඳහා ගිණුම්කරණය, විදේශ ආධාර සඳහා ගිණුම්කරණය, පාඩු අත්හැරීම් හා කපා දැමීම් සඳහා ගිණුම්කරණය

*සමාලෝචනය :*

ක්ෂණික වාර්තා, මාසික ගිණුම් සාරාංශය, මූල්‍ය හා භෞතික කාර්යය සාධන සමාලෝචනය, වාර්ෂික විසර්ජන ගිණුම, දිවයිනේ ගිණුම් පිළිබඳ විගණකාධිපතිවරයාගේ වාර්තාව, රජයේ ගිණුම් කාරක සභාවේ වාර්තාව, රාජ්‍ය ව්‍යාපාර කාරක සභාවේ වාර්තාව

***විෂයය අංක 05 - විගණනය හා විමර්ශනය :***

*විගණනයේ ස්වභාවය හා පරමාර්ථය - විගණකගේ කාර්යභාරය :*

අභ්‍යන්තර විගණනය, බාහිර විගණනය, ව්‍යවස්ථාපිත - ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව හා 1971 අංක 38 දරන මුදල් පනත යටතේ රජයේ දෙපාර්තමේන්තුවලට, අමාත්‍යාංශවලට හා සංස්ථාවලට අදාළව ව්‍යවස්ථාමය නොවන - 1982 අංක 17 දරන සමාගම් ආඥාපනත යටතේ, විගණන ප්‍රමිති, විගණන මත, විගණන සංකල්ප, විගණකගේ ස්වාධීනත්වය හා අතිකුත් පෞද්ගලික ගුණාංග, සාක්ෂි, සත්‍යවාදී සාධාරණ බව, භෞතිකත්වය, විගණන අවදානම්, විගණකගේ වගකීම්, විගණනයට භාජිතගේ වගකීම්

*විෂය ක්ෂේත්‍රය හා සීමාවන් :*

විෂය ක්ෂේත්‍රය නිර්ණය කිරීම, උපකල්පනයන් හා සීමාවන්

*විගණන ප්‍රමිතිවල හා මාර්ගෝපදේශවල කාර්යභාරය :*

සේවයේ යෙදීමේ ලිපිවල, කළමනාකරණ ලිපිවල හා නියෝජන ලිපිවල කාර්යභාරය, මූලික විගණන ක්‍රම විධි හා සමාලෝචනය සඳහා පටිපාටි අභ්‍යන්තර පාලනය ඇගයීම

*ප්‍රමාණ සටහන්, ප්‍රශ්න මාලා*

*විගණන සැලසුම් කිරීම් හා පාලනය :*

විගණනය සැලසුම් කිරීම, කාල නිර්ණය, අන්තර් හා අවසාන විගණන, කාර්යයන් සඳහා වගකීම් භාරදීම, විගණන පාලනය, අභ්‍යන්තර පාලනය යොදා ගැනීම් ඇතුලුව කල වැඩ සටහන්ගත කිරීම, සකස් කල ප්‍රශ්න මාලා හා අභ්‍යන්තර පාලනය ඇගැයීමේ ආකෘතිපත්‍ර

*මූල්‍ය විගණනය සඳහා අගයන්, සංකල්ප හා ලක්ෂණ :*

එය රාජ්‍ය අංශයට අදාළ බව, විශ්ලේෂණාත්මක විගණනය

පරිගණකගත කළ ගිණුම් පද්ධති විගණනය - සීමාසහිත සමාගම් විගණනය

ව්‍යවස්ථාපිත පොත්, අධ්‍යක්ෂවරුන්ගේ බලතල හා රාජකාරින්, බෙදිය හැකි ලාභ, විගණකයින් පත් කිරීම, වේතන හා ඉවත් කිරීම්, නව විගණකයන් භාර ගැනීමට ප්‍රථම ගත යුතු ක්‍රියාමාර්ග, විගණකගේ බලතල හා යුතුකම්

*පරීක්ෂණවල ස්වභාවය හා ප්‍රමාණය*

අනුකූලතා පරීක්ෂණ, ස්වාධීන පරීක්ෂණ, නියැදි ශිල්ප ක්‍රම, ශේෂ පත්‍ර සමීක්ෂණය, ආදායම් හා වියදම් ගිණුම් සමීක්ෂණය

*විගණකයින්ගේ හා ගණකාධිකාරීවරුන්ගේ වෘත්තීයමය වගකීම්*

වෘත්තීයමය පැවැත්ම හා ආචාර ධර්ම, නෛතික අයිතීන් හා වගකීම්, ගණකාධිකාරීගේ හා විගණකගේ නීතිමය වගකීම හා සිද්ධීන් පිළිබඳ දැනුම් විෂයයට අදාළ නීතිය

*විමර්ශන :*

විමර්ශනයට අදාළ විෂය ක්ෂේත්‍රයේ සැලසුම් කිරීම, භාවිතා කළ යුතු ශිල්ප ක්‍රම හා පිළිවෙත්, විමර්ශන මෙහෙයවීමේ අභිප්‍රාය පිළිබඳ උදාහරණ, ශක්‍යතා අධ්‍යන, මිලට ගැනීම්, විකිණීම, ණයට දීමේ, මිල නියම කිරීම ආදිය සඳහා ව්‍යාපාර ආයතන ඇගයීම, කාර්ය පත්‍රය සඳහා ගණකාධිකාරීගේ හා විගණකගේ වාර්තා, වාර්තාකරණ කාර්යයන්, වංචා විමර්ශන, ව්‍යාපෘති ඇගැයීම

*වාර්තාකරණ කාර්යයන් :*

අභ්‍යන්තර පාලන පද්ධතිවල දුර්වලතා කළමනාකරණයට වාර්තා කිරීම, රජයේ හා සංස්ථා විගණනයට ලිඛිතව විශේෂ වාර්තාකරණය කාර්යය, කාර්ය පත්‍රය සඳහා වාර්තා, විමර්ශනය පිළිබඳ වාර්තා

***විෂයය අංක 06 - සාමාන්‍ය බුද්ධිය හා අවබෝධය***

*'අ' කොටස*

අවබෝධය ප්‍රශ්න පත්‍රයේ දෙනු ලබන ඡේදයක් පදනම් කොටගෙන අයදුම්කරුවන්ගෙන් ප්‍රශ්න අසනු ලැබේ. තවත් ඡේදයක් දෙනු ලබන අතර, අයදුම්කරුවන් විසින් එහි මුඛ්‍ය අදහස ඡේදයේ වචන ගණනින් තුනෙන් එකක් වන සේ සාරාංශ කොට ලිවිය යුතු ය.

*'ආ' කොටස*

*සාමාන්‍ය බුද්ධිය*

*සටහන :*

(i) ඉහත (ආ) සහ (ඇ) හි ඇති "සුදුසුකම් ලත් විභාගය" යන පදයෙන් අදහස් කෙරෙන්නේ 5 වැනි ඡේදයෙහි දක්වා ඇති විභාගවලින් එකක් ය.

(ii) අපේක්ෂකයෙකු විභාගයේ දී පෙනී සිටින සියලුම ප්‍රශ්න පත්‍රවලට එකම භාෂාවකින් පිළිතුරු ලිවිය යුතු ය.

(iii) තම ඉල්ලුම්පත්‍රයෙහි සඳහන් මාධ්‍යය වෙනස් කිරීමට අපේක්ෂකයෙකුට ඉඩ දෙනු නොලැබේ.

(ආ) අපේක්ෂකයෙකු විභාගයට පෙනී සිටිය යුතු වන්නේ සුදුසුකම් ලත් විභාගයෙන් සාමාර්ථය ලත් භාෂාවෙන් හෝ රාජ්‍ය භාෂාවෙන් ය.

(ඇ) අපේක්ෂකයෙකු සුදුසුකම් ලත් විභාගයේ විෂයයන් භාෂා දෙකකින් හෝ වැඩි ගණනකින් හෝ සමත්ව ඇත්නම්, එම විභාගයේ දී ඔහු සමත් වූ විෂයයන්ගෙන් වැඩි ගණනකට යොදා ගත් භාෂාවෙන් හෝ රාජ්‍ය භාෂාවෙන් හෝ විභාගයට පෙනී සිටිය යුතු ය.

(ඈ) ප්‍රධාන විෂය එක් භාෂාවකිනුත්, අතිරේක විෂය තවත් භාෂාවකිනුත්, සමත්වී ඇති විශේෂ උපාධියක් ඇති අපේක්ෂකයෙකු ප්‍රධාන විෂයයන් සාමාර්ථය ලත් භාෂාවෙන් හෝ රාජ්‍ය භාෂාවෙන් හෝ විභාගයට පෙනී සිටිය යුතු ය.

**සෞඛ්‍ය අමාත්‍යාංශයේ නිවාස භාරකාරිණී/නිවාස භාරකරු තනතුරේ III වන ශ්‍රේණියට නිලධාරීන් බඳවා ගැනීම සඳහා වන විවෘත තරග විභාගය - 2013**

සෞඛ්‍ය අමාත්‍යාංශයෙහි කළමනාකරණ සහකාර තාක්‍ෂණික නොවන බණ්ඩ - 2 සේවා ගණයට අයත් නිවාස භාරකාරිණී තනතුර සඳහා 2013.01.05 දිනැති දිනමිණ පුවත්පතේ හා 2013.01.11 දිනැති තිනකරන් පුවත්පතේ පළකරන ලද පුවත්පත් නිවේදනවලට අනුව ප්‍රමාණවත් සුදුසුකම්ලත් අයදුම්පත් සංඛ්‍යාවක් නොලැබීම නිසා ඉහත තනතුරට බඳවා ගැනීමට නැවත සුදුසුකම්ලත් ශ්‍රී ලාංකික අයදුම්කරුවන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

*සැ. යු.* : (උක්ත නිවේදනයන් අනුව අදාල සුදුසුකම් සහිත අයදුම්පත් ඉදිරිපත් කරන ලද අයදුම්කරුවන් මේ සඳහා නැවත අයදුම්පත් ඉදිරිපත් කිරීම අවශ්‍ය නොවේ.)

01. *බඳවා ගැනීමේ ක්‍රමය :*

නිවේදනයේ දක්වා ඇති සුදුසුකම් සම්පූර්ණ කර ඇති අයදුම්කරුවන් අතුරින් සෞඛ්‍ය අමාත්‍යාංශයේ ලේකම් විසින් පවත්වනු ලබන ලිඛිත විභාගයේ ප්‍රතිඵල මත ඉහළ ලකුණු ලබා ගන්නා අපේක්‍ෂකයින් කායික යෝග්‍යතාවය සහ සුදුසුකම් පරීක්‍ෂා කිරීමේ සම්මුඛ පරීක්‍ෂණයකට යොමු කිරීමෙන් අනතුරුව පුරප්පාඩු සංඛ්‍යාව අනුව III වන ශ්‍රේණිය සඳහා බඳවා ගනු ලැබේ.

02.

(i) අධ්‍යාපන සුදුසුකම්

- සිංහල/දෙමළ/ඉංග්‍රීසි භාෂාව, ගණිතය සහ තවත් විෂයයන් දෙකකට සම්මාන සාමාර්ථ සහිතව එකවර විෂයයන් හයකින් (06) අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය සමත් වී සිටීම.

සහ

- අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගයේදී අවම වශයෙන් එක් විෂයකින් හෝ (සාමාන්‍ය පොදු පරීක්‍ෂණය හැර) සමත්වී තිබීම.

සහ

(ii) පළපුරුද්ද

රජයේ හෝ රජයේ අනුබද්ධ හෝ රජයේ පිළිගත් පුද්ගලික ආයතනයක නේවාසිකාගාරයේ භාරකරු වශයෙන් අවුරුදු දෙකක පළපුරුද්ද තිබීම

(iii) කායික සුදුසුකම්

ශ්‍රී ලංකාවේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමටත්, තනතුරේ රාජකාරී ඉටුකිරීමටත්, ප්‍රමාණවත් ශාරීරික හා මානසික යෝග්‍යතාවයකින් යුක්ත විය යුතුය.

(iv) වෙනත්

- ශ්‍රී ලාංකික පුරවැසියෙකු විය යුතුය.
- අයදුම්කරු විශිෂ්ඨ චරිතයකින් යුක්ත විය යුතුය.
- අයදුම්පත් කැඳවන අවසන් දිනට තනතුරට බඳවා ගැනීම සඳහා අවශ්‍ය සුදුසුකම් සෑම ආකාරයකින්ම සම්පූර්ණ කර තිබිය යුතුය.

03. *සේවයේ නියුක්ත කරවීමේ කොන්දේසි හා සේවා කොන්දේසි*

(i) මෙම තනතුර ස්ථිරය. විශ්‍රාම වැටුප් සහිතය. වැන්දඹු/වැන්දඹු පුරුෂ අනත්දරු විශ්‍රාම වැටුප් ක්‍රමයට දායක මුදල් ගෙවිය යුතුය.

(ii) මෙම තනතුර අවුරුදු 03ක පරිවාස කාලයකට යටත් ය.

(iii) රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 07/2007ට අනුව හා ඊට ආනුෂංගික චක්‍රලේඛ අනුව තනතුරට බැඳී වසර 05ක් ඇතුලත සේවාවට බැඳුනු භාෂාවට අතිරේකව අනෙක් රාජ්‍ය භාෂාව පිළිබඳව අදාල ප්‍රවීනතාවය ලබාගත යුතුය.

(iv) වසර 03ක් ඇතුලත පළමු කාර්යක්‍ෂමතා කඩඉම් විභාගය සමත්විය යුතුය.

(v) තෝරාගනු ලබන අයදුම්කරුවන් කළමනාකරණ සහකාර තාක්‍ෂණික නොවන බණ්ඩ 02 සේවා ගණයේ බඳවා ගැනීමේ පරිපාටියට හා එයට කලින් කලට කරනු ලබන සංශෝධන, ආයතන සංග්‍රහය, මුදල් රෙගුලාසි, රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් නිකුත් කර ඇති කාර්ය පටිපාටික රීති, හා රජය විසින් නිකුත් කරනු ලබන නියෝග හා රෙගුලාසිවලටද යටත් විය යුතුය.

(vi) උසස් කිරීමේ පටිපාටිය කළමනාකරණ සහකාර තාක්‍ෂණික නොවන බණ්ඩ - 02 සේවා ගණයේ බඳවා ගැනීමේ පරිපාටියේ සඳහන් නිවාස භාරකාරිණී/නිවාස භාරකරු තනතුරට අදාලව සිදු කරනු ලැබේ.

04. *වයස් සීමාව :*

අයදුම්පත් භාරගන්නා අවසාන දිනට අවම වයස අවුරුදු 18 වන අතර උපරිම වයස අවුරුදු 30 වේ.

05. *වැටුප් පරිමාණය :*

රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 06/2006 (IV) හි MN 01-2006 (ඒ) යටතේ රු. 13,120- 10 x 145 - 11 x 170- 10 x 240 - 10 x 320 - රු.22,040 මෙහි ආරම්භක වැටුප් පියවරට බඳවා ගනු ලැබේ.

06. *ලිඛිත විභාගය :*

(අ) ලිඛිත පරීක්‍ෂණයට කැඳවනු ලබන්නේ සෑම ආකාරයකින්ම සම්පූර්ණ අයදුම්පත් ඉදිරිපත් කර ඇති අපේක්‍ෂකයින් පමණි.

ලිඛිත විභාගය පහත විෂයයන් යටතේ පවත්වනු ලැබේ. :

| | *ප්‍රශ්න පත්‍රයේ නම* | *විෂය නිර්දේශය* | *කාලය* | *උපරිම ලකුණු ප්‍රමාණය* | *සමත් ලකුණු ප්‍රමාණය* |
|---|---|---|---|---|---|
| (i) | සාමාන්‍ය දැනීම | අදාල ක්ෂේත්‍රය ඇසුරින් තර්කානුකූල කරුණු දැක්වීම සහ සාමාන්‍ය දැනුම පරීක්‍ෂා කිරීම | පැය 02 | 100 | 40% |
| (ii) | බුද්ධි පරීක්‍ෂණය | පද සංඛ්‍යා හා රූප වශයෙන් ඉදිරිපත් කරනු ලබන ගැටළු සම්බන්ධයෙන් අපේක්‍ෂකයන් දක්වන නිගමන හා ප්‍රතිචාර ආශ්‍රයෙන් එම ගැටළු පිළිබඳ අර්ථාවබෝධය, ප්‍රමාණීකරණය | පැය 1 1/2 | 100 | 40% |

| ප්‍රශ්න පත්‍රයේ නම | විෂය නිර්දේශය | කාලය | උපරිම ලකුණු ප්‍රමාණය | සමත් ලකුණු ප්‍රමාණය |
|---|---|---|---|---|
| | හා කාලය හා අවකාශය අතර සහ සම්බන්ධතා වටහා ගැනීමෙහි ලා අපේක්ෂකයෙකු සතු හැකියාව මැන බැලීම මෙයින් අපේක්ෂා කෙරේ. | පැය 1 1/2 | 100 | 40% |

සටහන :- සෑම ලිඛිත උත්තර පත්‍රයක් සම්බන්ධයෙන් නොපැහැදිලි අත් අකුරු සහ අක්ෂර වින්‍යාස දෝෂ වෙනුවෙන් ලකුණු අඩු කරනු ලැබේ.

(ආ) මෙම විභාගය මෙහි උපලේඛනයේ දක්වා ඇති නගර වල දී පමණක් පැවැත්වේ. අයදුම්පත්‍රයේ තමා විභාගයට පෙනී සිටීමට බලාපොරොත්තු වන නගරය හා නගර අංකය කැමැත්ත පරිදි දැක්විය යුතුය. ඉල්ලුම් කරන නගරය තුළ විභාගය පැවැත්වීම සඳහා ප්‍රමාණවත් අයදුම්කරුවන් පිරිසක් නොමැති නම් එම නගරයට ආසන්න වෙනත් නගරයක පිහිටුවන ලබන විභාග මධ්‍යස්ථානයක් ලබා දීමට කටයුතු කෙරේ. විභාගය සිංහල, දෙමළ හා ඉංග්‍රීසි මාධ්‍ය වලින් පමණක් පැවැත්වේ. ඉල්ලුම් කරන මාධ්‍ය පසුව වෙනස් කිරීමට ඉඩදෙනු නොලැබේ. අපේක්ෂකයෙකු විභාගයට පෙනී සිටිය යුතු වන්නේ සුදුසුකම්ලත් අධ්‍යයන පොදු සහතික පත්‍ර සාමාන්‍ය පෙළ විභාගයට පෙනී සිටි මාධ්‍යයෙන් හෝ රාජ්‍ය භාෂාවෙන් හෝ විය යුතුය. විභාග ප්‍රවේශ පත්‍රය අයදුම්පතේ සඳහන් කර ඇති ලිපිනයට සෞඛ්‍ය අමාත්‍යාංශයේ අධ්‍යක්ෂ (විභාග) විසින් තැපැල් මඟින් එවනු ලැබේ.

(ඇ) අපේක්ෂාකයාගේ අනන්‍යතාවය

ලිඛිත පරීක්ෂණයේ දී තමන්ගේ අනන්‍යතාවය සහතික කිරීම සඳහා පහත සඳහන් අනන්‍යතා පත්‍ර පිළිගනු ලැබේ.

1. පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ කොමසාරිස්වරයා විසින් නිකුත් කරන ලද ජාතික හැඳුනුම්පත
2. වලංගු විදේශ ගමන් බලපත්‍රය

07. *අයදුම්පත් යොමු කිරීම*

අයදුම්පත් 2014.04.25 දිනට හෝ එදිනට ප්‍රථම පහත ලිපිනයට ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් ඉදිරිපත් කළ යුතුවේ. එදිනට පසුව ලැබෙන අයදුම්පත් හා අතින් භාරදෙනු ලබන අයදුම්පත් ප්‍රතික්ෂේප කෙරේ.

අධ්‍යක්ෂ (පාලන) 03,
කාර්මික නොවන සේවා ශාඛාව,
සෞඛ්‍ය අමාත්‍යාංශය,
"සුවසිරිපාය",
අංක 385, පූජ්‍ය බද්දේගම විමලවංශ හිමි මාවත,
කොළඹ 10.

08. *අයදුම්පත් සකස් කිරීම හා සම්පූර්ණ කිරීමට උපදෙස්*

(අ) අයදුම්පත්‍රය මෙම නිවේදනය අවසානයේ දැක්වෙන ආදර්ශ ආකෘතියට අනුකූලව ඒ - 4 ප්‍රමාණයේ කඩදාසියක දෙපැත්තම ප්‍රයෝජනයට ගනිමින් මුල් පිටුවට අංක 1.0, සිට 5.1 දක්වාත්, දෙවන පිටුව 5.2 සිට 9.0 දක්වාත්, ආකාරයෙන් පිළියෙල කර තමාගේ අත් අකුරින්ම සම්පූර්ණ කළ යුතුය.

(ආ) අයදුම්පත බහාලන කවරයේ ඉහළ වම් කෙළවරේ "නිවාස භාරකාරිණී/නිවාස භාරකරු තනතුර සඳහා අයදුම්පත්‍රය" යනුවෙන් ද, ගැසට් නිවේදනයට අනුව විභාගයට පෙනී සිටීමට ඉල්ලුම් කරන නගරය හා නගර අංකය ද, සඳහන් කළ යුතුය.

(ඇ) අයදුම්පත්‍රයේ අයදුම්කරුගේ අත්සන රජයේ විදුහලක විදුහල්පතිවරයෙකු හෝ සමාදාන විනිශ්චයකාරයෙකු හෝ දිවුරුම් කොමසාරිස්වරයෙකු හෝ නීතිඥවරයෙකු හෝ ප්‍රසිද්ධ නොතාරිස් වරයෙකු හෝ ත්‍රිවිධ හමුදාවේ අධිකාරී බලයලත් නිලධාරියෙකු හෝ පොලිස් සේවයේ ගැසට් කරන ලද තනතුරක් දරන නිලධාරියෙකු හෝ රු. 273,060 ට වැඩි වාර්ෂික ඒකාබද්ධ වැටුපක් ලබන රාජ්‍ය සේවයේ ස්ථිර තනතුරක් දරන නිලධාරියෙකු හෝ විසින් සහතික කළ යුතුය.

(ඈ) විභාග ගාස්තු
ලේකම්, සෞඛ්‍ය අමාත්‍යාංශය, "සුවසිරිපාය", අංක 385, පූජ්‍ය බද්දේගම විමලවංශ හිමි මාවත, කොළඹ 10, යන ලිපිනයට ලියූ කොළඹ මහ තැපැල් කාර්යාලයෙන් ගෙවිය හැකි රු. 300 ක මුදල් ඇණවුමක් මගින් විභාග ගාස්තු සෑම අපේක්ෂකයෙකු විසින්ම ගෙවිය යුතුය. විභාග ගාස්තු කුමන හේතුවක් නිසාවත් ආපසු ගෙවනු නොලැබේ. මෙම මුදල් ඇනවුමේ ඡායා පිටපතක් ඉදිරිපත් කිරීම හෝ වෙනයම් ආකාරයකට මුදල් ගෙවීම, අයදුම්පත්‍ර ප්‍රතික්ෂේප කිරීමට හේතුවක් වේ.

(ඉ) මේ සමඟ ඇති ආදර්ශ අයදුම්පත්‍රයේ ආකෘතියට අනුකූල නොවන, අවශ්‍ය සුදුසුකම් සපුරා නොමැති, නිසි පරිදි මුදල් ගෙවා නොමැති, අසම්පූර්ණ ලෙස තොරතුරු සටහන් කර ඇති, හා ප්‍රමාද වී ලැබෙන අයදුම්පත්, කිසිඳු දැනුම්දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ. අයදුම්පත් ලද බව දන්වනු නොලැබේ. තැපෑලේදී අස්ථාන ගතවීම හෝ ප්‍රමාදවීම ගැන කිසිදු පැමිණිල්ලක් සලකා බලනු නොලැබේ.

09. *සාවද්‍ය තොරතුරු සැපයීම*

ඔබ විසින් එවන ලද අයදුම්පත්‍රයේ සඳහන් කර ඇත්තා වූ යම් තොරතුරක් අසත්‍ය හෝ වැරදි බව බඳවා ගැනීමට පෙර අනාවරණය වුවහොත් ඔබගේ අපේක්ෂකත්වය අවලංගු කරනු ලැබේ. එබඳු අසත්‍ය හෝ වැරදි තොරතුරක් බඳවා ගැනීමෙන් පසු අනාවරණය වුවහොත් ඊට අදාළ ක්‍රියාමාර්ගයන්ට යටත්ව සේවයෙන් පහ කිරීමට කටයුතු කරනු ලැබේ.

10. මෙම ගැසට් නිවේදනයේ සඳහන් නොවන යම් කරුණක් වෙතොත් ඒ සම්බන්ධව අවසාන තීරණය සෞඛ්‍ය ලේකම්ගේ නියමය පරිදි වන්නේ ය. එමෙන්ම පුරප්පාඩු පිරවීමට හෝ නොපිරවීමට හෝ පුරප්පාඩු වලින් කොටසක් පිරවීම පිළිබඳ අවසාන තීරණය සෞඛ්‍ය ලේකම් සතුය.

11. මෙම ගැසට් නිවේදනයේ සිංහල, දෙමළ හා ඉංග්‍රීසි භාෂා පාඨ අතර යම් අනනුකූලතාවයක් හෝ පරස්පරතාවයක් ඇතිවුවහොත් එවිට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතුවන්නේ ය.

වෛද්‍ය. වයි. ඩී. නිහාල් ජයතිලක,
සෞඛ්‍ය ලේකම්.

2014 මාර්තු මස 05 වැනි දින,
"සුවසිරිපාය"
සෞඛ්‍ය අමාත්‍යාංශය,
කොළඹ 10.

*උපලේඛනය*

විභාග මධ්‍යස්ථාන පිහිටුවන නගර හා නගර අංක

| *නගරය* | *නගර අංකය* | *නගරය* | *නගර අංකය* | *නගරය* | *නගර අංකය* | *නගරය* | *නගර අංකය* |
|---|---|---|---|---|---|---|---|
| කොළඹ | 01 | මාතලේ | 05 | හම්බන්තොට | 09 | කුරුණෑගල | 18 |
| ගම්පහ | 02 | නුවරඑළිය | 06 | යාපනය | 10 | පුත්තලම | 19 |
| කළුතර | 03 | ගාල්ල | 07 | මන්නාරම | 11 | අනුරාධපුරය | 20 |
| මහනුවර | 04 | මාතර | 08 | වවුනියාව | 12 | පොළොන්නරුව | 21 |
| | | | | මුලතිව් | 13 | බදුල්ල | 22 |
| | | | | කිලිනොච්චිය | 14 | මොණරාගල | 23 |
| | | | | මඩකලපුව | 15 | රත්නපුර | 24 |
| | | | | අම්පාර | 16 | කෑගල්ල | 25 |
| | | | | ත්‍රිකුණාමලය | 17 | | |

සෞඛ්‍ය අමාත්‍යාංශයේ නිවාස භාරකාරිණී/නිවාස භාරකරු තනතුර සඳහා විවෘත බඳවා ගැනීම - 2013

*ආදර්ශ අයදුම්පත්‍රය*

විභාගයට පෙනී සිටින
භාෂා මාධ්‍ය : සිංහල -1
දෙමළ -2,
ඉංග්‍රීසි -3,
(අදාළ අංකය කොටුව තුළ ලියන්න).

විභාගය සඳහා ඉල්ලුම් කරන නගරය හා
*නගර අංකය (ගැසට් නිවේදනය අනුව)*

| නගරය | නගර අංකය |
|---|---|
| | |

1.0 1.1 අයදුම්කරුගේ මුල්කුරු සමග නම :- (ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්)
උදා. : SILVA A. D.
Mr/Mrs/Miss :—————.

1.2 සම්පූර්ණ නම : (ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්)

| | | | | | | | | | | | | | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | | | | | | | | | | | | | | | | | | | | | | |

1.3 සම්පූර්ණ නම : (සිංහලෙන්/දෙමළෙන්) :—————.

2.0 2.1 ස්ථිර ලිපිනය :- (ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්) :—————.

2.2 ස්ථිර ලිපිනය :- (සිංහලෙන්/දෙමළෙන්) :—————.

2.3 පදිංචි දිස්ත්‍රික්කය :—————. 2.4 දුරකථන අංකය :—————.

2.5 විභාග ප්‍රවේශ පත්‍රය එවිය යුතු ලිපිනය : (ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්)

| | | | | | | | | | | | | | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | | | | | | | | | | | | | | | | | | | | | | |

3.0 3.1 ස්ත්‍රී/පුරුෂ භාවය :—————.

3.2 උපන්දිනය :- වර්ෂය ☐☐☐☐ මාසය ☐☐ දිනය ☐☐

3.3 ජාතික හැඳුනුම්පත් අංකය : ☐☐☐☐☐☐☐☐☐☐

3.4 අයදුම්පත් භාරගන්නා අවසාන දිනට වයස අවුරුදු ☐☐ මාස ☐☐ දින ☐☐

4.0 4.1 ශ්‍රී ලාංකික පුරවැසියෙකු ද යන වග ඔව් ☐ නැත ☐ (අදාළ කොටුව තුළ ලකුණ ඇතුළත් කරන්න.)

5.0 අධ්‍යාපන සුදුසුකම් (අදාළ සහතික ඇමිණිය යුතුය.)

5.1 අ. පො. ස. (සා. පෙ.) විභාගය

| | විෂයය | වර්ෂය | |
|---|---|---|---|
| | | විභාග අංකය | |
| | | සාමාර්ථය | |
| 01 | | | |
| 02 | | | |
| 03 | | | |
| 04 | | | |
| 05 | | | |
| 06 | | | |
| 07 | | | |
| 08 | | | |
| 09 | | | |
| 10 | | | |

5.2 අ. පො. (උ. පෙ) විභාගය විභාග අංකය :—————.

| | විෂයය | සාමාර්ථය |
|---|---|---|
| 01 | | |
| 02 | | |
| 03 | | |
| 04 | | |
| 05 | | |

5.3 පලපුරුද්ද : ඇත ☐ නැත ☐ (අදාළ කොටුව තුළ ✓ ලකුණ ඇතුළත් කරන්න.)

අදාළ විස්තර සඳහන් කරන්න. :—————.

(රජයේ හෝ රජයේ අනුබද්ධ හෝ රජයේ පිළිගත් පුද්ගලික ආයතනයක නේවාසිකාගාරයේ භාරකරු වශයෙන් අවු. 02ක පළපුරුද්ද තිබිය යුතුය. අදාළ සහතික ඇමිණිය යුතුය.)

6.0 ගැසට් නිවේදනයේ සඳහන් පරිදි අදාළ පුවත්පත් නිවේදනයන්ට අනුව ඔබ විසින් මීට පෙර මෙම විභාගයට අයදුම්කර තිබේ ද?

ඇත ☐ නැත ☐ (අදාළ කොටුව තුළ ✓ ලකුණ ඇතුළත් කරන්න.)

7.0 විභාග ගාස්තු ගෙවූ මුදල් ඇනවුම පිළිබඳ විස්තර

7.1 මුදල් ඇනවුම ගෙවූ කාර්යාලය :—————.

7.2 මුදල් ඇනවුම් අංකය හා දිනය :—————.

7.3 ගෙවූ මුදල :—————.

| මුදල් ගෙවන ලද මුදල් ඇනවුම අලවන්න. එහි ඡායා පිටපතක් ළඟ තබාගන්න. |
|---|

8.0 අයදුම්කරුගේ සහතිකය :

මෙහි සඳහන් කර ඇති තොරතුරු මාගේ දැනීමේ හා විශ්වාසය පරිදි සත්‍ය හා නිවැරදි බවත්, නියමිත විභාග ගාස්තුව ගෙවා මුදල් ඇනවුම මෙහි අලවා ඇති බවත්, මෙයින් සහතික කරමි. මෙහි ඇතුළත් යම්කිසි විස්තරයක් අසත්‍ය බව හෝ සාවද්‍ය බව හෝ සොයාගනු ලැබුවහොත් එසේ සොයාගන්නා ලද්දේ තෝරා ගැනීමට පෙර නම් මෙම අයදුම්පත අවලංගු වන බව ද තෝරා ගැනීමෙන් පසුව නම් යම්කිසි වන්දියක් නොමැතිව මම සේවයෙන් පහ කරනු ලබන බව ද පිළිගනිමි.

—————,
අයදුම්කරුගේ අත්සන

දිනය :—————.

9.0 අයදුම්කරුගේ අත්සන සහතික කිරීම :

මෙම අයදුම්පත ඉදිරිපත් කරනු ලබන ...................... මයා./මිය./මෙනවිය මා පෞද්ගලිකව දන්නා හඳුනන බව ද, ඔහු/ඇය ...................... දින මා ඉදිරිපිටදී ඔහුගේ/ඇයගේ අත්සන තැබූ බවත් මම සහතික කරමි.

————,
(සහතික කරන්නාගේ අත්සන).

දිනය :————.

සහතික කරන නිලධාරියාගේ සම්පූර්ණ නම :————.

තනතුර :————.

ලිපිනය :————.

(නිල මුද්‍රාව තබා සනාථ කළ යුතුයි.)

03-775

---

**සෞඛ්‍ය අමාත්‍යාංශය**

වෛද්‍ය කර්මය සඳහා වූ පරිපූරක වෘත්තීන්ගේ සේවාවේ හා අතුරු වෛද්‍ය සේවාවේ පුහුණුව සඳහා අභ්‍යාසලාභීන් බඳවා ගැනීම - 2014 වර්ෂය

සෞඛ්‍ය අමාත්‍යාංශයේ වෛද්‍ය කර්මය සඳහා වූ පරිපූරක වෘත්තීන්ගේ සේවාවේ හා අතුරු වෛද්‍ය සේවාවේ පහත සඳහන් පාඨමාලාවන් හි පුහුණුව සඳහා අභ්‍යාසලාභීන් බඳවා ගැනීමට සුදුසුකම් ලබා ඇති ශ්‍රී ලංකා පුරවැසියන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ. :-

| *සංකේත අංකය* | *පුහුණු පාඨමාලාවේ නම* | *පුහුණු කාල සීමාව* | *පුහුණු පාඨමාලාව හැදෑරිය යුතු භාෂා මාධ්‍යය* |
|---|---|---|---|
| 1. | වෛද්‍ය රසායනාගාර කාර්මික විද්‍යාඥ අභ්‍යාසලාභීන් | වසර 02 | ඉංග්‍රීසි |
| 2. | ඖෂධවේදී අභ්‍යාසලාභීන් | වසර 02 | ඉංග්‍රීසි |
| 3. | භෞත චිකිත්සක අභ්‍යාසලාභීන් | වසර 02 | ඉංග්‍රීසි |
| 4. | වෘත්තීය චිකිත්සක අභ්‍යාසලාභීන් | වසර 02 | ඉංග්‍රීසි |
| 5. | විකිරණ ශිල්පී අභ්‍යාසලාභීන් | වසර 02 | ඉංග්‍රීසි |
| 6. | මහජන සෞඛ්‍ය පරීක්ෂක අභ්‍යාසලාභීන් | වසර 1 1/2 (ක්ෂේත්‍ර පුහුණුව මාස 06කි) | සිංහල, දෙමළ, ඉංග්‍රීසි |
| 7. | ඛන්තු රේඛන ශිල්පී අභ්‍යාසලාභීන් | වසර 01 | ඉංග්‍රීසි |
| 8. | විද්‍යුත් නිකර්පණ රේඛන සටහන්කරු අභ්‍යාසලාභීන් | වසර 01 | ඉංග්‍රීසි |
| 9. | අක්ෂි තාක්‍ෂණවේදී අභ්‍යාසලාභීන් | වසර 02 | ඉංග්‍රීසි |
| 10. | දන්ත කාර්මික අභ්‍යාසලාභීන් | වසර 02 | ඉංග්‍රීසි |
| 11. | කීට විද්‍යා සහකාර අභ්‍යාසලාභීන් | වසර 02 | ඉංග්‍රීසි |
| 12. | පාසල් දන්ත චිකිත්සක අභ්‍යාසලාභීන් | වසර 02 | ඉංග්‍රීසි |

1. අ. පො. ස. (උ. පෙළ) විභාගයේ දී ලබා ගන්නා ලද Z අගය අනුව කුසලතා ලේඛන සකස් කර දීප ව්‍යාප්ත කුසලතාවය මත 30%ක් ද, පළාත් කුසලතාවය මත 70% ක් ද වන ලෙස සුදුස්සන් තෝරා ගනු ලැබේ. පුහුණු පාඨමාලාවන්ට එම පළාත්වලින් බඳවාගත හැකි අභ්‍යාසලාභීන් සංඛ්‍යාව එම පළාතේ පවතින රේඛීය අමාත්‍යාංශයට හා පළාත් සභාවට අයත් රෝහල් හා ආයතනවල පවතින පුරප්පාඩු ප්‍රමාණය පදනම් කර ගනිමින් තෝරාගනු ලැබේ.

එක් පාඨමාලාවක් සඳහා අ. පො. ස. (උ. පෙළ) විභාගයේ Z අගය පදනම් කරගෙන වර්ෂ කිහිපයක උසස් පෙළ සමතුන්ගෙන් අයදුම්පත් කැඳවා ඇති අවස්ථාවක දී, පුහුණුව සඳහා අවශ්‍ය මුළු අභ්‍යාසලාභීන් සංඛ්‍යාව තෝරා ගැණෙනුයේ සියලු වර්ෂවල සුදුසුකම්ලත් මුළු අයදුම්කරුවන්ගේ එකතුවෙන් ඒ ඒ වර්ෂවල සුදුසුකම්ලත් අයදුම්කරුවන්ගේ ප්‍රතිශතයක් වශයෙනි.

2. පාඨමාලාවන් දෙකක් හෝ ඊට වැඩියෙන් අයදුම් කරන්නන් මෙහි අවසානයේ දක්වා ඇති ආකෘතියට අනුව එක් මනාප ප්‍රකාශයක් සකස් කර ඒ ඒ පාඨමාලාවන් සඳහා තම මනාපය අංක එකේ සිට අනුපිළිවෙලින් සඳහන් කළ යුතු ය. එසේ මනාපය අනුව පුහුණු පාඨමාලාව ලබා දිය

නොහැකි අවස්ථාවල අයදුම්කරුවන් පළමුව තේරී පත් වන පාඨමාලාවට ඇතුළත් විය යුතු අතර, ඔවුන්ට ඊළඟ පාඨමාලාවට ඇතුළත්වීමට හෝ වෙනත් පාඨමාලාවකට මාරුවීමට හෝ අවස්ථාව ලබා දෙනු නොලැබේ.

3. මෙම පාඨමාලාවන් පූර්ණකාලීන පාඨමාලාවන් වේ. එබැවින් සතියේ දින පහේ සහ සෙනසුරාදා පෙරවරුවේ විශ්වවිද්‍යාලයක හෝ සෞඛ්‍ය අමාත්‍යාංශය යටතේ හෝ වෙනත් රජයේ ආයතනයක හෝ වෙනත් කුමන හෝ පූර්ණකාලීන පාඨමාලාවන් හදාරන සිසුන් මේ සඳහා අයදුම් නොකළ යුතුය. යමෙකු එසේ අයදුම් කර පසු අවස්ථාවක දී හෝ එය අනාවරණය වුවහොත් පාඨමාලාවෙන්/තනතුරෙන් ඉවත් කර ඒ වනතෙක් රජය විසින් ඔහු/ඇය වෙනුවෙන් දරා ඇති සියලුම වියදම් අයකර ගනු ලැබේ. විශ්වවිද්‍යාලයක පූර්ණකාලීන පාඨමාලාවක් හදාරන අයෙකු එසේ අයදුම් කිරීමට අදහස් කරන්නේ නම් ඒ සඳහා පහත දැක්වෙන ආකාරයට ක්‍රියා කළ යුතුය. සෞඛ්‍ය අමාත්‍යාංශය යටතේ පූර්ණකාලීන පුහුණු පාඨමාලාවල ලියාපදිංචි වී සිටින අයගේ අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

3.1 කිසියම් දිනක ඔබ කුමන හෝ විශ්වවිද්‍යාලයක හෝ වෙනත් රජයේ ආයතනයක පූර්ණකාලීන පාඨමාලාවක් සඳහා ලියාපදිංචිව සිටියේ නම් හෝ සිටින්නේ නම් පාඨමාලාවට බඳවාගන්නා දින වන විට ඔබ එම ලියාපදිංචිය අවලංගු කරගෙන තිබිය යුතුය. ඔබ විශ්වවිද්‍යාලයක ලියාපදිංචිව සිට දේශන සඳහා සහභාගි නොවූ හෝ සහභාගි නොවන අයෙක් වුව ද ඔබ විශ්වවිද්‍යාල සිසුවෙකු ලෙස සලකනු ලබන බැවින් එවැනි අයදුම්කරුවන් ද තම ලියාපදිංචිය අවලංගු කරගත යුතුය. අවශ්‍ය අවස්ථාවල දී එය සනාථ කිරීම පිණිස ප්‍රමාණවත් ලිඛිත සාධක ඔබ සතුව තිබිය යුතුය.

3.2 ඔබ යම් විශ්වවිද්‍යාලයක උපාධියක් සම්පූර්ණ කර සිටින අයෙක් නම් එම උපාධිය බලපැවැත්වෙන දිනය (Effective Date) පාඨමාලාවට බඳවා ගන්නා දිනට පෙර දිනයක් විය යුතුය.

*සැලකිය යුතුය :-*

* ඉහත 3.1 සිට 3.2 දක්වා සඳහන් කොන්දේසි සියල්ල සම්පූර්ණ කර තිබේනම් අනිවාර්යයෙන්ම ඔබ අයදුම් කරන පාඨමාලාව සඳහා ඇතුළත් කර ගන්නේ ය යන්න මෙම ගැසට් නිවේදනයේ කුමන හෝ වගන්තියක් මඟින් අදහස් නොකෙරෙන බව ඔබ තරයේ සිහි තබාගත යුතුය.

* එම 3.1 සිට 3.2 දක්වා සඳහන් කොන්දේසි සම්පූර්ණ කර තිබුණ ද ඔබ සුදුසුකම් ලැබීමට ප්‍රමාණවත් Z අගයක් ලබා නොමැති නම් හෝ මෙහි සඳහන් අනෙකුත් කුමන හෝ කොන්දේසියක් සම්පූර්ණ කර නොමැති නම් කිසිදු අයුරකින් මෙම පාඨමාලාවන් සඳහා සුදුසුකම් නොලබන බව ඔබ දැනගත යුතුය.

* එමෙන්ම ඔබ ප්‍රමාණවත් Z අගයක් ලබා මෙහි සඳහන් අනෙකුත් කොන්දේසි සියල්ල සම්පූර්ණ කර තිබුණ ද 3.1 සිට 3.2 දක්වා සඳහන් කොන්දේසි සම්පූර්ණ කර නොමැති නම් කිසිදු අයුරකින් මෙම පාඨමාලාවන් සඳහා සුදුසුකම් නොලබන බව ඔබ තවදුරටත් දැනගත යුතුය.

4. *අධ්‍යාපන හා තනතුරට අදාළ වෙනත් විශේෂ සුදුසුකම් :-*

| *සංකේත අංකය* | *පුහුණු පාඨමාලාව* | *අ. පො. ස. (සා. පෙළ) සුදුසුකම්* | *අ. පො. ස. (උ. පෙළ) සුදුසුකම්* | *පුහුණු පාඨමාලාවට අදාළ වෙනත් විශේෂ සුදුසුකම්* |
|---|---|---|---|---|
| 1 | වෛද්‍ය රසායනාගාර කාර්මික විද්‍යාඥ | සිංහල භාෂාව/දෙමළ භාෂාව, ගණිතය, විද්‍යාව සහ තවත් එක් විෂයයකට අවම වශයෙන් සම්මාන සාමාර්ථ සහිතව ඉංග්‍රීසි භාෂාව ද ඇතුළුව දෙවරකට නොවැඩි වාර ගණනක දී විෂයයන් හයකින් අ. පො. ස. (සා. පෙළ) සමත්වීම | අ. පො. ස. (උ. පෙළ) විභාගයෙන් **රසායන විද්‍යාව** විෂයයට සම්මාන සාමාර්ථ සහිතව භෞතික විද්‍යාව, ජීව විද්‍යාව, කෘෂි විද්‍යාව, සංයුක්ත ගණිතය යන විෂයයන් අතුරින් දෙකක් එක්වරක දී සමත්වීම | නැත |
| 2 | ඖෂධවේදී | සිංහල භාෂාව/දෙමළ භාෂාව, ගණිතය, විද්‍යාව සහ තවත් එක් විෂයයකට අවම වශයෙන් සම්මාන සාමාර්ථ සහිතව ඉංග්‍රීසි භාෂාව ද ඇතුළුව දෙවරකට නොවැඩි වාර ගණනක දී විෂයයන් හයකින් අ. පො. ස. (සා. පෙළ) සමත්වීම | අ. පො. ස. (උ. පෙළ) විභාගයෙන් **රසායන විද්‍යාව** විෂයයට සම්මාන සාමාර්ථ සහිතව භෞතික විද්‍යාව, ජීව විද්‍යාව, කෘෂි විද්‍යාව, සංයුක්ත ගණිතය යන විෂයයන් අතුරින් දෙකක් එක්වරක දී සමත්වීම | නැත |
| 3 | භෞත චිකිත්සක | සිංහල භාෂාව/දෙමළ භාෂාව, ගණිතය, විද්‍යාව සහ තවත් එක් විෂයයකට අවම වශයෙන් සම්මාන සාමාර්ථ සහිතව ඉංග්‍රීසි භාෂාව ද ඇතුළුව දෙවරකට නොවැඩි වාර ගණනක දී විෂයයන් හයකින් අ. පො. ස. (සා. පෙළ) සමත්වීම | අ. පො. ස. (උ. පෙළ) විභාගයෙන් **භෞතික විද්‍යාව** විෂයයට සම්මාන සාමාර්ථ සහිතව රසායන විද්‍යාව, ජීව විද්‍යාව, කෘෂි විද්‍යාව, සංයුක්ත ගණිතය යන විෂයයන් අතුරින් දෙකක් එක් වරක දී සමත්වීම | නැත |

| සංකේත අංකය | පුහුණු පාඨමාලාව | අ. පො. ස. (සා. පෙළ) සුදුසුකම් | අ. පො. ස. (උ. පෙළ) සුදුසුකම් | පුහුණු පාඨමාලාවට අදාළ වෙනත් විශේෂ සුදුසුකම් |
|---|---|---|---|---|
| 4 | වෘත්තීය චිකිත්සක | සිංහල භාෂාව/දෙමළ භාෂාව, ගණිතය, විද්‍යාව සහ තවත් එක් විෂයයකට අවම වශයෙන් සම්මාන සාමාර්ථ සහිතව ඉංග්‍රීසි භාෂාව ද ඇතුළුව දෙවරකට නොවැඩි වාර ගණනකදී විෂයයන් හයකින් අ. පො. ස. (සා. පෙළ) සමත්වීම | අ. පො. ස. (උ. පෙළ) විභාගයෙන් **භෞතික විද්‍යාව** විෂයයට සම්මාන සාමාර්ථ සහිතව රසායන විද්‍යාව, ජීව විද්‍යාව, කෘෂි විද්‍යාව, සංයුක්ත ගණිතය යන විෂයයන් අතුරින් දෙකක් එක් වරක දී සමත්වීම | නැත |
| 5 | විකිරණ ශිල්පී | සිංහල භාෂාව/දෙමළ භාෂාව, ගණිතය, විද්‍යාව සහ තවත් එක් විෂයයකට අවම වශයෙන් සම්මාන සාමාර්ථ සහිතව ඉංග්‍රීසි භාෂාව ද ඇතුළුව දෙවරකට නොවැඩි වාර ගණනක දී විෂයයන් හයකින් අ. පො. ස. (සා. පෙළ) සමත්වීම | අ. පො. ස. (උ. පෙළ) විභාගයෙන් එක් වරකදී **භෞතික විද්‍යාව** විෂයයට සම්මාන සාමාර්ථ සහිතව රසායන විද්‍යාව, ජීව විද්‍යාව, කෘෂි විද්‍යාව, සංයුක්ත ගණිතය යන විෂයයන් අතුරින් දෙකක් එක් වරක දී සමත්වීම | නැත |
| 6 | මහජන සෞඛ්‍ය පරීක්ෂක | සිංහල භාෂාව/දෙමළ භාෂාව, ගණිතය, විද්‍යාව සහ තවත් එක් විෂයයකට අවම වශයෙන් සම්මාන සාමාර්ථ සහිතව ඉංග්‍රීසි භාෂාව ද ඇතුළුව දෙවරකට නොවැඩි වාර ගණනක දී අ. පො. ස. (සා. පෙළ) සමත්වීම | අ. පො. ස. (උ. පෙළ) විභාගයෙන් **ජීව විද්‍යාව හෝ සංයුක්ත ගණිතය** විෂයයට සම්මාන සාමාර්ථයක් සහිතව භෞතික විද්‍යාව, රසායන විද්‍යාව, කෘෂි විද්‍යාව යන විෂයයන් අතුරින් දෙකක් එක්වරක දී සමත්වීම | * අයදුම් කළ හැක්කේ පුරුෂ පක්ෂයට පමණි<br>* උස අඩි 5 අඟල් 2ක් හෝ ඊට වැඩි විය යුතුය. |
| 7 | බන්තු රේඛන ශිල්පී | සිංහල භාෂාව/දෙමළ භාෂාව, ගණිතය, විද්‍යාව සහ තවත් එක් විෂයයකට අවම වශයෙන් සම්මාන සාමාර්ථ සහිතව ඉංග්‍රීසි භාෂාව ද ඇතුළුව දෙවරකට නොවැඩි වාර ගණනක දී විෂයයන් හයකින් අ. පො. ස. (සා. පෙළ) සමත්වීම | අ. පො. ස. (උ. පෙළ) විභාගයෙන් **ජීව විද්‍යාව** විෂයයට සම්මාන සාමාර්ථ සහිතව රසායන විද්‍යාව, භෞතික විද්‍යාව, යන විෂයයන් අතුරින් දෙකක් එක්වරක දී සමත්වීම | නැත |
| 8 | විද්‍යුත් නිකර්පණ රේඛන සටහන්කරු | සිංහල භාෂාව/දෙමළ භාෂාව, ගණිතය, විද්‍යාව සහ තවත් එක් විෂයයකට අවම වශයෙන් සම්මාන සාමාර්ථ සහිතව ඉංග්‍රීසි භාෂාව ද ඇතුළුව දෙවරකට නොවැඩි වාර ගණනක දී විෂයයන් හයකින් අ. පො. ස. (සා. පෙළ) සමත්වීම. | අ. පො. ස. (උ. පෙළ) විභාගයෙන් **ජීව විද්‍යාව** විෂයයට සම්මාන සාමාර්ථ සහිතව රසායන විද්‍යාව, භොතික විද්‍යාව, යන විෂයයන් අතුරින් දෙකක් එක්වරක දී සමත්වීම | නැත |
| 9 | අක්ෂි තාක්ෂණවේදී | සිංහල භාෂාව/දෙමළ භාෂාව, ගණිතය, විද්‍යාව සහ තවත් එක් විෂයයකට අවම වශයෙන් සම්මාන සාමාර්ථ සහිතව ඉංග්‍රීසි භාෂාව ඇතුළුව දෙවරකට නොවැඩි වාර ගණනක දී විෂයයන් හයකින් අ. පො. ස. (සා. පෙළ) සමත්වීම. | අ. පො. ස. (උ. පෙළ) විභාගයෙන් **භෞතික විද්‍යාව** විෂයයට සම්මාන සාමාර්ථ සහිතව රසායන විද්‍යාව, ජීව විද්‍යාව, කෘෂි විද්‍යාව යන විෂයයන් අතුරින් දෙකක් එක්වරක දී සමත්වීම | නැත |
| 10 | දන්ත කාර්මික | සිංහල භාෂාව/දෙමළ භාෂාව, ගණිතය, විද්‍යාව සහ තවත් එක් විෂයයකට අවම වශයෙන් සම්මාන සාමාර්ථ සහිතව ඉංග්‍රීසි භාෂාව ද ඇතුළුව දෙවරකට නොවැඩි වාර ගණනක දී විෂයයන් හයකින් අ. පො. ස. (සා. පෙළ) සමත්වීම. | අ. පො. ස. (උ. පෙළ) විභාගයෙන් **රසායන විද්‍යාව** විෂයයට සම්මාන සාමාර්ථ සහිතව භෞතික විද්‍යාව, ජීව විද්‍යාව, කෘෂි විද්‍යාව, සංයුක්ත ගණිතය යන විෂයයන් අතුරින් දෙකක් එක්වරක දී සමත්වීම | නැත |

| සංකේත අංකය | පුහුණු පාඨමාලාව | අ. පො. ස. (සා. පෙළ) සුදුසුකම් | අ. පො. ස. (උ. පෙළ) සුදුසුකම් | පුහුණු පාඨමාලාවට අදාළ වෙනත් විශේෂ සුදුසුකම් |
| --- | --- | --- | --- | --- |
| 12 | පාසල් දන්ත චිකිත්සක | සිංහල භාෂාව/දෙමළ භාෂාව, ගණිතය, විද්‍යාව සහ තවත් එක් විෂයයකට අවම වශයෙන් සම්මාන සාමාර්ථ සහිතව ඉංග්‍රීසි භාෂාව ද ඇතුළුව දෙවරකට නොවැඩි වාර ගණනක දී විෂයයන් හයකින් අ. පො. ස. (සා. පෙළ) සමත්වීම. | 2011 හා 2012 යන වර්ෂවලින් එකක දී අ. පො. ස. (උ. පෙළ) විභාගයෙන් ජීව විද්‍යාව විෂයයට සම්මාන සාමාර්ථ සහිතව රසායන විද්‍යාව, භෞතික විද්‍යාව, කෘෂි විද්‍යාව යන විෂයයන් අතුරින් දෙකක් එක්වරක දී සමත්වීම. | * අයදුම් කළ හැක්කේ ස්ත්‍රී පක්ෂයට පමණි.<br>* උස අඩි 4 අඟල් 10ක් හෝ ඊට වැඩි විය යුතුය.<br>* සියලුම අයදුම්කාරියන් අවිවාහක විය යුතු ය. |

5. *අනෙකුත් පොදු සුදුසුකම් :-*

(අ) 2014.04.28 දිනට වයස අවුරුදු 18ට නොඅඩු, වයස අවුරුදු 30ට නොවැඩි අදාළ සුදුසුකම් සපුරන අ. පො. ස. (උ. පෙ.) සමතුන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ. (වර්ෂය අදාළ නොවේ.)

(ආ) පුහුණුවෙන් පසු බඳවා ගන්නා පළාත තුළ අවම වශයෙන් වසර 10ක් වත් සේවය කිරීමට කැමැති විය යුතුය.

(ඇ) මනා ශාරීරික හා මානසික සෞඛ්‍ය තත්ත්වයකින් යුක්ත විය යුතුය.

(ඈ) තමන් අයදුම් කරන දිස්ත්‍රික්කය තුළ අයදුම්පත් භාර ගන්නා අවසන් දිනට පූර්වාසන්න වසර 3ක් අඛණ්ඩව පදිංචිව සිටිය යුතුය.

6. *අයදුම් කළ යුතු ක්‍රමය :*

(අ) මේ සමඟ ඇති ආකෘති පත්‍රය අනුව අයදුම්පත සකස් කර ගත යුතු ය. ඒ සඳහා ඒ4 ප්‍රමාණයේ කඩදාසි භාවිතා කළ යුතු ය. අයදුම්පතේ 1 සිට 10(අ) දක්වා පළමු පිටුවේ ද, 10(ආ) සිට 13 දක්වා දෙවන පිටුවේ ද වන පරිදි සකස් කළ යුතු ය. පුහුණු පාඨමාලා දෙකක් හෝ කිහිපයක් සඳහා අයදුම් කරන්නේ (නම් එවැනි අයදුම්කරුවන් එක් අයදුම්පත්‍රයක් පමණක් ඉදිරිපත් කළ යුතුය. එවැනි අවස්ථාවක දී අංක 2 වගන්තියේ සඳහන් පරිදි සකස් කරන ලද එක් මනාප ප්‍රකාශයක් සමඟම තමන් ඉල්ලුම් කරනු ලබන පාඨමාලාවල සංකේත අංක අයදුම්පතෙහි මුල් පිටුවෙහි අදාළ ස්ථානයෙහි සඳහන් කළ යුතු ය. (පුහුණු පාඨමාලාවට අදාළ සංකේත අංක මනාප ප්‍රකාශයෙහි සඳහන් වේ.)

(ආ) අයදුම්පතෙහි "මුද්දර" යන ස්ථානයේ ඉල්ලුම් කරනු ලබන පාඨමාලා සංඛ්‍යාවට අනුරූපව පහත සඳහන් පරිදි අදාළ වටිනාකමින් යුතු මුද්දර නොගැලවෙනසේ අලවා තම අත්සන ඒ මත යොදා එය අවලංගු කළ යුතු ය. ඔබ විසින් ඉල්ලුම් කරනු ලබන පාඨමාලා සංඛ්‍යාවට අනුරූප වටිනාකමින් යුක්ත මුද්දර ඇලවීම අනිවාර්යය වේ.

| | | |
| --- | --- | --- |
| පාඨමාලාවන් 01 සඳහා | - | රු. 300 |
| පාඨමාලාවන් 02 සඳහා | - | රු. 500 |
| පාඨමාලාවන් 03 සඳහා | - | රු. 800 |
| පාඨමාලාවන් 04 සඳහා | - | රු. 1,100 |
| පාඨමාලාවනස් 05ක් හෝ ඊට වැඩි | - | රු. 1,400 |

(ඇ) ශ්‍රී ලංකා පරිපාලන සේවයේ නිලධාරියෙකු/අධ්‍යාපන පරිපාලන සේවයේ නිලධාරියෙකු/රජයේ ගණකාධිකාරී සේවයේ නිලධාරියෙකු/රජයේ විදුහල්පතිවරයෙකු/සාමදාන විනිශ්වයකාරවරයෙකු/නීතිඥවරයෙකු හෝ වර්ෂයකට රු. 2,40,360කට නොඅඩු වැටුපක් ලබන ස්ථිර විශ්‍රාම වැටුප් සහිත තනතුරක් දරන රජයේ නිලධාරියෙකු විසින් අයදුම්කරුගේ/අයදුම්කාරියගේ අත්සන සහතික කළ යුතු ය.

(ඈ) නිසි පරිදි සම්පූර්ණ කරන ලද අයදුම්පත් සමඟ මනාප ප්‍රකාශයක් අමුණා එම කවරයේ ඉහළ වම් කෙළවරේ "පරිපූරක හා අතුරු වෛද්‍ය සේවාවන්හි පුහුණුව සඳහා අභ්‍යාසලාභීන් බඳවා ගැනීම - 2014" යනුවෙන් සඳහන් කර, ඊට පහළින් ඔබ ඉල්ලුම් කරන පළාත හා දිස්ත්‍රික්කය සඳහන් කොට 2014.04.28 දිනට පෙර අධ්‍යක්‍ෂ (පාලන) 02, සෞඛ්‍ය අමාත්‍යාංශය, "සුවසිරිපාය", 385, පූජ්‍ය බද්දේගම විමලවංශ හිමි මාවත, කොළඹ 10 වෙත ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතු ය.

7. රජයේ හෝ අර්ධ රාජ්‍ය ආයතනවල සේවකයින්ගේ අයදුම්පත් ඔවුන්ගේ දෙපාර්තමේන්තු ප්‍රධානියා මඟින් එවිය යුතු ය. එමෙන්ම මෙය බාහිර බඳවා ගැනීමක් බව සිහි තබාගත යුතු ය.

8. අයදුම්පත් ලැබුණු බව දන්වා එවනු නොලැබේ.

9. නියමිත දිනට පසුව ලැබෙන අයදුම්පත් භාරගනු නොලැබේ.

10. මෙම නිවේදනයේ දැක්වෙන නියමයන්ට හා අදාළ ආකෘතියට අනුකූල නොවන අයදුම්පත් දැනුම්දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ.

11. ඉහත සුදුසුකම් සපුරා ඇති අයදුම්කරුවන්/අයදුම්කාරියන් අතරින් Z අගය අනුව සකස් කරනු ලබන ප්‍රමුඛතා ලේඛනයක් පදනම් කරගෙන තෝරාගත් පිරිසක් පමණක් සෞඛ්‍ය අමාත්‍යාංශයේ (මාණ්ඩලික නිලධාරීන් හා වෙනත් අමාත්‍යාංශයක මාණ්ඩලික නිලධාරීයෙකුගේ නියෝජනයෙන් යුතු සම්මුඛ පරීක්ෂණයට කැඳවනු ලැබේ. සම්මුඛ පරීක්ෂණයේ දී අයදුම්කරුවන්/අයදුම්කාරියන් විසින් පහත සඳහන් ලියවිලිවල මුල් පිටපත් ඉදිරිපත් කළ යුතුය. :-

(අ) උප්පැන්න සහතිකය,

(ආ) අ. පො. ස. (උ. පෙළ) විභාග ප්‍රතිඵල හා Z අගය දැක්වෙන සහතිකයේ මුල් පිටපත (මෙහි සහතික කළ පිටපතක් අයදුම්පත සමඟ ද අමුණා එවිය යුතු ය.),

(ඇ) අ. පො. ස. (සා. පෙළ) විභාග ප්‍රතිඵල දැක්වෙන සහතිකයේ මුල් පිටපත,

(ඈ) පුද්ගලයන් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුවෙන් නිකුත් කරන ලද ජාතික හැඳුනුම්පත හෝ වලංගු විදේශ ගමන් බලපත්‍රය හෝ රියැදුරු බලපත්‍රය (මෙහි සහතික කළ පිටපතක් අයදුම්පත සමඟ ද අමුණා එවිය යුතු ය.),

(ඉ) ඉහත 5 (ඈ) අනුව පදිංචිය සනාථ කිරීම සඳහා ප්‍රාදේශීය ලේකම් විසින් අනු අත්සන් කරන ලද ග්‍රාම නිලධාරි විසින් නිකුත් කරන ලද පදිංචිය පිළිබඳ සහතිකය ( ග්‍රාම නිලධාරී සහතිකය),

(ඊ) අවිවාහක බව සනාථ කිරීම සඳහා සාමදාන විනිශ්චයකරුවෙකු ඉදිරියේ අත්සන් කරන ලද විධිමත් දිවුරුම් ප්‍රකාශයක් (මෙය පාසල් දන්ත චිකිත්සක පුහුණුවට අයදුම් කරන අයදුම්කාරියන්ට පමණක් අදාළ වේ.)

12. *පුහුණු කිරීමේ පටිපාටිය :*

(i) සම්මුඛ පරීක්ෂණයට ලක් කරන ලද අයදුම්කරුවන් අතරින් තෝරාගත් අයදුම්කරුවන්/අයදුම්කාරියන් අදාළ පුහුණු පාඨමාලාව හැදෑරීම සඳහා ඒ ඒ පුහුණු පාසල්වලට ඇතුළත් කරනු ලැබේ. පාඨමාලාවන් ඉංග්‍රීසි/සිංහල/දෙමළ මාධ්‍යයෙන් හැදෑරිය යුතු ය.

(ii) පුහුණු පාසල්වලට ඇතුළත් කරන අභ්‍යාසලාභීන් පුහුණු පාසල්වල බල පැවැත්වෙන නීති රීතිවලට හා සෞඛ්‍ය අමාත්‍යාංශය මඟින් කලින් කලට පනවනු ලබන වෙනත් නියෝගවලට ද යටත් වනු ඇත.

(iii) පුහුණුව ලබන කාල පරිච්ඡේදය තුළ නියමිත විභාගවලින් අසමත් වන හෝ වැඩ හා හැසිරීම සතුටුදායක නොවන හෝ තමන් ඇතුලත් කරනු ලබන පුහුණු පාසලෙහි විභාග හා නිවාඩුවලට අදාළ කොන්දේසි පිළිපැදීමට අපොහොසත් වන අභ්‍යාසලාභීන්ගේ පුහුණුව ඕනෑම අවස්ථාවක දී වන්දි ගෙවීමකින් තොරව අවසන් කළ හැකි ය.

(iv) පුහුණුව ලබන කාල පරිච්ඡේදය තුළ දී අභ්‍යාසලාභීන්ට රු. 12,360 ක මාසික දීමනාවක් ගෙවනු ලැබේ.

(v) පුහුණු පාසලට ඇතුළත් කරනු ලබන අවස්ථාවේ දී පුහුණුව සාර්ථකව නිම කරන බවටත්, පුහුණු පාඨමාලාව අත්හැර නොයන බවටත්, එකී පුහුණුව සම්පූර්ණයෙන්ම නිම කිරීමෙන් පසු අදාළ තනතුරේ පත්වීම් ලදහොත් අවම වශයෙන් වර්ෂ දහයක (10) කාලපරිච්ඡේදයක් අදාළ පළාතේ අදාළ තනතුරේ සේවය කරන බවටත්, සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ ජනරාල් සමඟ ගිවිසුමකට හා ඇපකරයකට එළඹිය යුතු ය. පුහුණු කාලසීමාව තුළදී පුහුණුවෙන් ඉවත් වුවහොත්, පුහුණුව හැරගියහොත්, ඉහත III වගන්තිය අනුව පුහුණුවෙන් ඉවත් කිරීමට සිදුවුවහොත් හෝ පත්වීම් ලැබ වර්ෂ දහයක (10) කාලපරිච්ඡේදයක් සෞඛ්‍ය අමාත්‍යාංශයේ අදාළ තනතුරේ සේවය කිරීමට අපොහොසත් වුවහොත් පුහුණු කාලය තුළදී ඔහුට/ඇයට ගෙවන ලද දීමනාව, රජය විසින් දරන ලද වියහියදම් හා ඇපකරයට අදාළ මුදල ඔහු/ඇය විසින් සෞඛ්‍ය අමාත්‍යාංශයට ගෙවිය යුතු ය. එසේ නොමැති වුවහොත් එම මුදල් අයකර ගැනීමට ගිවිසුම් ප්‍රකාරව නීත්‍යානුකූලව කටයුතු කිරීමට පියවර ගනු ඇත.

13. *සේවයේ නියුක්ත කරවීමේ නියමයන් :*

පුහුණුව අවසානයේ ස්ථිර පත්වීම් ප්‍රදානය කිරීමට රජය බැඳී නොසිටී. එහෙත් අපේක්ෂක/අපේක්ෂිකාවන් තමන් පුහුණුවට බඳවාගත් පාඨමාලාවට අදාළ බඳවා ගැනීමේ පරිපාටියේ කොන්දේසි හා පළාතේ පවත්නා පුරප්පාඩු මත අදාළ තනතුරේ III වැනි පංතියේ තනතුරට පත්කිරීම සඳහා සලකා බලනු ලැබේ. මුල් පත්වීමේ සිට වසර දහයක් යනතෙක් මුල් පත්වීම් ලබන පළාතේ සේවය කිරීම අනිවාර්යය වේ.

එක් එක් පාඨමාලාවන් අවසානයේ දී පැවැත්වෙන අවසන් ලිඛිත පරීක්ෂණයේ ප්‍රතිඵල මත සකස් කරනු ලබන කුසලතා ලේඛනය පදනම් කරගෙන සහ ඉහත පළාත් මට්ටමෙන් බඳවාගනු ලැබූ 70% ක ප්‍රතිශතය හා දීප ව්‍යාප්ත කුසලතාවය මත බඳවාගනු ලැබූ 30%ක ප්‍රතිශතය ද සැලකිල්ලට ගෙන පුරප්පාඩු පවතින ආයතන වෙත පත්වීම් ලබාදීමට සලකා බැලීම සිදුකෙරේ.

14. අයදුම්පත පිරවීමේ දී අධ්‍යාපන හා අනෙකුත් සුදුසුකම් පිළිබඳ විස්තර ඉතා සැලකිලිමත්ව හා නිවැරදිව ඇතුළත් කළ යුතුය. පුහුණුව සඳහා බඳවා ගැනීමෙන් හෝ පත්වීම් ලැබීමෙන් පසු යට කී සහතික ව්‍යාජ බවට ඔප්පු වුවහොත්, නීත්‍යානුකූලව කටයුතු කිරීම සඳහා අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව වෙත යොමු කිරීමටත්, ඒ දෙනු ලබන පත්වීම අවලංගු කර පුහුණුවෙන්/තනතුරින් පහකරන අතර ඒ සම්බන්ධයෙන් විනයානුකූලව කටයුතු කර නැවත රජයේ සේවයට නොගන්නවුන්ගේ අසාධු ලේඛනයට ඔහුගේ/ඇයගේ නම ඇතුළත් කිරීමටත් කටයුතු කරනු ලැබේ. තව ද පුහුණු කාලය තුළ දී ඔහුට/ඇයට ගෙවන ලද දීමනාව, රජය විසින් දරන ලද වියහියදම් හා ඇපකරයට අදාළ මුදල ඔහුගෙන්/ඇයගෙන් අයකර ගැනීමට කටයුතු කරනු ලැබේ.

15. තෝරාගත් අයදුම්කරුවන් අදාළ පාඨමාලාව හැදෑරීමට හා දිවයිනේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමට කායික හා මානසික යෝග්‍යතාවයකින් හෙබි බව සනාථ කරනු පිණිස පුහුණුවේ පළමු මාසය ඇතුළත වෛද්‍ය පරීක්ෂණයකට පෙනී සිටිය යුතු අතර, වෛද්‍ය පරීක්ෂණයේ දී අයෝග්‍ය බව පෙනී යන අයදුම්කරුවන් පාඨමාලාවේ රැඳී සිටීමට නුසුදුස්සන් වනු ඇත.

16. ඉහත පරිදි බඳවාගන්නා ලද සියලුම දෙනා රජයේ සේවකයින්ට අදාළ වන සියලුම නීතිරීති, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහයේ විධිවිධානයන්ට, සෞඛ්‍ය අමාත්‍යාංශය විසින් නියම කරනු ලබන ප්‍රතිපත්තිවලට, මුදල් රෙගුලාසි හා වෙනත් රෙගුලාසිවලට ද, රජය වරින් වර පනවනු ලබන නීතිරීති හා නියෝගයන්ට ද යටත් වනු ඇත.

17. පුහුණුවට බඳවා ගැනීම සම්බන්ධයෙන් මෙම ගැසට් නිවේදනය මඟින් ආවරණය වන හෝ නොවන යම් කරුණක් සම්බන්ධයෙන් යම් ගැටළු සහගත තත්ත්වයක් උදා වුවහොත්, ඒ පිළිබඳව සෞඛ්‍ය අමාත්‍යාංශයේ ලේකම්ගේ තීරණය අවසන් තීරණය වනු ඇත. මෙම ගැසට් නිවේදනයේ සිංහල, දෙමළ හා ඉංග්‍රීසි පාඨ අතර යම් පරස්පරතාවයක් ඇති වුවහොත් එවිට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු වන්නේ ය.

18. පුහුණුවට බඳවාගනු ලබන අයදුම්කරුවන් සඳහා පුහුණු පාසල්වල නේවාසික පහසුකම් සැපයීමට මෙම අමාත්‍යාංශය බැඳී නොසිටී. එසේ ලබාදෙන්නේ නම්, ඒ සඳහා තක්සේරු නිවාස කාමර කුලිය, ජල හා විදුලි බිල්පත් අයකරනු ලැබේ.

19. මෙම පුහුණු කාලසීමාව තුළ දී වෘත්තීය සමිති කටයුතුවල යෙදීම හෝ පෞද්ගලික සේවයේ යෙදීමට හෝ කිසිම අයිතිවාසිකමක් නොමැත. එසේම පුහුණුවෙන් පසුව ඔබ අදාළ තනතුරේ පත්වීම් ලදහොත් ඉන් පසුව ද පෞද්ගලික සේවයේ යෙදීමට ඔබට කිසිදු අයිතිවාසිකමක් නොමැත. එවැන්නක් සිදුකර අනාවරණය වුවහොත් නීත්‍යානුකූලව කටයුතු කිරීමට පියවර ගනු ලැබේ.

වෛද්‍ය වයි. ඩී. නිහාල් ජයතිලක,
ලේකම්,
සෞඛ්‍ය අමාත්‍යාංශය.

2014 මාර්තු මස 10 වැනි දින,
සෞඛ්‍ය අමාත්‍යාංශය,
"සුවසිරිපාය",
අංක 385, පූජ්‍ය බද්දේගම විමලවංශ හිමි මාවත,
කොළඹ 10.

**පුහුණු පාඨමාලාවන් සඳහා මනාප ප්‍රකාශය**

| *සංකේත අංකය* | *පුහුණු පාඨමාලාවේ නම* | *මනාපය* |
|---|---|---|
| 1 | වෛද්‍ය රසායනාගාර කාර්මික විද්‍යාඥ | |
| 2 | ඖෂධවේදී | |
| 3 | භෞත චිකිත්සක | |
| 4 | වෘත්තීය චිකිත්සක | |
| 5 | විකිරණ ශිල්පී | |
| 6 | මහජන සෞඛ්‍ය පරීක්ෂක | |
| 7 | ඛන්තු රේඛන ශිල්පී | |
| 8 | විද්‍යුත් නිකර්පණ රේඛන සටහන්කරු | |
| 9 | අක්ෂි තාක්ෂණවේදී | |
| 10 | දන්ත කාර්මික | |
| 11 | කීට විද්‍යා සහකාර | |
| 12 | පාසල් දන්ත චිකිත්සක | |

එක් එක් පුහුණු පාඨමාලාවන් සඳහා මගේ මනාපය ඉහත වගුවෙහි දක්වා ඇත. මෙම මනාප ප්‍රකාශය කිසිදු අයුරකින් යළි වෙනස් කළ නොහැකි බව මා දන්නා බවත්, මෙම මනාප ප්‍රකාශයට අමතරව කිසිඳු මනාප ප්‍රකාශයක් මා ඉදිරිපත් කර නොමැති බවත්, ඉහත සඳහන් පරිදි මා මනාප ප්‍රකාශයක් ඉදිරිපත් කළද එම මනාපය අනුව පුහුණු පාඨමාලාවන්ට ඇතුළත් කළ නොහැකි අවස්ථාවකදී පළමුව තේරීපත්වන හෝ සෞඛ්‍ය අමාත්‍යාංශය මා වෙත තෝරා දෙන පුහුණු පාඨමාලාවට ඇතුලත් වීමට මට සිදුවන බව මා දන්නා බවත්, එයට කිසිඳු අයුරකින් විරුද්ධත්වයක් නොදක්වන බවත්, ගැසට් නිවේදනයේ සඳහන් සියළු වගන්ති අවබෝධයෙන් යුතුව කියවා තේරුම්ගත් බවත් දිවුරා ප්‍රකාශ කරමි.

————,
(අයදුම්කරුගේ අත්සන)

ජා. හැ. අංකය :————.

දිනය : 2014 ————.

**සාමදාන විනිශ්චයකාරතැනගේ සහතිකය.**

මෙම මනාප ප්‍රකාශය ඉදිරිපත් කරනු ලබන ………………………………. මයා/මිය/මෙනවිය මා පෞද්ගලිකවම දන්නා හඳුනන බවද, ඔහු/ඇය …………………… දින මා ඉදිරිපිටදී අවබෝධයෙන් යුතුව ඔහුගේ/ඇයගේ අත්සන තැබූ බව ද සහතික කරමි.

————,
සාමදාන විනිශ්චයකාරතැනගේ අත්සන.

දිනය :————.

සාමදාන විනිශ්චයකාරතැනගේ සම්පූර්ණ නම :————.

ලිපිනය :————. සාමදාන විනිශ්චයකාරතැනගේ නිල මුද්‍රාව :————.

ආදර්ශ අයදුම්පත්‍රය

**වෛද්‍ය කර්මය සඳහා වූ පරිපූරක වෘත්තීන්ගේ සේවාවේ හා අතුරු වෛද්‍ය සේවාවේ**
**පුහුණුව සඳහා අභ්‍යාසලාභීන් බඳවා ගැනීම - 2014**

(අයදුම්පත සම්පූර්ණ කිරීමට පෙර *ගැසට් නිවේදනය* හොඳින් කියවා බලන්න.)

* අයදුම්කරන පාඨමාලාව/පාඨමාලාවල සංකේත අංක (ගැසට් නිවේදනය අනුව) :-

| | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | | | | | | | | | |

1. (*අ*) මුලකුරු සමඟ අගට යෙදෙන නම :————.
(ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්) - *උදා :* A. B. C. SILVA

(*ආ*) සම්පූර්ණ නම (ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්) :————.

(*ඇ*) සම්පූර්ණ නම (සිංහලෙන්/දෙමළෙන්) :————.

2. ජාතික හැඳුනුම්පත් අංකය : | | | | | | | | | | | (පිටපතක් අමුණන්න)

3. තැපැල් ලිපිනය : සිංහලෙන්/දෙමළෙන් ඉංග්‍රීසියෙන්

| සිංහලෙන්/දෙමළෙන් | ඉංග්‍රීසියෙන් |
|---|---|
| …………………… | …………………… |
| …………………… | …………………… |
| …………………… | …………………… |
| …………………… | …………………… |

4. (*අ*) ස්ථිර ලිපිනය : සිංහලෙන්/දෙමළෙන් ඉංග්‍රීසියෙන්

| සිංහලෙන්/දෙමළෙන් | ඉංග්‍රීසියෙන් |
|---|---|
| …………………… | …………………… |
| …………………… | …………………… |
| …………………… | …………………… |
| …………………… | …………………… |

(*ආ*) දුරකථන අංක : ජංගම : | | | | | | | | | | | ස්ථාවර : | | | | | | | | | | |

(*ඇ*) පදිංචි දිස්ත්‍රික්කය : සිංහලෙන්/දෙමළෙන් :————. ඉංග්‍රීසියෙන් :————.

(*ඈ*) ඔබ මෙම දිස්ත්‍රික්කය තුළ ස්ථිර පදිංචිකරුවෙක්ද? ඔව්/නැත :————.

(ඉ) ඔව් නම් කොපමණ කලක පටන්ද? :————.

5. උපන් දිනය : වර්ෂය :————. මාසය :————. දිනය :————.

2014.04.28 වැනි දිනට වයස : අවුරුදු :————. මාස :————. දින :————.

6. උස : අඩි :————. අඟල් :————.

7. ස්ත්‍රී/පුරුෂ භාවය : ස්ත්‍රී ☐ පුරුෂ ☐ (අදාළ කොටුවේ ලකුණ යොදන්න)

8. ඔබ ශ්‍රී ලංකාවේ පුරවැසියෙක්ද යන වග : ඔව් ☐ නැත ☐ (අදාළ කොටුවේ ✓ ලකුණ යොදන්න)

9. විවාහක/ අවිවාහක බව : විවාහක ☐ අවිවාහක ☐

10. අධ්‍යාපන සුදුසුකම් :

(අ) අ. පො. ස. (උ. පෙළ) විභාගය (Z අගය සහිත ප්‍රතිඵල ලේඛනයේ සහතික කළ පිටපතක් අමුණන්න)

විභාගයට ඉදිරිපත්වූ දිස්ත්‍රික්කය :————.

විභාගයට පෙනී සිටි වර්ෂය :————. විභාග අංකය :————.

Z අගය :————.

| # | විෂයය | සාමාර්ථය |
|---|---|---|
| 1 | | |
| 2 | | |
| 3 | | |
| 4 | | |

(ආ) අ. පො. ස. (සා. පෙළ) විභාගය (ප්‍රතිඵල ලේඛනයේ සහතික කළ පිටපතක් අමුණන්න)

| # | විෂයය | පළමුවර | | දෙවනවර | |
|---|---|---|---|---|---|
| | | වර්ෂය | | වර්ෂය | |
| | | විභාග අංකය | | විභාග අංකය | |
| | | සාමාර්ථය | | සාමාර්ථය | |
| 1 | සිංහල භාෂාව/දෙමළ භාෂාව | | | | |
| 2 | ගණිතය | | | | |
| 3 | විද්‍යාව | | | | |
| 4 | ඉංග්‍රීසි | | | | |
| 5 | | | | | |
| 6 | | | | | |
| 7 | | | | | |
| 8 | | | | | |
| 9 | | | | | |
| 10 | | | | | |
| 11 | | | | | |
| 12 | | | | | |

*ඔබ විසින් අ. පො. ස. (සා/පෙළ) විභාගය සඳහා පෙනී සිටි සියලු විෂයයන් ඉහත වගුවෙහි සඳහන් කළ යුතු වේ.

11. ඔබ කවරදාක හෝ කවර හෝ චෝදනාවක් සඳහා උසාවියකින් වරදකරු වී තිබේ ද? ඔව් ☐ නැත ☐
(අදාළ කොටුවේ ✓ ලකුණ යොදන්න)
ඔව් නම් විස්තර සපයන්න. :————.

12. අයදුම්කරුගේ සහතිකය :

(අ) මා විසින් *ගැසට් නිවේදනය* හොඳින් කියවා බලා අවබෝධ කරගෙන එහි සඳහන් සියලු කොන්දේසිවලට යටත්ව මෙම අයදුම්පත සම්පූර්ණ කළ බවත්, මම වෙනත් කිසිදු පූර්ණකාලීන පාඨමාලාවකට සහභාගි නොවන බවත්, මෙම අයදුම්පතෙහි මා විසින් සපයා ඇති තොරතුරු මා දන්නා තරමින් සත්‍ය හා නිවැරදි බවත් ගෞරවයෙන් ප්‍රකාශ කර සිටිමි.

(ආ) මා විසින් කරන ලද මෙම ප්‍රකාශය හෝ අයදුම්පතෙහි සඳහන් කර ඇති කුමන හෝ තොරතුරක් අසත්‍ය යැයි ඔප්පු වුවහොත් මා පුහුණුවට නුසුදුස්සකු වන බව හා පත්වීම් ලදහොත් ඉන් අනතුරුව හෝ එසේ ඔප්පු වුවහොත් සේවයෙන් පහ කරනු ලැබීමට මා යටත් බව ද මම දැන සිටිමි.

| |
|---|
| ඔබ විසින් ඉල්ලුම් කරන පාඨමාලාව/පාඨමාලා සඳහා *ගැසට් නිවේදනයේ* 6(ආ) හි සඳහන් පරිදි අදාළ වටිනාකමින් යුතු මුද්දර නොගැලවෙන සේ අලවන්න. |

————,
අයදුම්කරුගේ/අයදුම්කාරියගේ අත්සන.

දිනය :————.

13. අයදුම්කරුගේ අත්සන සහතික කිරීම :

මෙම අයදුම්පත ඉදිරිපත් කරනු ලබන .................................. මයා/මිය/මෙනවිය මා පෞද්ගලිකවම දන්නා හඳුනන බවද, ඔහු/ඇය ................. දින මා ඉදිරිපිට දී ඔහුගේ/ඇයගේ අත්සන තැබූ බව ද සහතික කරමි.

————,
සහතික කරන්නාගේ අත්සන.

දිනය :————.

————,
සහතික කරන්නාගේ නිල මුද්‍රාව

* සහතික කරන නිලධාරියාගේ සම්පූර්ණ නම :————.
* තනතුර :————.
* ලිපිනය :————.

03-876

---

## විගණකාධිපති දෙපාර්තමේන්තුව

### විගණන පරීක්ෂක සේවයේ II වැනි ශ්‍රේණියට විගණන පරීක්ෂකවරුන් බඳවා ගැනීමේ විවෘත තරග විභාගය - 2014

ශ්‍රී ලංකා විගණන පරීක්ෂක සේවය පිළිබඳ ව්‍යවස්ථා සංග්‍රහයේ 06 (II) (ආ) වැනි ඡේදයේ විධිවිධාන අනුව එම සේවයේ II වැනි ශ්‍රේණියේ විගණන පරීක්ෂක තනතුරුවලට සුදුස්සන් තෝරා ගැනීම සඳහා විභාග කොමසාරිස් ජනරාල් විසින් තරග විභාගයක් පවත්වනු ලබන අතර, මෙම නිවේදනයේ දක්වා ඇති පරිදි අවශ්‍ය සුදුසුකම් සපුරා ඇති අපේක්ෂකයින්ගෙන් අයදුම්පත් මෙයින් කැඳවනු ලැබේ.

01. *විභාග දිනය.-* විභාග කොමසාරිස් ජනරාල් විසින් 2014 ජූලි මස කොළඹ දී හා යාපනයේ දී විභාගය පවත්වනවා ඇත. මෙම විභාගය කල් දැමීමට හෝ අවලංගු කිරීමට හෝ රාජ්‍ය සේවා කොමිෂන් සභාවට බලය ඇත. විභාගයට පෙනී සිටීමට ඉල්ලුම්කරන නගරය පසුව වෙනස් කිරීමට ඉඩ දෙනු නොලැබේ.

02. *පත්කරනු ලබන අයගේ සංඛ්‍යාව හා පත්වීම ක්‍රියාත්මක වන දිනය.-* පත්වීම් ක්‍රියාත්මක වන දිනය විගණකාධිපති විසින් නිශ්චය කරනු ලැබේ. කිසියම් පුරප්පාඩු සංඛ්‍යාවක් හෝ පුරප්පාඩු සියල්ලම හෝ නොපිරවීමට විගණකාධිපතිට බලය ඇත.

03. *සේවා කොන්දේසි :-*

(i) සාමාන්‍ය *ගැසට් පත්‍රයේ* I වැනි කොටස (IIඅ) ඡේදයේ ආරම්භයේ පළ කර ඇති රජයේ සේවයේ පත්වීම් පාලනය කෙරෙන පොදු කොන්දේසිවලට ද, අංක 380/61 හා 1985 දෙසැම්බර් මස 20 වැනි දින දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *අති විශෙෂ ගැසට් පත්‍රයේ* පළ කරන ලද *ශ්‍රී ලංකා විගණන පරීක්ෂක සේවය පිළිබඳ ව්‍යවස්ථා සංග්‍රහයේ* පනවා ඇති කොන්දේසිවලට ද, එම ව්‍යවස්ථාවට කර ඇති හෝ මින් මතු කෙරෙන සංශෝධනවලට ද යටත්ව තෝරාගනු ලබන අපේක්ෂකයන් ශ්‍රී ලංකා විගණන පරීක්ෂක සේවයේ II II වැනි ශ්‍රේණියට පත් කරනු ලැබේ.

(ii) මෙම තනතුර ස්ථිර සහ විශ්‍රාම වැටුප් සහිත ය. ඔබ පත්වූ දින සිට ඔබගේ මාසික ඉපැයීම්වලින් සියයට හතක් (7%) වැන්දඹු හා අනත්දරු විශ්‍රාම වැටුප් අරමුදලට ගෙවන ලෙස ඔබට නියම කෙරේ.

(iii) තනතුරට බඳවාගනීම සඳහා සුදුසුකම ලබන අපේක්ෂකයින් පත් කරනු ලබන දින සිට තුන් අවුරුදු පරිවාස කාලයටකට යටත්ව මෙම සේවයට පත් කරනු ඇත.

(iv) තනතුරට පත්කරනු ලබන අප්ක්ෂකයින් ඔවුනගේ පරිවාස කලය අවසානයේ දී තනතුරෙහි ස්ථිර කිරීම, පහත සඳහන් කරුණු මත ද රඳා පවතී.
(අ) වැඩ, පැමිණීම හා හැසිරීම සතුටුදායක වීම;
(ආ) පරිවාස කාලය අවසන් වීමට මත්තෙන් කාර්යක්ෂමතා කඩඉම් විභාගයෙන් සමත්වීම.

(v) පරිවාස කාලපරිච්ඡේදය අවසානයේ දී තනතුරුවලට ස්ථිර කරනු ලැබීමට අපොහොසත් වුවහොත්, ඔහුගේ/ඇයගේ සේවය අවසන් කිරීම සිදුවනු ඇත.

(vi) තනතුරට බඳවාගැනීමෙන් පසු වසර පහක් (05) ඇතුළත 2007 මැයි 20 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 07/2007 චක්‍රලේඛයේ විධිවධාන පරිදි අනෙක් රාජ්‍ය භාෂා ප්‍රවීනතාව ලබාගත යුතු ය.

(vii) තෝරාගනු ලබන නිලධාරීන් දිවයිනේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමේ කොන්දේසියට යටත් වේ.

(viii) රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්ය පටිපාටික රීතිවලට ද ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහයට ද, රජයේ මුදල් රෙගුලාසිවලට ද, රජය විසින් වරින් වර නිකුත් කරනුලබන නියමයන් හා රෙගුලාසිවලට හා විගණකාධිපති දෙපාර්තමේන්තුව විසින් වරින් වර නිකුත් කරනු ලබන චක්‍රලේඛ, උපදෙස් හා නියෝගවලට ද මෙම පත්වීම යටත් වේ.

04. *වැටුප් පරිමාණය* :-

විගණන පරීක්ෂක සේවයේ II වැනි ශ්‍රේණියට අයත් ඒකාබද්ධ වැටුප් පරිමාණය රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 06/2006 (iv) අනුව මාසිකව රුපියල් 16,720-10x320-11x365-15x450-රු.30,685 වේ. (රු. 17,680ට පෙර කාර්යක්ෂමතා කඩඉමකි)

05. *සෞඛ්‍ය හා විනය* :-

අපේක්ෂකයා සෞඛ්‍ය අතින් නිසි පරිදි සුදුසුකම් ඇති බවට ද, විශිෂ්ට චරිතයකින් යුක්ත බවට ද, විගණකාධිපති විසින් සෑහීමකට පත්විය යුතු ය. මනා ශරීර සෞඛ්‍යයකින් ද, හොඳ ඇස් පෙනීමකින් ද, යුක්ත විය යුතු අතර දිවයිනේ ඕනෑම පෙදෙසක සේවය කිරීමට ශාරීරික සුදුසුකම් තිබිය යුතු ය. දැනටමත් රාජ්‍ය සේවයේ/පළාත් රාජ්‍ය සේවයේ නියුක්තව නැති අපේක්ෂකයෙකු තෝරාගනු ලැබූ කල්හි ඔහු/ඇය වෛද්‍ය පරීක්ෂණයකට භාජනය විය යුතු ය.

06. *සුදුසුකම්* :-

සෑම අපේක්ෂකයෙකුම,

(අ) ශ්‍රී ලංකාවේ පුරවැසියෙකු විය යුතු ය;

(ආ) අයදුම්පත් භාරගන්නා අවසාන දිනට, රාජ්‍ය සේවයේ/පළාත් රාජ්‍ය සේවයේ නියුතු නොවන අයදුම්කරුවන්ගේ වයස අවුරුදු 22ට නොඅඩු, වයස අවුරුදු 32ට නොවැඩි විය යුතු අතර, රජයේ සේවයේ නියුතු අයදුම්කරුවන්ගේ වයස අවුරුදු 40ට නොවැඩි විය යුතු ය.

(ඇ) විශිෂ්ට චරිතයකින් හා මනා ශරීර සෞඛ්‍යයකින් යුක්ත විය යුතු ය.

(ඈ) පහත සඳහන් සුදුසුකම්වලින් එකක් ලබා තිබිය යුතුය.

(i) පිළිගත් විශ්ව විද්‍යාලයක උපාධිධරයෙකු වීම හෝ සමාන සුදුසුකම් ලබා තිබීම;

හෝ

(ii) ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනයේ ආවසරික හෝ අන්තර් මධ්‍ය පරීක්ෂණය සමත් වී තිබීම;

හෝ

(iii) ශ්‍රී ලංකා කාර්මික විද්‍යාලයේ/ශ්‍රී ලංකා උසස් තාක්ෂණික අධ්‍යාපන ආයතනයේ උසස් ජාතික ගණකාධිකරණ/වානිජ ඩිප්ලෝමාව සමත් වී තිබීම;

(ඉ) යම් ආගමික නිකායක පැවිදිවරයක් දරන කිසිදු තැනැත්තෙකුට මෙම විභාගය සඳහා පෙනී සිටීමට අවසරයක් නොමැත.

සටහන.- මෙම විභාගයේ දී තරඟ කරන අපේක්ෂකයන් තම තමන්ගේ අධ්‍යාපනික හා වෘත්තීය සුදුසුකම් පිළිබඳ සහතික සහ සෙසු ලියවිලි විගණකාධිපති විසින් ඉල්ලූ වහාම ඉදිරිපත් කිරීම සඳහා සුදානම්ව තබා ගත යුතු ය. විභාගයක ප්‍රතිඵල අපේක්ෂාවෙන් ඉල්ලුම්කළ නොහැකි ය.

සටහන .- අපේක්ෂයකු සුදුසුකම් ලබා ඇති සේ සලකනු ලබනුයේ ඔහු/ඇය විසින්,

(i) විභාගය ඉල්ලුම් කිරීම සඳහා, සුදුසුකම් ලෙස දක්වා ඇති විභාගය හෝ විභාග 2014.04.25 දින වන විට සෑම ආකාරයකින්ම සාර්ථක ලෙස සම්පූර්ණ කර ඇත්නම්, සහ

(ii) සුදුසුකම් පිළිබඳ නිල සහතිකයක් හෝ එම සහතිකය වෙනුවෙන් විගණකාධිපති විසින් පිළිගන්නාවූ නිල ලේඛනයක් හෝ සම්මුඛ පරීක්ෂණයේ දී ඉදිරිපත් කර ඇතිනම් පමණි.

07. *විභාග ගාස්තු.-* මෙම විභාගය සඳහා ගාස්තුව රු. 600 කි. එම මුදල විභාග කොමසාරිස් ජනරාල්ගේ ආදායම් ශීර්ෂ 2003-02-13ට බැරවන පරිදි ඉල්ලුම්පත්‍ර භාරගනු ලබන අවසාන දිනට ප්‍රථම, දිවයිනේ පිහිටි ඕනෑම ප්‍රාදේශීය/දිස්ත්‍රික් ලේකම් කාර්යාලයක් වෙත ගෙවා ඔබගේ නමින් ලබාගන්නා ලදුපත ඉල්ලුම්පත්‍රයේ නියමිත ස්ථානයේ අලවා එවිය යුතුය. මෙම විභාගය සඳහා ගෙවන ලද ගාස්තුව කුමන කරුණක් නිසාවත් සම්පූර්ණයෙන් හෝ අර්ධ වශයෙන් හෝ ආපසු ගෙවනු නොලැබේ. (මුදල් ගෙවා ලබාගත් කුවිතාන්සියේ ඡායාස්ථ පිටපතක් ඔබ ළඟ තබා ගැනීම ප්‍රයෝජනවත් විය හැකි ය.)

08. *අයදුම්කිරීමේ ක්‍රමය ඃ*

(අ) අයදුම් පත්‍රය මෙම නිවේදනයට යාකොට ඇති ආදර්ශ ආකෘතියට අනුකූලව කඩදාසියේ දෙපැත්තම පාවිච්චි කරමින් ඒ4 ප්‍රමාණයේ කඩදාසිවල පිළියෙල කර අපේක්ෂකයා තම අත් අකුරින්ම පැහැදිලිව පිරවිය යුතු ය. අංක 01 සිට 04 තෙක් ශීර්ෂ පළමු පිටුවටද, 05 සිට 06 තෙක් ශීර්ෂ දෙවන පිටුවට ද, 07 සිට 09 තෙක් ශීර්ෂ තුන්වැනි පිටුවට හා 10 සිට 12 තෙක් ශීර්ෂ හතරවන පිටුවට ද ඇතුළත්වන පරිදි අයදුම්පත්‍රය සකස්කරගත යුතුය. ආදර්ශ ඉල්ලුම්පත්‍රයට අනුකූල නොවන ඉල්ලුම්පත්‍රත්, අසම්පූර්ණ ලෙස තොරතුරු සඳහන් කර ඇති ඉලල්ම්පත්‍රත් දැනුම්දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ. සම්පූර්ණ කරන ලද ඉල්ලුම්පත්‍රයේ ඡායා පිටපතක් ළඟ තබා ගැනීම ප්‍රයෝජනවත් වනු ඇත.

(ආ) අයදුම්පත්‍රය අපේක්ෂකයින් විභාගයට පෙනී සිටීමට සුදුසුකම් ඇති භාෂාවෙන් පිරවිය යුතු ය. (12 වන ඡේදය බලන්න) ඉල්ලුම්පත්‍රය පිළියෙල කරගන්නා විට එහි ශීර්ෂයේ සඳහන් විභාගයේනම සිංහල ඉල්ලුම්පත්‍රවල සිංහලට අමතරව ඉංග්‍රීසියෙන් ද, දෙමළ ඉල්ලුම්පත්‍රවල දෙමළට අමතරව ඉංග්‍රීසියෙන් ද, යෙදීම අවශ්‍ය වේ.

(ඇ) විවෘත තරග විභාගය සඳහා වූ අයදුම්පත්‍ර 2014 අප්‍රේල් මස 25 වැනි දින හෝ ඊට පෙර ලැබන පිණිස විභාග කොමසාරිස් ජනරාල්, සංවිධාන හා විදේශ විභාග ශාඛාව, ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව, පැලවත්ත, බත්තරමුල්ල වෙත ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතු ය.

අයදුම්පත්‍රය බහා ඇති කවරයේ වම්පස උඩ කෙළවර ''විගණන පරීක්ෂක II තනතුරට බඳවා ගැනීමේ විවෘත තරග විභාගය 2014" යන වගන්තිය පැහැදිලි ලෙස ලිවිය යුතු ය. මෙදිනට පසුව ලැබෙන කිසිම අයදුම්පත්‍රයක් භාරගනු නොලැබේ. රාජ්‍ය සේවයේ/පළාත් රාජ්‍ය සේවයේ නියුක්ත අයදුම්කරුවන් ස්වකීය අයදුම්පත්‍ර තම දෙපාර්තමේන්තු ප්‍රධානීන්/ආයතන ප්‍රධානීන් මාර්ගයෙන් ඉදිරිපත් කළ යුතු ය.

(ඈ) සෑම ආකාරයකින්ම සම්පූර්ණ වී නැති ඉල්ලුම්පත්‍ර ප්‍රතික්ෂේප කරනු ඇත. තැපැල් කිරීමේ දී ඉල්ලුම්පතක් නැතිවීම හෝ ප්‍රමාදවීම ගැන කෙරෙන කිසිම පැමිණිල්ලක් සලකා බලනු නොලැබේ. තව ද, ඔහු/ඇය විභාගයට ඇතුළත් කර ගැනීම ඊට යෝග්‍ය පිළිගැනීමක් බවට පත් නොවේ. එසේ ඇතුළත් කර ගැනීම හුදෙක් තත්කාලීන පසු අවශ්‍යතාවක දී පරීක්ෂා කර බැලීමට යටත් වන්නකි.

(ඉ) ඉල්ලුම්පත් ලැබුණු බව දන්වනු නොලැබේ. අයදුම්කරුවන් වෙත ප්‍රවේශපත්‍ර නිකුත කළ වහාම ඒ බව සඳහන් කරමින් පුවත්පත් නිවේදනයක් ශ්‍රී ලංක විභාග දෙපාර්තමේන්ව මගින් පළ කෙරෙනු ඇත. නිවේදනය පළ වී දින 2ක් හෝ 3ක් ගතවූ පසුවත් ප්‍රවේශ පත්‍රය නොලැබුණි නම් දැන්වීමේ සඳහන් ආකාරයට ඒ බව විභාග දෙපාර්තමේන්තුව වෙත දන්වා සිටිය යුතු ය. ඔබ වෙත තබාගත් අයදුම්පත්‍රයේ පිටපත, විභාග ගාස්තුවට අදාළ ලදුපතෙහි පිටපත, ඉල්ලුම්පත්‍ර තැපැල් කිරීමේ දී ලියාපදිංචි කරන ලද කුවිතාන්සියද අතැතිව, ඔබගේ සම්පූර්ණ නම, ලිපිනය, ජාතික හැඳුනුම්පත් අංකය හා විභාගයේ නම නිවැරදිව සඳහන් කරමින් විභාග දෙපාර්තමේන්තුවෙන් විමසිය යුතු ය. ඔබ කොළඹින් බැහැර ප්‍රදේශයක අයදුම්කරුවකු නම් ෆැක්ස් මගින් විභාග ප්‍රවේශ පත්‍රයේ පිටපතක් එවීම සඳහා ඔබගේ ෆැක්ස් අංකයක් හා ඉහත විස්තර සඳහන් කරන ලද ඉල්ලීම් ලිපියක් ෆැක්ස් මගින් ශ්‍රී ලංකා විභාග දෙපර්තමේන්තුව වෙත යොමු කරමින් විමසා සිටීම වඩාත් ඵලදායී වනු ඇත.

(ඊ) විභාග ඉල්ලුම්පත්‍රයේ හා විභාග ප්‍රවේශ පත්‍රයේ අත්සන සහතික කිරීමට බලයලත් අයෙකු විසින්, අයදුම්කරුගේ අත්සන සහතික කළ යුතු ය. දැනටමත් රජයේ හෝ පළාත් රාජ්‍ය සේවයේ නියුක්ත නිලධාරීන්ගේ අත්සන අදාළ දෙපාර්තමේන්තු ප්‍රධානියා හෝ ඔහු වෙනුවෙන් එසේ කිරීමට බලයලත් නිලධාරියකු ලවා ද, අනෙකුත් අයදුම්කරුවන්ගේ අත්සන් සාමදාන විනිශ්චයකාරවරයකු, දිවුරුම් කොමසාරිස්වරයකු නීතීඥවරයකු, ප්‍රසිද්ධ නොතාරිස් කෙනෙකු, රජයේ පාසලක විදුහල්පතිවරයකු, (රු. 240,360 ක් හෝ ඊට වැඩි හෝ වාර්ෂික ඒකාබද්ධ වැටුපක් ලබන රාජ්‍ය හෝ පළාත් රාජ්‍ය සේවයේ හෝ ස්ථිර මාණ්ඩලික ශ්‍රේණියේ නිළධාරියකු), බෞද්ධ විහාරයක විහාරාධිපති හෝ නායක ස්වාමීන්වහන්සේ කෙනෙකු, අන්‍ය ආගමික පූජ්‍ය ස්ථානයක් භාර හෝ පූජ්‍ය පක්ෂයේ සැලකිය යුතු තත්ත්වයක් දරන පූජක කෙනෙකු, ත්‍රිවිධ හමුදාවේ අධිකාරී, බලයලත් නිලධාරියකු, පොලිස් සේවයේ *ගැසට්* කළ තනතුරක් දරන නිලධාරියකු හෝ යන මොවුන්ගෙන් කවරෙකු හෝ ලවා සහතික කරවාගත යුතු ය.

09. *විභාගයට ඇතුල්වීමඃ-*

(අ) ඉල්ලුම්පත් ලැබී ඇති සියලුම අයදුම්කරුවන් වෙත විභාග කොමසාරිස් ජනරාල් විසින් ප්‍රවේශ පත්‍ර නිකුත් කරනු ඇත. විභාගය පෙනී සිටින අපේක්ෂකයකු තමාට නියමිත විභාග මධ්‍යස්ථානයේදී විභාගයට පෙනී සිටිය යුතු අතර, එසේ පෙනී සිටින පළමු දිනයේදීම තම අත්සන සහතික කරවාගත් ප්‍රවේශ පත්‍රය ශාලාධිපති වෙත ඉදිරිපත් කළ යුතුය. තම ප්‍රවේශ පත්‍රය ඉදිරිපත් නොකරන අපේක්ෂකයකුට විභාගයට පෙනී සිටීමට අවසර දෙනු නොලැබේ.

(ආ) අපේක්ෂකයින් විසින් තම තමන්ට නියම කර ඇති විභාග ශාලාවේ දී විභාගයට පෙනී සිටිය යුතු ය. විභාගයට පෙනී සිටින සෑම අපේක්ෂකයෙකු විසින්ම විභාගය පැවැත්වෙන පළමු දිනයෙහි තම අත්සන සහතික කරවා ගත් ස්වකීය ප්‍රවේශ පත්‍රය විභාග අධීක්ෂකට භාරදිය යුතු ය. සෑම අපේක්ෂකයෙකුම අනුගමනය කළ යුතු නීති මාලාවක් මෙම *ගැසට්* පත්‍රයේ පළකර ඇත.

(ඇ) අපේක්ෂකයකුට ප්‍රවේශ පත්‍රයක් නිකුත් කිරීම ඔහු/ඇය විභාගයට ඉදිරිපත්වීමට සුදුසුකමක් සපුරා ඇති බවට පිළිගැනීමක් ලෙස නොසැලකිය යුතු ය.

(ඈ) විභාගය පැවැත්වීම සම්බන්ධයෙන් විභාග කොමසාරිස් ජනරාල් විසින් නියම කරන ලද නීතිරීතිවලට විභාග අපේක්ෂකයින් යටත් වේ. එම නීතිරීති උල්ලංඝනය කළහොත් විභාග

කොමසාරිස් ජනරාල් විසින් පනවනු ලබන දඬුවමකට යටත්වීමට ඔවුනට සිදුවනු ඇත.

10. *අපේක්ෂකයාගේ අනන්‍යතාව.*— තමා පෙනී සිටින සෑම විෂයයක් සම්බන්ධයෙන්ම විභාග ශාලාධිපති සෑහීමකට පත්වන අයුරින් අපේක්ෂකයෙකු විභාග ශාලාවේ දී තම අනන්‍යතාව ඔප්පු කර සිටිය යුතු ය. මේ සඳහා පහත සඳහන් ලේඛන පමණක් පිළිගනු ඇත :—

(අ) පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුව මගින් නිකුත් කර ඇති ජාතික හැඳුනුම්පත;

(ආ) ආගමන හා විගමන දෙපාර්තමේන්තුව විසින් නිකුත් කරන ලද වලංගු විදේශ ගමන් බලපත්‍රයක්.

11. *සාවද්‍ය තොරතුරු සැපයීම.*- අපේක්ෂකයෙකුට සුදුසුකම් නොමැති බව අනාවරණය වුවහොත්, විභාගයට කලින් හෝ විභාගය පවත්වන කාලයේ දී හෝ විභාගයෙන් පසුව හෝ ඕනෑම අවස්ථාවක දී, ඔහුගේ/ඇයගේ අපේක්ෂකත්වය අවලංගු කිරීමට ඉඩ ඇත. අපේක්ෂකයෙකු ඉදිරිපත් කර ඇති කිසියම් කරුණක් ඔහු/ඇය එය සාවද්‍ය බව දැන දැනම ඉදිරිපත් කර ඇති බව හෙළිවුවහොත්, එසේ නැතිනම් යම් වැදගත් කරුණක් ඔහු/ඇය විසින් උවමනාවෙන්ම යටපත් කර ඇති නම්, ඔහු/ඇය රජයේ සේවයෙන් පහ කිරීමට ඉඩ ඇත.

12. *විභාග ක්‍රමය :*

(අ) විභාගය සිංහලෙන්, දෙමළෙන් හා ඉංග්‍රීසි මාධ්‍යවලින් පැවැත්වේ.

(ආ) අපේක්ෂකයකු විභාගයට පෙනී සිටියයුතු වන්නේ මෙම විභාගයට ඉල්ලුම් කිරීම සඳහා සුදුසුකම්ලත් විභාගයට පෙනී සිටි භාෂා මාධ්‍යයෙන් හෝ රාජ්‍ය භාෂාවකින් හෝ පමණි.

(ඇ) අපේක්ෂකයකු සුදුසුකම්ලත් විභාගයේ විෂයයන් භාෂා දෙකකින් හෝ වැඩි ගණනකින් හෝ සමත්ව ඇත්නම්, එම විභාගයේ දී ඔහු සමත් වූ විෂයයන්ගෙන් වැඩි ගණනකට යොදාගත් භාෂා මාධ්‍යයෙන් හෝ රාජ්‍ය භාෂාවෙන් හෝ විභාගයට පෙනී සිටිය යුතු ය.

(ඈ) ප්‍රධාන විෂයය එක් භාෂාවකිනුත්, අතිරේක විෂයයන් තවත් භාෂාවකිනුත්, සමත්වී ඇති විශේෂ උපාධියක් ඇති අපේක්ෂකයෙකු ප්‍රධාන විෂයයන්ට සාමාර්ථය ලත් භාෂාවෙන් හෝ රාජ්‍ය භාෂාවෙන් හෝ විභාගයට පෙනී සිටිය යුතුය. විභාගයට පෙනී සිටීමට ඉල්ලුම්කරන මාධ්‍යය පසුව වෙනස් කිරීමට අපේක්ෂකයින්ට ඉඩ දෙනු නොලැබේ.

සටහන :-

(i) ඉහත (ආ) සහ (ඇ) හි සඳහන් "සුදුසුකම් ලත් විභාගය" යන පදයෙන් අදහස් කෙරෙන්නේ 06 වැනි ඡේදයෙහි දක්වා ඇති විභාගවලින් එකක්ය.

(ii) අපේක්ෂකයකු විභාගයේ දී පෙනී සිටින සියලුම ප්‍රශ්න පත්‍රවලට එකම භාෂාවකින් පිළිතුරු ලිවිය යුතු ය.

13. *පරීක්ෂා කිරීමේ ක්‍රමය :*

(අ) පහත සඳහන් විෂයයන් පහ සඳහා පැවැත්වෙන ලිඛිත පරීක්ෂණයක් මගින් හා සම්මුඛ පරීක්ෂණයක් මගිනි :-

| *විෂයය* | *කාලය (පැය)* | *මුළු ලකුණු* |
|---|---|---|
| 1. ගණකාධිකරණය | 03 | 150 |
| 2. පිරිවැය ගණකාධිකරණය | 02 | 100 |
| 3. විගණනය | 03 | 150 |
| 4. ව්‍යාපාරික ගණිතය සහ සංඛ්‍යානය | 02 | 100 |
| 5. පරිසරය - | | |
| 1 වැනි කොටස - ආර්ථික විද්‍යාව | 01 | 50 |
| 2 වැනි කොටස - සාමාන්‍ය වාණිජ දැනුම | 01 | 50 |
| 3 වැනි කොටස - වාණිජ නීතිය | 01 | 50 |

ලිඛිත පරීක්ෂණයේ විෂය නිර්දේශය "අ" පරිශිෂ්ඨයේ දැක්වේ.

(ආ) ලිඛිත පරීක්ෂණයේ දී එක් එක් ප්‍රශ්න පත්‍රය සඳහා නියමිත ලකුණු සංඛ්‍යාවෙන් සියයට 40ක අවම ලකුණු ප්‍රමාණයක් ද, මුළු විභාගය සඳහා අවම වශයෙන් සියයට 50ක සාමාන්‍යයක්ද ලබා ගන්නා අපේක්ෂකයන් පමණක් සම්මුඛ පරීක්ෂණය සඳහා කැඳවනු ලැබීමට යෝග්‍යවන අතර, ලිඛිත පරීක්ෂණයෙන් පසු දැනුම් දෙනු ලබන දිනයක දී සම්මුඛ පරීක්ෂණය පවත්වනු ලැබේ. සම්මුඛ පරීක්ෂණය පවත්වනු ලබන්නේ අයදුම්කරුවන්ගේ අධ්‍යාපන සුදුසුකම් පරීක්ෂා කිරීමට සහ සේවා වාර්තා පරීක්ෂා කර බැලීම සඳහා වන අතර, සම්මුඛ පරීක්ෂණ සඳහා ලකුණු ලබා දෙනු නොලැබේ. සම්මුඛ පරීක්ෂණය මණ්ඩලය පත් කරනු ලබන්නේ විගණකාධිපතිවරයා විසිනි.

14. *පත්කිරීම පිණිස තෝරා ගැනීමේ ක්‍රමය.*—ලිඛිත පරීක්ෂණයන් ප්‍රශ්න පත්‍ර 05ට ලබාගත් ලකුණු අනුව ඉහළම ලකුණු ලබාගෙන ඇති අපේක්ෂකයින් තෝරාගනු ලැබේ. අපේක්ෂකයින් කිහිපදෙනෙකුට එකම ලකුණු ලැබී ඇත්නම් තෝරා ගැනීම පිළිබඳ අවසාන තීරණය විගණකාධිපතිවරයා සතුවේ.

15. 13 (ආ) ඡේදයට අනුව සුදුසුකම්ලත් අපේක්ෂකයින්ගේ නම් ඇතුළත් ප්‍රතිඵල ලේඛනය විගණකාධිපති වෙත ලබාදීමෙන් අනතුරුව විභාගයට පෙනී සිටි සියලුම අයදුම්කරුවන් වෙත ප්‍රතිඵල පෞද්ගලිකව දන්වා යවනු ඇත.

16. ඉහත රෙගුලාසිවලින් ආවරණය නොවන කරුණු සම්බන්ධයෙන් මතුවන ගැටළු පිළිබඳ විගණකාධිපතිවරයාගේ තීරණය අවසන් තීරණය වනු ඇත.

17. මෙම නිවේදනයේ සිංහල, දෙමළ හා ඉංග්‍රීසි අනුවාද අතර කිසියම් අනුකූලතාවක් පවතීනම් සිංහල නිවේදනයේ ඇතුළත් කරුණු බලපවත්නේය.

එච්. ඒ. එස්. සමරවීර,
විගණකාධිපති.

2014 අප්‍රේල් මස 10 වැනි දින,
බත්තරමුල්ල,
පොල්දූව පාර, අංක 306/72,
විගණකාධිපති දෙපාර්තමේන්තුවේ දී ය.

'අ' පරිශිෂ්ඨය

**ලිඛිත පරීක්ෂණයේ විෂයය නිර්දේශය**

(i) *ගණකාධිකරණය.* - පහත සඳහන් විෂයයන් පිළිබඳව පැය 03 ක එක් ප්‍රශ්න පත්‍රයකි. (ලකුණු ගණන 150 කි)

* *ගණකාධිකරණය න්‍යාය.* - මූලික සංකල්ප හා මූලධර්ම, වත්කම් ඇගයීමේ ක්‍රම, ද්විත්ව සටහන් න්‍යාය, පිරිවැය වර්ගීකරණය, ශේෂ පත්‍රවල තොරතුරු වර්ගීකරණය, නිෂ්පාදන, වෙළඳ හා ලාභාලාභ ගිණුම් පිළිබඳ සාමාන්‍ය අවබෝධය.

* *ගණකාධිකරණ පද්ධති.* - ගිණුම් ඒකකයක උපයෝගී කරගනු ලබන සම්පත්වල වෙනස්වීම් පාලනය කිරීමේ අවශ්‍යතාව පදනම් කර ගත් පාලන සංකල්ප පිළිබඳ අවබෝධය, ප්‍රමිතයන් සමග සැසඳීමේ අවශ්‍යතාව, ව්‍යාපාරික ගණුදෙනු විශ්ලේෂණය, මිලදී ගැනීම, වෙළඳාම, මුදල් ලැබීම් හා ගෙවීම්, ඉන්වෙන්ට්‍රි පාලනය ආදී මූලික කළමනාකාරිත්ව කාර්යභාරයන්ට අදාළ පටිපාටි පිළිබඳ නිපුණත්වය, දෛනික පොත්, ලෙජර්, පාලන ගිණුම් ආදී වාර්තා සැලසුම් ආකෘතිය පිළිබඳ නිපුනත්වය.

* ශේෂ පත්‍ර සකස් කිරීම, නිෂ්පාදන, වෙළඳ හා ලාභාලාභ ගිණුම්, සැසඳීම් ප්‍රකාශ, පාලන ගිණුම්, ගණක හා සංඛ්‍යාන අනුපාතයන් ආදිය ඇතුළත් ගණකාධිකරණ ව්‍යාවහාරයේ ගැටලු.

(ii) *පිරිවැය ගණකාධිකරණය.* - පහත සඳහන් විෂයයන් පිළිබඳව පැය 02 ක එක් ප්‍රශ්න පත්‍රයකි. (ලකුණු ගණන 100 කි)

* පිරිවැයකරණ මූලධර්ම, පිරිවැයකරණ, වර්ග, මිලදී ගැනීම් හා ගබඩා පරිපාටි, ද්‍රව්‍ය, ද්‍රව්‍ය මිල කිරීම්, ද්‍රව්‍ය නිකුතු මිල කිරීම, වේතන, පොදු කාර්ය පිරිවැය, ස්ථාවර හා විචල්‍ය වියදම්, ඍජු හා වක්‍ර වියදම්, අයවැය ලේඛනමය පාලනය, ප්‍රමිත පිරිවැයකරණය, විචලනය, ආන්තික පිරිවැයකරණය, කොන්ත්‍රාත් පිරිවැයකරණය, පිරිසැකසුම් පිරිවැයකරණය, වැඩ පිරිවැයකරණය, ප්‍රවාහන පිරිවැයකරණය, නිපැයුම් පිරිවැයකරණය.

(iii) *විගණනය.*- පහත සඳහන් විෂයයන් පිළිබඳව පැය 03 ක එක් ප්‍රශ්න පත්‍රයකි. (ලකුණු 150 කි)

* *විගණන සංකල්ප හා න්‍යාය.*- විගණනයක අවශ්‍යතාව, ගණන්දීමේ වගකීම විගණනයේ පදනමක් වශයෙන් විගණන විෂය පථය, විගණන වර්ග, විගණන කාලනිර්ණය, විගණකරුවන්ගේ සුදුසුකම්, බලතල, විගණනය සඳහා අධිකාරී බලය, පූර්ව විගණනය, අභ්‍යන්තර සෝදිසිය, අභ්‍යන්තර පාලනය, ගැඹුරින් විගණනය, අභ්‍යන්තර විගණනය, ප්‍රමිති සඳහා වන අවශ්‍යතාව, විගණනය සඳහා සාක්ෂි වර්ග, ශිල්පීය ක්‍රම

* *විගණන පද්ධති සහ පරිපාටි.* - ප්‍රධාන ශේෂ පත්‍රය, නිෂ්පාදන, වෙළඳ හා ලාභාලාභ ගිණුම් විෂයයන්, ඉඩම්, ගොඩනැගිලි, ස්ථාවර වත්කම්, ඉන්වෙන්ට්‍රි, මුදල්මය වත්කම්, විකුණුම්, මිලදී ගැනීම, ලැබීම්, ගෙවීම් ආදිය ආවරණය වන විගණන වැඩ සටහන් පිළිබඳ නිපුණත්වය

* *විගණන ගැටලු.*- නිරීක්ෂණ හැකියාවන් සහ වැරදි සහ අසාමාන්‍ය අවස්ථාවන් සොයා බැලීමේ හැකියාව පිරික්සීම සඳහා වන සරල ගැටලු

* විගණකාධිපතිවරයාගේ කාර්යයන්

(iv) *ව්‍යාපාරික ගණිතය හා සංඛ්‍යානය.*- ව්‍යාපාරික ගණිතය හා සංඛ්‍යානය මූලධර්ම පිළිබඳව පැය 02 ක එක් ප්‍රශ්න පත්‍රයකි (ලකුණු 100 කි).

ගණිතය :

* සමීකරණ.- ප්‍රස්තාරික විසඳුම් ඇතුලුව ඒකජ හා වර්ගජ සමීකරණ
* ශ්‍රේණි .- සමාන්තර හා ගුණෝත්තර, වට්ටම් ඇතුළුව සුළු පොලිය හා වැල් පොලිය
* සංකරණ සහ සංයෝජන ඇතුළත් මූලික සම්භාවිතා න්‍යාය, ගණිතය වගු භාවිතය

සංඛ්‍යානය :

* දත්ත එක්රැස්කිරීම, ඉදිරිපත් කිරීම හා විවරණය කිරීම.
* සංඛ්‍යාන ව්‍යාප්තිය, මධ්‍යයන හා අපකිරණය, සම්මත අපගමනය, සංඛ්‍යාන වක්‍ර විශ්ලේෂණය
* සම්භාවිතාව, ව්‍යාප්ති හා එහි යෙදවුම්
* නියැදීම සහ වෙසෙයියාව, නියැදි ව්‍යාප්ති සංකල්පය, සම්මත දෝෂය, නියැදීම් ක්‍රම, වෙසෙසිතා පරීක්ෂණ
* *කාලශ්‍රේණි.*- කාල ශ්‍රේණියක සංරචක, උපනති, අනුඍතු, චාක්‍රික සහ අවධි
* ප්‍රස්තාරික සංදේශනය, සංඛ්‍යාන ප්‍රස්තාර සටහන්

(v) පරිසරය.- පහත සඳහන් විෂයයන් පිළිබඳව පැය 03 ක එක් ප්‍රශ්න පත්‍රයක් (ලකුණු 150 කි) ආර්ථික විද්‍යා මූලධර්ම, නීතිය හා සාමාන්‍ය වාණිජ දැනුම

ආර්ථික විද්‍යාව :

* ආර්ථික විද්‍යාව හැදෑරීමේ ස්වභාවය හා වැදගත්කම, මිල පද්ධති, ඉල්ලුම හා සැපයුම, පිරිවැය හා අයභාරය, ලාභ උපරිමය ළඟා කර ගැනීම, නිෂ්පාදන සාධක, තරඟකාරිත්වය හා ඒකාධිකාරය.

* ශ්‍රී ලංකා ආර්ථිකයේ ලක්ෂණ, ජාතිය ආදායම, දළ ජාතික නිෂ්පාදනය, ගෙවුම් ශේෂය, උද්ධමනය, ආර්ථික පසු බෑස්ම, ස්ථාවර හා චල විනිමය අනුපාතය වැනි ආර්ථික ගැටලු, අවමූල්‍යනය

* මුදල් හා බැංකුකරණය - මුදල් ස්වභාවය, ආකෘතිය හා කර්තව්‍යයන්, මුදල්වල වටිනාකම, සාමාන්‍ය මිල මට්ටම, ශ්‍රී ලංකා මහ බැංකුවේ, වාණිජ බැංකුවල සහ ණය දෙන හා ඉතිරි කිරීම් ආයතනවල කර්තව්‍යයන්.

නීතිය :

* ශ්‍රී ලංකාවේ පවත්නා නෛතික පද්ධතිවල ඉතිහාසය සැකෙවින් සහ ඒවා අදාළ වන අයුරු, උසාවිවල, කම්කරු උසාවිවල සහ කර්මාන්ත උසාවිවල සංවිධානය සහ කර්තව්‍යයන්, ශ්‍රී ලංකාවේ යුක්තිය පසිඳලීමේ නියුතු විනිශ්චයකාරවරුන්ගේ හා අනෙකුත් වැදගත් නෛතික නිලධාරීන්ගේ කර්තව්‍යයන්.

* කොන්ත්‍රාත්තුවේ ස්වභාවය, ස්වාභාවික හා නෛතික පුද්ගලයා, නියෝජ්‍යත්වය බලයෙන් පිට සිද්ධාන්තය.

සාමාන්‍ය වාණිජ දැනුම :

* පද්ධති හා පරිපාටීන් ඇතුළු කාර්යාල සංවිධානය, ලිපි ගොනුගත කිරීම හා සුචිගත කිරීම, කාර්යාල උපකරණ, රැස්වීම් සංවිධානය කිරීම, රැස්වීම් සටහන් හා වාර්තා ලිවීම

* සංවිධාන ව්‍යුහය, සංවිධාන සටහන, කාර්ය මණ්ඩලයේ එක් එක් තරාතිරම් අතර සම්බන්ධතාව, මධ්‍යගත කිරීම, විමධ්‍යගත කිරීම, තනි වෙළෙන්දා, හවුල් ව්‍යාපාර, බද්ධ ව්‍යාපාර, සමාගම්, සමුපකාර, රාජ්‍ය සංස්ථා ඇතුළු ව්‍යාපාර ඒකක
* රක්ෂණ මූලධර්ම සහ වර්ග, ශ්‍රී ලංකා අපනයන ණය රක්ෂණ සංස්ථා
* මුහුදින්, ගොඩබිමින් හා ගුවනෙන් බඩු ගෙන යාම, ගැල් කුලී, ප්‍රමාද ගාස්තු
* අන්සතු කළ හැකි ලියකියවිලි, ගණුදෙනු කිරීමේ හැකියාව යන්නෙහි අර්ථය, චෙක්පත්, විනිමය බිල්පත්, පිටසන්, රේඛණය, ප්‍රතිග්‍රහණය, අගරු කිරීම
* ශ්‍රී ලංකාවේ සමුපකාර මගින් ඉටු කෙරෙන කාර්ය භාරය
* ආයෝජන මූලධර්ම, ශ්‍රී ලංකාවේ ව්‍යාපාර වස්තු, වෙළඳපොළ
* විකුණුම් කොන්ත්‍රාත්තුව, බඩුවල හිමිකම් පැවරීම, කොන්දේසි හා ප්‍රතිඥාභාරය, කුලී සින්නක්කරය, වාරික ගෙවීම මත මිලට ගැනීම් ඇතුළුව හා භාණ්ඩ විකිණීම
* පරිපාටි, ලියකියවිලි, අපනයන ආනයනය ක්‍රම, ගෙවීම් ක්‍රමය සහ කොන්දේසි, තීරු බදු සහ නිෂ්පාදන බදු ඇතුළුව ජාත්‍යන්තර වෙළඳාම
* ජාතික සංවර්ධන බැංකුවේ, සංවර්ධන මූල්‍ය සංස්ථාවේ, ලෝක බැංකුවේ ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ කාර්යයන් ඇතුළුව සංවර්ධන මූල්‍යය.

| විභාග අංකය | |
|---|---|

(කාර්යාලයීය ප්‍රයෝජනය සඳහා.)

**ආදර්ශ අයදුම්පත්‍රය**

**විගණන පරීක්ෂක සේවයේ II වැනි ශ්‍රේණියට විගණන පරීක්ෂකවරුන් බඳවා ගැනීමේ විවෘත තරග විභාගය - 2014**

Open Competitive Examination for Recruitment of Audit Examiners to Grade II of the Audit Examiner's Service - 2014

(A-4 ප්‍රමාණයේ කඩදාසි 02ක. ශීර්ෂ අංක 01-04 පළමුවන පිටුවටත්, 04-06 දෙවන පිටුවටත්, 07 සිට 09 තෙක් තුන්වන පිටුවටත්, ඉතිරිය හතරවන පිටුවටත් වන ලෙස සකස් කරන්න.)

විභාගයට පෙනී සිටීමට අපේක්ෂා කරන නගරය හා නගර අංකය :

| නගරය | නගර අංකය |
|---|---|
| | |

කොළඹ (Colombo) - 1
යාපනය (Jaffna) - 2

(නගරය ඉංග්‍රීසි කැපිටල් අකුරෙන් ද,නගර අංකය ද කොටුව තුළ යොදන්න.)

විභාගයට පෙනී සිටින භාෂා මාධ්‍යය : ☐

සිංහල - 2 (අදාළ අංකය කොටුව තුළ ලියන්න)
දෙමළ - 3
ඉංග්‍රීසි - 4

(භාෂා මාධ්‍යය පසුව වෙනස් කිරීමට ඉඩදෙනු නොලැබේ.)

01. නම :——————.

02. ලිපිනය :——————.
(රාජ්‍ය සේවයේ/පළාත් රාජ්‍ය සේවයේ නියුක්ත නිලධාරියෙකු ඔහුගේ/ඇයගේ රාජකාරි ලිපිනය ලිවිය යුතුය.)

03. 3.1 ස්ත්‍රී/පුරුෂ භාවය (ස්ත්‍රී - 1, පුරුෂ - 0) : ☐
(අදාල අංකය කොටුව තුළ ලියන්න.)

3.2 විවාහක/අවිවාහක භාවය (විවාහක -2 අවිවාහක -1) : ☐
(අදාල අංකය කොටුව තුළ ලියන්න.)

3.3 ජාතික හැඳුනුම්පත් අංකය: ☐☐☐☐☐☐☐☐☐☐

3.4 උපන් දිනය :——————.

3.5 2014.04.25 දිනට වයස :——————.

04. ජන වර්ගය :——————.

05. (i) මෙම විභාගයට පෙනී සිටීම සඳහා ඔබ ලබා ඇති සුදුසුකම් :

| ලබා ඇති සුදුසුකම් | එම සුදුසුකම ලබාගත් දිනය | විෂයයන් | ප්‍රතිඵල නිකුත් කළ දිනය | එම සුදුසුකම ලබා ගත් ආයතනය |
|---|---|---|---|---|
| | | | | |

(ii) අධ්‍යයන පොදු සහතික පත්‍ර (සා. පෙළ) විභාගයේදී සමත් වූ විෂයයන් :

| විෂයයන් | ලැබූ සාමාර්ථ්‍යය |
|---|---|
| | |

06. අතිරේක අධ්‍යාපන හා වෘත්තීය සුදුසුකම් :

07. තම චරිතය හා හැකියාව ගැන සහතික කළ හැකි අයදුම්කරු නම් කරන තීරකයන් දෙදෙනෙකුගේ නම් හා ලිපිනයන් :

(i)

(ii)

08. රාජ්‍ය/පළාත් රාජ්‍ය සේවයේ නිරත වෙමින් මෙම විභාගයට පෙනී සිටින අපේක්ෂකයින් පහත විස්තර සම්පූර්ණ කරන්න.

(i) ඔබ අයත්වන සේවාව/දෙපාර්තමේන්තුව ශ්‍රේණිය :——————.

(ii) එම සේවාවට/දෙපාර්තමේන්තු ශ්‍රේණියට ස්ථිරව පත් කරනු ලැබූ දිනය :

වර්ෂය: | | | | | මාසය: | | | දිනය : | | |

09. මුදල් කුවිතාන්සිය එහි දාරයකින් නොගැලවෙන ලෙස මෙම කොටුව තුළ අලවන්න.

| |
|---|
| |

(i) කුවිතාන්සියේ අංකය :————. (ii) විභාග ගාස්තු ගෙවූ ස්ථානය :————.

(iii) විභාග ගාස්තු ගෙවූ දිනය :————. (iv) ගෙවන ලද මුදල (රුපියල්) :————.

(මුදල් කුවිතාන්සියේ ඡායා පිටපතක් ළඟ තබා ගැනීම පසු විපරමකදී වැදගත් වේ.).

10. *අයදුම්කරුගේ සහතිකය*.- මෙහි සඳහන් කර ඇති තොරතුරු මාගේ දැනීමේ හා විශ්වාසය පරිදි සත්‍ය බවත්, විභාග ගාස්තු ගෙවන ලද අංක ......... හා ......... දින දරන මුදල් කුවිතාන්සිය මීට අමුණා ඇති බවත්, ප්‍රකාශ කරමි. තවද, තරග විභාගය පැවැත්වීම සම්බන්ධයෙන් විභාග කොමසාරිස් ජනරාල් විසින් පනවනු ලබන නීති රීතිවලට එකඟව ක්‍රියා කිරීමටත්, මෙම විභාගය පිළිබඳ කොන්දේසි අනුව මා නුසුදුස්සෙකු බව පෙනී ගියහොත් විභාගයට පෙර හෝ එය පවත්වද්දී හෝ ඉන්පසු හෝ මාගේ අපේක්ෂකත්වය අවලංගු කිරීමට ගනු ලබන යම් තීරණයකට මම එකඟ බවත් ප්‍රකාශ කරමි.

——————,
අයදුම්කරුගේ අත්සන.

දිනය :——————.

11. අයදුම්කරුගේ අත්සන සහතික කිරීම : ගැසට් නිවේදනයේ 08 (ඊ) ඡේදය බලන්න)

මෙම ඉල්ලුම්පත්‍රය ඉදිරිපත් කරන ......................... මහතා/මහත්මිය/මෙනවිය මා පෞද්ගලිකව දන්නා හඳුනන බවත් , 2014 .................මස .................. වැනි දින මා ඉදිරිපිට දී අත්සන් කළ බවත් මෙයින් සහතික කරමි.

——————,
සහතික කරන අයගේ අත්සන සහ මුද්‍රාව.

දිනය :——————.

සහතික කරන අයගේ සම්පූර්ණ නම :——————.

තනතුර :——————.

ලිපිනය :——————.

12. ආයතන ප්‍රධානියාගේ සහතිකය :

(දැනටමත් රාජ්‍ය සේවයේ/පළාත් රාජ්‍ය සේවයේ සේවය කරන විවෘත තරග විභාගයට පෙනී සිටින අයදුම්කරුවන් සඳහා)

මෙම ඉල්ලුම්පත්‍රය ඉදිරිපත් කරන ....................... මහතා/මහත්මිය/මෙනවිය .......................වැනි දින සිට මෙම කාර්යාලයේ සේවය කරන බවත්, ඔහුගේ/ඇයගේ වැඩ පැමිණීම සහ හැසිරීම සතුටුදායක බවත්, ඉහත 01 හා 08 ශීර්ෂවල සඳහන් කර ඇති තොරතුරු සියල්ලම මෙම කාර්යාලයේ ඇති වාර්තා ආශ්‍රයෙන් මම පෞද්ගලිකවම පරීක්ෂා කර බැලූ බවත්, ඒවා නිවැරදි බවත්, ඔහු/ඇය මෙම තනතුර සඳහා තෝරා ගනු ලැබුවහොත් දැනට දරන තනතුරෙන් නිදහස් කළ හැකි/නොහැකි බවත් 2014......... මස ......... වැනි දින ඔහු/ඇය මා ඉදිරිපිට දී අත්සන් කළ බවත් මෙයින් සහතික කරමි.

——————,
ආයතන ප්‍රධානියාගේ /ඔහුගේ බලයලත් නිලධාරියාගේ අත්සන හා මුද්‍රාව.

දිනය :——————.

සහතික කරන අයගේ සම්පූර්ණ නම :——————.

පදවිය :——————.

ලිපිනය :——————.

03-915

## කම්කරු වන්දි කොමසාරිස් කාර්යාලයේ ලඝු ලේඛක III පන්තියේ තනතුර සඳහා බඳවා ගැනීමේ විවෘත තරග විභාගය - 2014

කම්කරු වන්දි කොමසාරිස් කාර්යාලයේ ලඝු ලේඛක III පන්තියේ සිංහල මාධ්‍ය තනතුරු 03 ක පුරප්පාඩු පිරවීම සඳහා සුදුසුකම්ලත් ශ්‍රී ලාංකික පුරවැසියන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

02. කම්කරු හා කම්කරු සබඳතා අමාත්‍යාංශය යටතේ ඇති ජාතික ශ්‍රම අධ්‍යයන ආයතනය මගින් පවත්වනු ලබන ලිඛිත හා වෘත්තීය පරීක්ෂණ ප්‍රතිඵල අනුව සුදුසුකම් සපුරා ඇති අපේක්ෂකයන්ගෙන් කුසලතා අනුපිළිවෙල අනුව බඳවා ගැනීම සිදුකරනු ලැබේ.

03. තනතුරට අදාළ වැටුප් ක්‍රමය :

රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 6/2006 (iv) අනුව MN-1-2006 (A) රු. 13,120 - 10 x 145 - 11 x 170 - 10 x 240 - 10 x 320 රු. 22,040 වේ.

හතරවන වැටුප් පියවරට එළඹීමට පෙර කාර්යක්ෂමතා කඩඉමකි.

04. සේවා කොන්දේසි :

4.1 මෙම තනතුර ස්ථිරය. විශ්‍රාම වැටුප් සහිතය. වැන්දඹු අනත්දරු/වැන්දඹු පුරුෂ අනත්දරු විශ්‍රාම වැටුප් අරමුදලට දායක මුදල් ගෙවිය යුතුය. පත්වීම අවුරුදු තුනක (03) පරිවාස කාලයකට යටත්වේ.

4.2 2007.05.28 දිනැති 7/2007 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය අනුව සේවයට බැඳී වසර 5 ක් ඇතුළත සේවයට බැඳුණු භාෂා මාධ්‍යයට අතිරේක වශයෙන් අනෙක් රාජ්‍ය භාෂාව/භාෂා පිළිබඳ ප්‍රවිනතාවයක් ලබා ගත යුතුය.

4.3 කොළඹ 04, ලොරිස් පාර, අංක 128 හි පිහිටි කම්කරු වන්දි කොමසාරිස් කාර්යාලයේ හා දිවයින පුරා පිහිටි ජංගම කම්කරු වන්දි උසාවිවල සේවය කළ යුතුය.

05. සුදුසුකම් :

5.1 අයදුම්කරු ශ්‍රී ලංකාවේ පුරවැසියෙකු විය යුතුය.

5.2 ඉල්ලුම්පත් භාර ගන්නා අවසාන දිනට වයස අවුරුදු 18 ට නොඅඩු 30 ට නොවැඩි විය යුතුය.

5.3 යහපත් චරිතයකින් යුක්ත විය යුතුය.

5.4 අධ්‍යාපන සුදුසුකම් ඃ

(i) පළමු භාෂාව(සිංහල/ඉංග්‍රීසි/දෙමළ) සහ ගණිතය ඇතුළුව තවත් විෂයන් දෙක (02) කට සම්මාන සාමාර්ථ සහිතව එකවර විෂයන් හය (06) කින් අධ්‍යයන පොදු සහතික පත්‍ර (සා/පෙ) විභාගය සමත්වීම ; සහ

(ii) අධ්‍යයන පොදු සහතික පත්‍ර (උ/පෙ) විභාගයේ දී (නව විෂය නිර්දේශ යටතේ සාමාන්‍ය පොදු පරීක්ෂණය හා සාමාන්‍ය ඉංග්‍රීසි හැර) අවම වශයෙන් එක් විෂයයකින් හෝ සමත්වීම.

5.5 වෘත්තීය සුදුසුකම් :

තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් අනුමත ආයතනයක ලඝු ලේඛනය හා පරිගණක යතුරු ලියනය පිළිබඳ මාස හය(06) ක පාඨමාලාවක් සාර්ථකව හදාරා සහතිකයක් ලබා තිබීම හෝ අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගයේ දී යතුරු ලියනය හා ලඝු ලේඛනය විෂය සඳහා සම්මාන සාමාර්ථයක් ලබා තිබීම.

*සටහන.*—ලඝු ලේඛනය හා පරිඝණක යතුරු ලියනය සඳහා තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් අනුමත ආයතන පහත දැක්වේ.

* කාර්මික හා අධ්‍යාපන පුහුණු කිරීමේ දෙපාර්තමේන්තුවට අයත් කාර්මික විද්‍යාල හා තාක්ෂණ විද්‍යාල
* ජාතික ආධුනිකත්ව හා කාර්මික පුහුණු කිරීමේ අධිකාරියට අයත් පුහුණු මධ්‍යස්ථාන
* ජාතික තරුණ සේවා සභාවට අයත් පුහුණු මධ්‍යස්ථාන
* ශ්‍රී ලංකා වෘත්තීය පුහුණු අධිකාරියට අයත් පුහුණු මධ්‍යස්ථාන

06. විභාග පරිපාටිය :

මෙම බඳවා ගැනීමේ විවෘත තරග විභාගය ලිඛිත පරීක්ෂණයකින් හා වෘත්තීය පරීක්ෂණයකින් සමන්විතය. පළමුව ලිඛිත පරීක්ෂණය පැවැත්වෙන අතර එම ප්‍රශ්න පත්‍රයෙන් 40% කට වඩා ලකුණු ලබා ගන්නා අපේක්ෂයින් වෘත්තීය පරීක්ෂණයට කැඳවනු ලැබේ.

ලිඛිත විභාගය.-

| ප්‍රශ්න පත්‍රය | ලකුණු | කාලය |
|---|---|---|
| සාමාන්‍ය දැනීම සහ වාක්‍ය රචනය | 100 | පැය 01 |

*වෘත්තීය පරීක්ෂණය*

| විෂය | ලකුණු |
|---|---|
| ලඝු ලේඛනය හා පරිඝණක යතුරු ලියනය (සිංහල) | 100 |

(i) සාමාන්‍ය දැනීම සහ වාක්‍ය රචනය ඃ

දේශීය හා ජාත්‍යන්තර ක්ෂේත්‍රවල කාලීන සිදුවීම් පිළිබඳ සාමාන්‍ය දැනීම පරීක්ෂා කිරීම, කාලීන වැදගත්කමකින් යුත්, දෙන ලද මාතෘකා අතරින් තෝරා ගත් මාතෘකාවක් යටතේ රචනාවක් ලිවීම. (සුවිශේෂී අදහස් ඉදිරිපත් කිරීම, භාෂා කුසලතාවය, නිවැරදි ව්‍යාකරණය හා අක්ෂර වින්‍යාසය කෙරෙහි සැලකිල්ලක් දක්වනු ලැබේ.)

(ii) සිංහල ලඝු ලේඛනය හා පරිඝණක යතුරු ලියනය :

මිනිත්තු පහක් (5) තුළ නොකඩවා කියවනු ලබන ඡේදයක් මිනිත්තුවකට වචන 70 ක වේගයෙන් ලඝු සටහන් කරගෙන එම සටහන් මිනිත්තුවකට වචන 07 ක වේගයෙන් සාමාන්‍ය භාෂාවෙන් ලිවීම. යතුරු ලියනය ඃ මිනිත්තුවකට වචන 20 යි (මිනිත්තු 20 ක ඡේදයක්)

07. බඳවා ගැනීමේ ක්‍රමය :

මෙම විභාගය තරග විභාගයක් බැවින් පත්වීම ලැබීමට සුදුසුකම් ලැබීම සඳහා එක් එක් විෂය සඳහා වෙන් කර ඇති ලකුණුවලින් යටත් පිරිසෙයින් 40% ක් බැගින්වත් අපේක්ෂකයන් විසින් ලබා ගත යුතුය. තරග විභාගය සඳහා වෙන් කොට ඇති පුරප්පාඩු ගණන සපුරාලන පරිදි ලබා ගත් මුළු ලකුණු අනුපිළිවෙල අනුගමනය කරමින් පුරප්පාඩු සම්පූර්ණ කරනු ලැබේ. (මෙම දැන්වීමේ සඳහන් සුදුසුකම් සියල්ලම සපුරා තිබීම අනිවාර්ය වේ.)

08. විභාග ගාස්තු :

මෙම විභාගය සඳහා ගාස්තුව රු. 350 කි. එම විභාග ගාස්තුව ජාතික ශ්‍රම අධ්‍යයන ආයතනය නමින් ඇති පැලවත්ත ලංකා බැංකු ශාඛාවේ අංක 0071451995 දරන ගිණුමට බැර කර ඒ සඳහා නිකුත් කරන කුවිතාන්සිය අයදුම් පත්‍රයට නොගැලවෙන සේ අලවා එවිය යුතුය. ගෙවනු ලබන විභාග ගාස්තුව කිසිදු හේතුවක් මත ආපසු ගෙවනු නොලැබේ. කුවිතාන්සියේ ඡායා පිටපතක් ලඟ තබා ගැනීම ප්‍රයෝජනවත් වනු ඇත.

09. අයදුම්පත් පිළියෙල කිරීම :

9.1 මෙම නිවේදනයේ අගට යොදා ඇති ආදර්ශ අයදුම් පත්‍රය අනුව A4 ප්‍රමාණයේ දෙපැත්තම ප්‍රයෝජනයට ගනිමින්,

(අා) අංක 1 සිට 3 තෙක් ඡේදයන් පළමුවන පිටුවට ද ඉතිරිය අනෙක් පිටුවලට ද වන ලෙස සකස් කළ යුතු අතර අදාළ තොරතුරු තම අත් අකුරෙන්ම පැහැදිලිව සම්පූර්ණ කළ යුතුය.

(අා) නියමිත ආදර්ශ ආකෘතියට අදාළ නොවන, නියමිත දිනට විභාග ගාස්තු ගෙවා නොමැති හා නිවැරදිව සම්පූර්ණ කර නොමැති අසම්පූර්ණ තත්වයේ පවතින අයදුම් පත්‍ර කිසිදු දැනුම් දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ. නිසි පරිදි අයදුම්පත් සම්පූර්ණ නොකිරීමෙන් සිදුවන පාඩුව අයදුම්කරුවන් විසින් දරාගත යුතු වේ. ඉල්ලුම්පත්‍රයේ ඡායා පිටපතක් ළඟ තබා ගැනීම ප්‍රයෝජනවත් වනු ඇති අතර සම්පූර්ණ කරනු ලබන ඉල්ලුම්පත්‍රය විභාග නිවේදයේ දැක්වෙන ඉල්ලුම්පත්‍රයට අනුකූලද යන්න පිළිබඳ අයදුම්කරුවන් විසින් විමසා බැලිය යුතුවේ. එසේ නොවුනහොත් ඉල්ලුම්පත ප්‍රතික්ෂේප විය හැක.

9.2 මෙම විභාගය 2014 මැයි මාසයේ දී කොළඹ දී පමණක් පවත්වනු ලැබේ.

9.3 නිවේදනයේ සඳහන් සුදුසුකම් සහිත බව දක්වමින් එම නිවේදනයට අනුකූලව සකසා ඇති නියමිත විභාග ගාස්තු ගෙවා නියමිත දිනට හෝ එදිනට පෙර හෝ අයදුම්පත් ඉදිරිපත් කර ඇති අයදුම්කරුවන්ට නියමිත සුදුසුකම් සපුරා ඇතැයි යන පූර්ව නිගමන මත තරග විභාගයට පෙනී සිටීමට ජාතික ශ්‍රම අධ්‍යයන ආයතනයේ අධ්‍යක්ෂ ජනරාල් විසින් ඉඩ දෙනු ලැබේ. තරග විභාගයට පෙනී සිටීම සඳහා ප්‍රවේශ පත්‍රයක් නිකුත් කිරීම අයදුම්කරු මෙම තනතුර සඳහා සුදුසුකම් සපුරා ඇති බවට පිළිගැනීමක් ලෙස සලකනු නොලැබේ. අයදුම්කරුවන් සම්මුඛ පරීක්ෂණයට කැඳවා ගැසට් නිවේදනය අනුව සුදුසුකම් තිබේදැයි පරීක්ෂා කරන අවස්ථාවේ අසත්‍ය තොරතුරු සපයා ඇති බව හෝ අවශ්‍ය සුදුසුකම් නොමැති බව අනාවරණය වුවහොත් එම අයගේ අපේක්ෂත්වය අවලංගු කරනු ලැබේ.

9.4 අයදුම්පත් එවිය යුතු ආකාරය :

නිවැරදිව සම්පූර්ණ කරන ලද අයදුම්පත් 2014.04.21 දින හෝ ඊට පෙර අධ්‍යක්ෂ ජනරාල්, ජාතික ශ්‍රම අධ්‍යයන ආයතනය" අංක 267, පන්නිපිටිය පාර, පැලවත්ත, බත්තරමුල්ල යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතු වේ. අයදුම්පත් බහා එවන කවරයේ වම් පස ඉහළ කෙළවරේ "කම්කරු වන්දි කොමසාරිස් කාර්යාලයේ ලඝු ලේඛක තනතුර සඳහා බඳවා ගැනීමේ විවෘත තරඟ විභාගය 2014" යන්න සඳහන් කළ යුතුය. තැපෑලේ දී අස්ථානගත වන හෝ ප්‍රමාද වී ලැබෙන අයදුම්පත් පිළිබඳව වග කියනු නොලැබේ.

9.5 අයදුම්පතේ අපේක්ෂකයාගේ අත්සන රජයේ විද්‍යාලයක විදුහල්පතිවරයෙකු, සාමදාන විනිශ්චයකාරවරයෙකු, දිවුරුම් කොමසාරිස්වරයෙකු, ප්‍රසිද්ධ නොතාරිස්වරයෙකු ත්‍රිවිධ හමුදාවේ අධිකාරී බලයලත් නිලධාරියෙකු, පොලිස් සේවයේ ගැසට් කළ තනතුරක් දරන නිලධාරියෙකු හෝ වාර්ෂික වැටුප රු. 240,360 ක් හෝ ඊට වැඩි රජයේ හෝ පළාත් රාජ්‍ය සේවයේ ස්ථිර තනතුරක් දරන නිලධාරියෙකු විසින් සහතික කරනු ලැබ තිබිය යුතුය.

*ව්‍යාජ තොරතුරු සඳහා දඬුවම් :*

ඉල්ලුම්පත්‍රය පිරවීමේ දී ඉතා සැලකිලිමත්ව නිරවද්‍ය තොරතුරු සැපයිය යුතුය. මෙම විභාගයේ නීති රීති අනුව යම් අපේක්ෂකයකු නුසුදුසු බව අනාවරණය වුවහොත් විභාගයට පෙර හෝ විභාගය පැවැත්වෙද්දී හෝ විභාගයෙන් පසුව හෝ ඕනෑම අවස්ථාවක අපේක්ෂකත්වය අවලංගු කරනු ඇත. පත්වීම ලැබීමෙන් පසුව හෝ සාවද්‍ය තොරතුරු ඉදිරිපත් කර ඇති බව හෝ නිරවද්‍ය තොරතුරු සටහන් කර ඇති බව අනාවරණය වුවහොත් ඔහු/ඇය රාජ්‍ය සේවයෙන් පහ කිරීමට පිළිවන.

10. විභාගයට පෙනී සිටීම :

විභාගය පවත්වන දිනට සතියකට කලින් ලැබෙන සේ විභාග ප්‍රවේශපත්‍ර ජාතික ශ්‍රම අධ්‍යයන ආයතනයේ අධ්‍යක්ෂ ජනරාල් විසින් නිකුත් කරනු ඇත. එවැනි ප්‍රවේශ පත්‍රයක් නොමැතිව විභාගයට පෙනී සිටීමට ඉඩදෙනු නොලැබේ. විභාගය සඳහා පෙනී සිටින අයදුම්කරුවන් විභාග ශාලාධිපති වෙත ඔවුන්ගේ අත්සන සහතික කරවා ගත් ප්‍රවේශපත්‍ර ඉදිරිපත් කළ යුතුය.

අයදුම්කරුවන් වෙත ප්‍රවේශපත්‍ර නිකුත් කළ වහාම ඒ බව සඳහන් කරමින් පුවත්පත් නිවේදනයක් ජාතික ශ්‍රම අධ්‍යයන ආයතනය මගින් පළ කරනු ඇත. නිවේදනය පළ වී දින 02 ක් ගත හෝ 03 ක් වූ පසුවත් ප්‍රවේශපත්‍රය නොලැබුණි නම් දැන්වීමේ සඳහන් ආකාරයට ඒ බව ජාතික ශ්‍රම අධ්‍යයන ආයතනය වෙත දන්වා සිටිය යුතුය. ඔබ වෙත තබා ගත් අයදුම්පත්‍රයේ මුදල් ගෙවූ කුවිතාන්සියේ සහ ලියාපදිංචි කළ කුවිතාන්සියේ සහතික කළ ඡායා පිටපතක් ද සමග ඔබගේ විමසීම ජාතික ශ්‍රම අධ්‍යයන ආයතනය වෙත දැන්වීම වඩාත් ඵලදායී වනු ඇත.

11. අපේක්ෂකයින් අනන්‍යතාව සනාථ කිරීම සඳහා පහත සඳහන් ලියවිලිවලින් එකක් විභාග ශාලාධිපති වෙත ඉදිරිපත් කළ යුතුය.:—

(1) පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුව විසින් නිකුත් කරන ලද ජාතික හැඳුනුම්පත.

(2) වලංගු විදේශ ගමන් බලපත්‍රය.

12. විභාගය පැවැත්වීම සම්බන්ධයෙන් ජාතික ශ්‍රම අධ්‍යයන ආයතනයේ අධ්‍යක්ෂ ජනරාල් විසින් පනවනු ලබන නීතිරීතිවලට විභාග අපේක්ෂකයින් යටත් වේ. එම නීති රීති උල්ලංඝනය කළ හොත් ජාතික ශ්‍රම අධ්‍යයන ආයතනයේ ආයතන අධ්‍යක්ෂ ජනරාල් විසින් පනවනු ලබන දඬුවමකට යටත් වීමට ඔහුට හෝ ඇයට සිදුවේ.

13. මෙම විභාගය පැවැත්වීම, පත්වීම ලබාදීම හා අනෙකුත් සියලුම කරුණු පිළිබඳ අවසන් තීරණය කම්කරු හා කම්කරු සබඳතා අමාත්‍යාංශයේ ලේකම් සතු වන්නේය.

*සටහන :*

මෙම ගැසට් නිවේදනයේ සිංහල, දෙමළ හා ඉංග්‍රීසි මාධ්‍යවලින් පළවී ඇති නිවේදනවල කිසියම් පරස්පර විරෝධී බවක් ඇත්නම් නිවැරදි ලෙස සලකන්නේ සිංහල භාෂාවෙන් පළ කර ඇති නිවේදනය බව කරුණාවෙන් සලකන්න.

ඩබ්. ජේ. එල්. යූ. විජයවීර,
ලේකම්,

කම්කරු හා කම්කරු සබඳතා අමාත්‍යාංශය,
කම්කරු මහලේකම් කාර්යාලය,
2 වන මහල,
නාරාහේන්පිට,
කොළඹ 05.

ආදර්ශ අයදුම්පත්‍රය

(කාර්යාලීය ප්‍රයෝජනය සඳහා පමණි)

**කම්කරු වන්දි කොමසාරිස් කාර්යාලයේ ලඝු ලේඛක III තනතුර සඳහා බඳවා ගැනීමේ විවෘත තරග විභාගය - 2014**

The Open Competitive Examination for the Recruitment to the Post of Stenographer (Grade III) in the Office of the Commissioner For Workmen's Compensation -2014

1.0 1.1 අයදුම්කරුගේ මුලකුරු සමග නම :————.
(ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්) (උදා : Perera A. B. C.)

1.2 සම්පූර්ණ නම :————.
(ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්)

1.3 සම්පූර්ණ නම :————.
(සිංහලෙන්)

1.4 ජාතික හැඳුනුම්පත් අංකය: | | | | | | | | | |

1.5 ස්ත්‍රී/පුරුෂ භාවය : ස්ත්‍රී - 1
පුරුෂ -0
(අදාළ අංකය කොටුව තුළ ලියන්න)

2.0 2.1 ස්ථිර ලිපිනය :————.
(ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්)

2.2 ස්ථිර ලිපිනය :————.
(සිංහලෙන්)

2.3 විභාග ප්‍රවේශ පත්‍රය එවිය යුතු ලිපිනය :
(i) සිංහලෙන් :————.
(ii) ඉංග්‍රීසි කැපිටල් අකුරෙන් :————.

2.4 දුරකථන අංකය :————.

3.0 3.1 විවාහක/අවිවාහක බව : විවාහක -2, අවිවාහක- 1
(අදාළ අංකය කොටුව තුළ ලියන්න)

3.2 උපන් දිනය : වර්ෂය | | | | | මාසය | | | දිනය | | |

3.3 අයදුම්පත් කැඳවන අවසාන දිනට වයස :

අවුරුදු | | | මාස | | | දින | | |

3.4 ඔබ ශ්‍රී ලාංකික පුරවැසියකු වන්නේ උපතින්ද? ලියාපදිංචියෙන්ද? :————.

4.0 අධ්‍යාපන සුදුසුකම් :

4.1 අ.පො.ස. (සා/පෙළ) විභාගය :

(i) විභාගයේ වර්ෂය හා මාසය : වර්ෂය :————. මාසය :————.

(ii) විභාග අංකය :————.

(iii) ප්‍රතිඵල :

| විෂයය | සාමාර්ථය | විෂයය | සාමාර්ථය |
|---|---|---|---|
| 1. | | 6 | |
| 2. | | 7. | |
| 3. | | 8. | |
| 4. | | 9. | |
| 5. | | 10. | |

4.2 අ.පො.ස (උ/පෙළ) විභාගය පිළිබඳ විස්තර :
(i) විභාගයේ වර්ෂය හා මාසය : වර්ෂය :————.
මාසය :————.
(ii) විභාග අංකය :————.
(iii) ප්‍රතිඵල :

| විෂයය | සාමාර්ථය |
|---|---|
| 1. | |
| 2. | |
| 3. | |
| 4. | |

5.0 වෘත්තීය සුදුසුකම් :

| පාඨමාලාවේ නම | කාල සීමාව | ආයතනය |
|---|---|---|
| | | |

6.0 ඔබ කවර හෝ චෝදනාවක් සඳහා උසාවියකින් වරදකට දඬුවම් ලැබ තිබේද? (අදාළ කොටුවේ (✓) ලකුණ යොදන්න)

ඔව් | | නැත | |

එසේ දඬුවම් ලැබ ඇත්නම්, ඒ කුමන වරදක් සඳහා කවර අධිකරණයකින්, කවර දඬුවමක් ලැබ ඇත්ද යන තොරතුරු සපයන්න. :————.

7.0 විභාග ගාස්තු ගෙවූ ලදුපත පිළිබඳ විස්තර :

(i) විභාග ගාස්තු ගෙවූ ලංකා බැංකු ශාඛාවේ නම :————.
(ii) කුවිතාන්සි අංකය හා දිනය : අංකය :————. දිනය :————.
(iii) ගෙවූ මුදල :————.

ලදුපත නොගැලවෙන සේ මෙහි අලවන්න.

8.0 අයදුම්කරුගේ සහතිකය :

(අ) මෙම ඉල්ලුම් පත්‍රයේ ම විසින් සපයා ඇති තොරතුරු, මා දන්නා තරමින් සත්‍ය හා නිවැරදි බව ගෞරවයෙන් ප්‍රකාශ කර සිටිමි. මෙහි යම් තොරතුරක් සම්පූර්ණ නොකිරීමෙන් සහ /හෝ වැරදි ලෙස සම්පූර්ණ කිරීමෙන් විය හැකි අලාභය විඳදරා ගැනීමට එකඟ වෙමි. තවද මෙහි සියලුම තොරතුරු නිවැරදිව සම්පූර්ණ කර ඇති බවද ප්‍රකාශ කරමි.

(ආ) විභාගය පැවැත්වීම සම්බන්ධයෙන් ජාතික ශ්‍රම අධ්‍යයන ආයතනයේ අධ්‍යක්ෂ ජනරාල් විසින් පනවනු ලබන නීති රීතිවලට අනුකූලව ක්‍රියා කිරීමටත්, මෙම කොන්දේසි අනුව මා නුසුදුස්සකු බව අනාවරණය වුවහොත්, විභාගයට පෙර හෝ විභාගයෙන් පසුව හෝ මාගේ විභාග අපේක්ෂකත්වය අවලංගු කිරීමට ගනු ලබන තීරණයන් පිළිගැනීමට මා එකඟ වෙමි.

(ඇ) ම විසින් කරන ලද මෙම ප්‍රකාශනය අසත්‍ය යැයි ඔප්පු වුවහොත් පත්වීම ලැබීමට නුසුදුස්සකු වන බවත්, පත්වීම ලැබීමෙන් පසු වුවද සේවයෙන් පහ කරනු ලැබීමට යටත් වන බවද මම දනිමි.

(ඈ) මෙහි සඳහන් කිසිදු තොරතුරක් පසුව වෙනස් නොකරමි.

————————,
අයදුම්කරුගේ අත්සන.

දිනය :————.

9.0 අයදුම්කරුගේ අත්සන සහතික කිරීම :

මෙම අයදුම්පත ඉදිරිපත් කරනු ලබන ……………… මයා/ මිය/ මෙනවිය මා පෞද්ගලිකව දන්නා හඳුනන බවත්, ඔහු/ඇය ………… වැනි දින මා ඉදිරිපිටදී ඔහුගේ/ඇයගේ අත්සන තැබූ බවත් සහතික කරමි.

————————,
අත්සන සහතික කරන නිලධාරියාගේ
අත්සන හා නිල මුද්‍රාව.

දිනය :————.

සහතික කරන නිලධාරියාගේ නම :————.
තනතුර :————.
ලිපිනය :————.

03-688

---

## යෞවන කටයුතු හා නිපුණතා සංවර්ධන අමාත්‍යාංශය
## කාර්මික අධ්‍යාපන හා පුහුණු කිරීමේ දෙපාර්තමේන්තුව

කාර්මික අධ්‍යාපන හා පුහුණු කිරීමේ දෙපාර්තමේන්තුවෙහි කළමනාකරණ සහකාර (තාක්ෂණික නොවන) ඛණ්ඩ - 2 සේවා ගණයේ තනතුරුවල පුරප්පාඩු සඳහා (සීමිත) බඳවා ගැනීම - 2013

කාර්මික අධ්‍යාපන හා පුහුණු කිරීමේ දෙපාර්තමේන්තුවේ පහත සඳහන් තනතුරුවල පවතින පුරප්පාඩු පිරවීම සඳහා කාර්මික අධ්‍යාපන හා පුහුණු කිරීමේ දෙපාර්තමේන්තුවේ අදාළ දෙපාර්තමේන්තුගත ප්‍රාථමික සේවා ගණයන්හි නියමිත සුදුසුකම් සපුරා ඇති නිලධාරීන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ. අයදුම්කරුවන් ස්ථිර පත්වීම් දැරිය යුතු අතර, එම පත්වීම්වල ස්ථිර කරනු ලැබ සිටිය යුතු ය.

| බඳවා ගන්නා තනතුර | පුරප්පාඩු සංඛ්‍යාව | අයදුම්කළ හැකි දෙපාර්තමේන්තුගත ප්‍රාථමික සේවා ගණයන්ට අයත් තනතුරු |
|---|---|---|
| 1. පරිශ්‍ර පාලක | 07 | පෙදරේරු, වඩු කාර්මික, විදුලි කාර්මික |
| 2. වැඩහල් සහකාර | 11 | විදුලි කාර්මික, වෑද්දුම්කරු, යන්ත්‍ර ශිල්පී, පෙදරේරු, වඩු කාර්මික |

01. *බඳවා ගැනීමේ ක්‍රමය :*

ලිඛිත පරීක්ෂණයක හා ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක ප්‍රතිඵල මත බඳවා ගනු ලැබේ. පළමුව ලිඛිත පරීක්ෂණයක් පවත්වනු ලබන අතර, ලිඛිත පරීක්ෂණයෙන් සමත්වන අයදුම්කරුවන් අතරින් කුසලතා අනුපිළිවෙල අනුව ඉහළම ලකුණු ලැබූවන්ගෙන් පවතින පුරප්පාඩු සංඛ්‍යාව මෙන් දෙගුණයක් වනසේ සම්මුඛ පරීක්ෂණයට කැඳවනු ලැබේ. ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයෙන් හා ලිඛිත පරීක්ෂණයෙන් ලබාගන්නා ලකුණු ප්‍රමාණයේ එකතුව අනුව කුසලතා අනුපිළිවෙල සහ පවතින පුරප්පාඩු සංඛ්‍යාව මත අදාළ තනතුරේ III ශ්‍රේණියට බඳවා ගනු ලැබේ.

(i) ලිඛිත විභාගය :

| *ප්‍රශ්න පත්‍රය* | *කාලය* | *උපරිම ලකුණු ප්‍රමාණය* | *සමත් ලකුණු ප්‍රමාණය* |
|---|---|---|---|
| 1. සාමාන්‍ය දැනීම හා බුද්ධි පරීක්ෂණය | පැය 01 | 100 | 40% |

(ii) ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණය :

| *ලකුණු ලබා දෙනු ලබන ප්‍රධාන ශීර්ෂ* | *උපරිම ලකුණු ප්‍රමාණය* |
|---|---|
| අතිරේක අධ්‍යාපන සුදුසුකම් | 20 |
| අතිරේක වෘත්තීය සුදුසුකම් | 35 |
| අතිරේක පළපුරුද්ද | 30 |
| භාෂා ප්‍රවීණතාවය | 10 |
| සම්මුඛ පරීක්ෂණයේදී දක්වන කුසලතාවය | 05 |
| එකතුව | 100 |

02. *අධ්‍යාපන සුදුසුකම් :*

භාෂාව හා ගණිතය ඇතුළුව අ.පො.ස. (සා.පෙ.) විභාගයේදී දෙවරකට නොවැඩි වාර ගණනකදී යටත් පිරිසෙයින් සම්මාන දෙකක් සහිතව විෂයයන් හයකින් සමත්වී තිබීම.

03. *එක් එක් තනතුරට අදාල වෘත්තීය සුදුසුකම් :*

(අ) පරිශ්‍ර පාලක :
තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව පිළිගත් ආයතනයකින් ඉදිකිරීම් ක්ෂේත්‍රයේ ජාතික වෘත්තීය කුසලතාවයන්හි (NVQ) 4 වන මට්ටමේ පාඨමාලාවක් හදාරා සහතිකයක් ලබා තිබීම.

(ආ) වැඩහල් සහකාර :
තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව පිළිගත් ආයතනයකින් යාන්ත්‍රික/සිවිල් ක්ෂේත්‍රය පිළිබඳ ජාතික වෘත්තීය කුසලතාවයන්හි ( NVQ ) 4 වන මට්ටමේ පාඨමාලාවක් හදාරා සහතිකයක් ලබා තිබීම.

04. සේවා පළපුරුද්ද :

අයදුම්පත් කැඳවන අවසාන දිනට කාර්මික අධ්‍යාපන හා පුහුණු කිරීමේ දෙපාර්තමේන්තුවට අයත් ඉහත සඳහන් අයදුම්කළ හැකි දෙපාර්තමේන්තුගත තනතුරක ස්ථිර පත්වීමක් ලැබ යටත් පිරිසෙයින් අවුරුදු 05 ක අඛණ්ඩ හා සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කොට තිබිය යුතු අතර ඒ බව දෙපාර්තමේන්තු ප්‍රධානියා විසින් සහතික කර තිබිය යුතුය. යම් තනතුරකට ස්ථිරව පත්කිරීමට පෙර සේවය කර ඇත්තාවූ හෝ යම් තනතුරකට ස්ථිර වශයෙන් පත්කිරීම් සඳහා කොන්දේසියක් වශයෙන් සේවය කර ඇත්තාවූ පුහුණු වීමේ කාල පරිච්ඡේදයක් හෝ යම් තනතුරකට ස්ථිර වශයෙන් පත් කිරීමට පෙර සේවය කර ඇති තාවකාලික/අනියම්/සහන සේවා කාල පරිච්ඡේදයක් මෙම සුදුසුකම් ලැබීමේ පස් අවුරුදු කාල සීමාව සඳහා ගණන් ගනු නොලැබේ.

05. වයස් සීමාව: අදාල නොවේ.

06. *වැටුප* :
මෙම තනතුරු සඳහා රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 6/2006 (iv) පරිදි, වැටුප් කේත අංකය : MN - 1-2006 (ඒ) රු. 13,120- 10 x 145- 11 x 170 - 10 x 240 - 10 x 320 - රු.22,040 වැටුප් පරිමාණය හිමිවේ.

07. ඉහත තනතුරු සඳහා ඉල්ලුම් කරන අයදුම්කරුවන් සියලු දෙනා විශිෂ්ට චරිතයකින් හා ශ්‍රී ලංකාවේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමටත් තනතුරේ රාජකාරි ඉටු කිරීමටත් ප්‍රමාණවත් ශාරීරික හා මානසික සෞඛ්‍යයකින් යුක්ත ශ්‍රී ලාංකික පුරවැසියන් විය යුතුය. එක් එක් තනතුරට බඳවා ගැනීම සඳහා අවශ්‍ය සියලු සුදුසුකම් අයදුම්පත් භාර ගන්නා අවසාන දිනට සෑම ආකාරයකින්ම සම්පූර්ණ කර තිබිය යුතුය.

08. *අයදුම්පත් ඉදිරිපත් කළ යුතු ආකාරය* :

i. මෙහි පහත දැක්වෙන ආදර්ශ අයදුම් පත්‍රය අනුව A4 ප්‍රමාණයේ කඩදාසියක දෙපිටම ප්‍රයෝජනයට ගනිමින් අංක 01 සිට 07 දක්වා පළමුවැනි පිටුවට ද, අංක 08 සිට 10 දක්වා දෙවැනි පිටුවට ද අනිකුත් කරුණු ඊළඟ පිටුවලට ද වන සේ සකස් කරගත් අයදුම්පත් තම අත්අකුරින්ම නිසි ලෙස සම්පූර්ණ කොට "අධ්‍යක්ෂ ජනරාල්, කාර්මික අධ්‍යාපන හා පුහුණු කිරීමේ දෙපාර්තමේන්තුව, තැ. පෙ. 557, ඕල්කොට් මාවත, කොළඹ 10" යන ලිපිනයට 2014.04.28 දිනට පෙර ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය. "අයදුම්පත් බහා එවන ලියුම් කවරයේ ඉහළ වම් කෙළවරේ "............... (අදාළ තනතුර සඳහන් කළ යුතුය) තනතුර සඳහා අයදුම්පත්‍රය" යන්න පැහැදිලිව ලියා තිබිය යුතුය.

ii. ආදර්ශ අයදුම්පත්‍රයට අනුකූල නොවන හා අසම්පූර්ණ තොරතුරු සහිත අයදුම්පත් සහ භාරගන්නා අවසාන දිනට පසුව ලැබෙන අයදුම්පත් පිළිගනු නොලැබේ. තැපැල් මාර්ගයෙන් එවීමේදී සිදුවන ප්‍රමාදයන් වලක්වා ගැනීම සඳහා කල්වේලා ඇතිව ඉල්ලුම්පත් තැපැල් කිරීමට අයදුම්කරුවන්ට උපදෙස් දෙනු ලැබේ.

iii. ඉහත තනතුරු සඳහා වෙන වෙනම අයදුම්පත් ඉදිරිපත් කළ යුතුවේ.

iv. විභාගයට පෙනී සිටින මාධ්‍යයෙන් අයදුම්පත සම්පූර්ණ කළ යුතුවේ.

v. එක් තනතුරක් සඳහා විභාග ගාස්තුව රු. 100 ක් වන අතර එක් එක් තනතුර සඳහා වෙන වෙනම විභාග ගාස්තු ගෙවිය යුතු වේ. එම ගාස්තුව කාර්මික අධ්‍යාපන හා පුහුණු කිරීමේ දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල් නමින් මහජන බැංකුවේ නගර මධ්‍ය ශාඛාවේ අංක 176- 100 - 139026228 දරන ගිණුමට යැවෙන ලෙස දිවයිනේ පිහිටි ඕනෑම මහජන බැංකු ශාඛාවකින්ම ගෙවා ලබාගන්නා ලද කුවිතාන්සිය නොගැළවෙන සේ ඇලවිය යුතුය. ඔබගේ අයදුම්පත්‍රයේ සහ කුවිතාන්සියේ ඡායා පිටපතක් ළඟ තබා ගැනීම ප්‍රයෝජනවත් වනු ඇත. කිසිදු හේතුවක් මත විභාග ගාස්තු ආපසු ගෙවනු නොලබන අතර මුදල් ඇණවුම් හා මුද්දර භාර ගනු නොලැබේ.

vi. සෑම අයදුම්කරුවකුම තම අත්සන තාක්ෂණ/කාර්මික විද්‍යාලයක අධ්‍යක්ෂ හෝ විදුහල්පති හෝ ලේඛකාධිකාරී ලවා සහතික කරවා ගත යුතුය.

vii. විභාග ප්‍රවේශ පත්‍රය අපේක්ෂක/අපේක්ෂිකාවන් වෙත යොමුකිරීම සඳහා අයදුම්කරුගේ ලිපිනය සඳහන් කර රු. 30 ක වටිනාකම සහිතව මුද්දර අලවන ලද 23cm x 10cm ප්‍රමාණයේ ලියුම් කවරයක් ඉල්ලුම් පත්‍රය සමඟ අමුණා එවිය යුතුය.

viii. අයදුම්පත්‍රයෙහි සඳහන් කර ඇති යම් තොරතුරක් අසත්‍ය බව බඳවා ගැනීමට පෙර අනාවරණය වුවහොත් අයදුම්කරුගේ අපේක්ෂත්වය අවලංගු කරනු ලැබේ. එම තොරතුරු බඳවා ගැනීමෙන් පසුව අසත්‍ය බව අනාවරණය වුවහොත් සේවයෙන් පහ කිරීමට කටයුතු කරනු ලැබේ.

ix. දෙපාර්තමේන්තුවේ කිසිවකුගේ නමට අයදුම්පත් නොඑවිය යුතු අතර එසේ එවන හෝ අතින් ගෙනැවිත් භාරදෙන හෝ අයදුම්පත් කිසිවක් භාරගනු නොලැබේ. යම් අයදුම්පතත් තැපෑලේදී නැතිවූ බවට හෝ ප්‍රමාද වූ බවට හෝ වන පැමිණිලි කිසිවක් සලකා බලනු නොලබන අතර අයදුම්පත් ලද බව දන්වා එවනු නොලැබේ.

09. රාජ්‍ය භාෂා ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීම :
රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක : 07/2007 හා ඊට අනුෂාංගික චක්‍රලේඛ අනුව අදාළ මට්ටමේ අනෙක් රාජ්‍ය භාෂාව පිළිබඳව ප්‍රවීණතාවයක් සේවයට බැඳී වසර 05 ක් තුළ ලබාගත යුතුය.

10. විභාග පරිපාටිය :

i. විධිමත් ලෙස අයදුම්පත් එවා ඇති අපේක්ෂක/අපේක්ෂිකාවන්ට කාර්මික අධ්‍යාපන හා පුහුණු කිරීමේ දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල් විසින් ප්‍රවේශ පත්‍ර නිකුත් කරනු ඇත. අපේක්ෂයෙකු/අපේක්ෂකාවක තමාට නියමිත මධ්‍යස්ථානයේදී විභාග ශාලාධිපති වෙත තම අත්සන සහතික කරවා ගත් ප්‍රවේශ පත්‍රය ඉදිරිපත් කළ යුතුය. ප්‍රවේශ පත්‍රය ඉදිරිපත් නොකරන කිසිදු අයදුම්කරුවකුට විභාගයට පෙනී සිටීමට අවසර දෙනු නොලැබේ.

ii. මෙම විභාගයට පෙනී සිටීම වෙනුවෙන් අපේක්ෂක/අපේක්ෂිකාවන්ට දැරීමට සිදුවන ගමන් වියදම් හෝ වෙනත් කිසිදු දීමනාවක් ගෙවනු නොලැබේ.

iii. තමා පෙනී සිටින සෑම විෂයයක් සම්බන්ධයෙන් විභාග ශාලාධිපති සෑහීමකට පත්වන අයුරින් අපේක්ෂකයෙකු විභාග ශාලාවේදී තම අනන්‍යතාව ඔප්පු කළ යුතුය. මේ සඳහා,

(අ) පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුව නිකුත් කළ ජාතික හැඳුනුම්පත, හෝ

(ආ) වලංගු විදේශ ගමන් බලපත්‍රයක, හෝ

පමණක් පිළිගැනේ.

iv. විභාගය සිංහල සහ දෙමළ යන මාධ්‍ය දෙකෙන් පමණක් පවත්වනු ලැබේ. ඉල්ලුම් කරන ලද මාධ්‍ය පසුව වෙනස් කිරීමට ඉඩ දෙනු නොලැබේ.

v. අයදුම්පත් කැඳවීමේ නිවේදනයේ සඳහන් සුදුසුකම් ඇති අය පමණක් ඉල්ලුම් කර ඇතැයි යන පූර්ව නිගමනය මත නියමිත ගාස්තු ගෙවා නියමිත දිනට හෝ ඊට පෙර ඉල්ලුම් පත්‍ර ඉදිරිපත් කර ඇති සියලුම අයදුම්කරුවන්ට තරග විභාගයට පෙනී සිටීමට කාර්මික අධ්‍යාපන හා පුහුණු කිරීමේ දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල් විසින් ඉඩ දෙනු ලැබේ. තරග විභාගයට පෙනී සිටීම සුදුසුකම් සපුරා ඇති බවට පිළිගැනීමක් ලෙස සලකනු නොලැබේ.

vi. විභාගය පැවැත්වීම සම්බන්ධයෙන් කාර්මික අධ්‍යාපන හා පුහුණු කිරීමේ දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල් විසින් පනවනු ලබන නීතිරීතිවලට විභාග අපේක්ෂකයින් යටත් වේ.

vii. මෙම විභාගය කාර්මික අධ්‍යාපන හා පුහුණු කිරීමේ දෙපාර්තමේන්තුවේ පරීක්ෂණ හා ඇගයීම් අංශය විසින් කොළඹ විභාග මධ්‍යස්ථානවලදී පමණක් පවත්වනු ලැබේ.

11. *සේවයේ නියුක්ත කරවීමේ කොන්දේසි :*

i. මෙම තනතුර ස්ථිරය. විශ්‍රාම වැටුප් සහිතය. වැන්දඹු අනත්දරු/වැන්දඹු පුරුෂ අනත්දරු විශ්‍රාම වැටුප් අරමුදලට දායක මුදල් ගෙවිය යුතුය.

ii. නියම කරනු ලබන පරිදි මෙම දෙපාර්තමේන්තුවට අයත් ඕනෑම තාක්ෂණ/කාර්මික විද්‍යාලයක වුවද සේවය කිරීමට හැකි විය යුතුය.

iii. තෝරාගනු ලබන අපේක්ෂකයන් තනතුරට අදාළ බඳවා ගැනීමේ පරිපාටියේ විධිවිධානවලට ද, ආයතන සංග්‍රහයේ විධිවිධානවලට ද මුදල් රෙගුලාසිවලට ද රජය හෝ රේඛීය අමාත්‍යාංශය හෝ කාර්මික අධ්‍යාපන හා පුහුණු කිරීමේ දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල් විසින් නිකුත් කරනු ලබන නීති හා රෙගුලාසිවලට ද යටත් විය යුතුය.

iv. අංක 1589/30 හා 2009.02.20 දිනැති *අතිවිශෙෂ ගැසට් පත්‍රයෙන්* රාජ්‍ය සේවා කොමිෂන් සභාව මගින් ප්‍රකාශිත කාර්ය පරිපාටික රීතිවල දැක්වෙන පොදු කොන්දේසි හා විධිවිධාන අදාළ වේ.

12. පුරප්පාඩුවලින් කොටසක් හෝ සියල්ලම හෝ පිරවීමේ අයිතිය කාර්මික අධ්‍යාපන හා පුහුණු කිරීමේ දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල් සතුවේ.

13. මෙම ගැසට් නිවේදනයේ සිංහල, දෙමළ හා ඉංග්‍රීසි භාෂා පාඨ අතර යම් අනනුකූලතාවයක් ඇතිවුවහොත්, එවිට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුත්තේය.

එස්. බාලසුබ්‍රමනියම්,
අධ්‍යක්ෂ ජනරාල්.

2014 මාර්තු මස 28 වැනි දින,
කාර්මික අධ්‍යාපන හා පුහුණු කිරීමේ දෙපාර්තමේන්තුව, කොළඹ 10.

ආදර්ශ අයදුම්පත්‍රය

කාර්යාලයීය ප්‍රයෝජනය සඳහා

කාර්මික අධ්‍යාපන හා පුහුණු කිරීමේ දෙපාර්තමේන්තුවේ කළමනාකරණ සහකාර (තාක්ෂණික නොවන) ඛණ්ඩ - 2 සේවා ගණයේ ..................තනතුර සඳහා (සීමිත) බඳවා ගැනීම 2013 සඳහා අයදුම්පත්‍රය

විභාගයට පෙනී සිටින භාෂා මාධ්‍යය [ ] : සිංහල - 1, දෙමළ - 2

1. අයදුම්කරුගේ නම :

 i. මුලකුරු අගට යොදා මුලකුරු සමග නම (ඉංග්‍රීසි කැපිටල් අකුරින්) :————.
 ii. සම්පූර්ණ නම (ඉංග්‍රීසි කැපිටල් අකුරින්) :————.
 iii. සම්පූර්ණ නම (සිංහලෙන්/දෙමළෙන්) :————.

2. ලිපිනය හා දුරකථන අංකය :
 1. කාර්යාලයීය ලිපිනය :————.
 දුරකථන අංකය :————.
 2. පෞද්ගලික ලිපිනය :————.
 දුරකථන අංකය :————.
 (ලිපිනයේ හෝ දුරකථන අංකයේ වෙනසක් වුවහොත්, වහාම දැන්විය යුතුය.)

3. උපන් දිනය :
 අවුරුද්ද :———. මාසය :———. දිනය :———.

4. අයදුම්පත් භාරගන්නා අවසාන දිනට වයස :
 අවුරුදු :———. මාස :———. දින :———.

5. ජාතික හැඳුනුම්පත් අංකය :————.

6. ස්ත්‍රී/පුරුෂ භාවය :————.

7. විවාහක/අවිවාහක/වැන්දඹු ද යන වග :————.

8. අධ්‍යාපන සුදුසුකම්

අ.පො.ස. (සා.පෙ.) විභාගය

වර්ෂය :————. විභාග අංකය :————.

| විෂයය | ශ්‍රේණිය |
|---|---|
| | |
| | |
| | |
| | |
| | |
| | |
| | |
| | |
| | |
| | |

අ.පො.ස. (උ. පෙ.) විභාගය

වර්ෂය :————.විභාග අංකය :————.

| විෂයය | ශ්‍රේණිය |
|---|---|
| | |
| | |
| | |
| | |
| | |

9. වෘත්තීය සුදුසුකම් :

| විභාගය/ඩිප්ලෝමාව | වර්ෂය | පෙනීසිටි විෂයයන් | සාමාර්ථය | ආයතනයේ/විශ්ව විද්‍යාලයේ නම |
|---|---|---|---|---|
| | | | | |

10. පළපුරුද්ද පිළිබඳ විස්තර :

| සේවය කළ ආයතන | තනතුර | සේවය කළ කාලය | රාජ්‍ය අංශය/ අර්ධ රාජ්‍ය අංශය /පෞද්ගලික අංශය යන වග |
|---|---|---|---|
| | | | |

11. පහත සඳහන් විෂයයන්ගෙන් සමත් උසස්ම පරීක්ෂණය :-

සිංහල :————.
දෙමළ :————.
ඉංග්‍රීසි :————.

12. ඔබ ශ්‍රී ලංකාවේ පුරවැසියෙකු වන්නේ නම් පෙළපතින් ද/ලියාපදිංචි කිරීමෙන් ද යන්න සඳහන් කරන්න.
(ලියාපදිංචි කිරීමෙන් නම් විස්තර සපයන්න) :————.

13. විභාග ගාස්තු ගෙවන ලද මහජන බැංකු ශාඛාව :
මුදල් ගෙවූ දිනය :————.

කුවිතාන්සිය නොගැලවෙනසේ අමුණා එවිය යුතු ය.

මෙම අයදුම්පතෙහි මා විසින් සපයා තිබෙන තොරතුරු සත්‍ය හා නිවැරදි බව මෙයින් සහතික කරමි. මෙහි ඇතුළත් තොරතුරුවලින් කිසිවක් අසත්‍ය හෝ නිවැරදි නොවන බව මා තෝරා ගැනීමට පෙර දැනගතහොත් නුසුදුස්සෙක් වීමට යටත් වන බවත් පත්කිරීමෙන් පසු ඒ බව දැනගතහොත් මා කිසිදු වන්දියක් නොලබා සේවයෙන් පහ කිරීමටත් යටත් වන බවත් මම දනිමි.

————,
අයදුම්කරුගේ අත්සන.

දිනය :————.

*ආයතන ප්‍රධානියාගේ සහතිකය*

කාර්මික අධ්‍යාපන හා පුහුණු කිරීමේ දෙපාර්තමේන්තුවේ සේවය කරන ...................... මයා/මිය/මෙනවිය දැනට........... තනතුරේ සේවය කරන බවත්, ඔහුගේ වැඩ සහ හැසිරීම සතුටුදායක වන බවත්, විනයානුකුල කටයුතු කිසිවක් නොමැති බවත්, ඒ පිළිබඳව කටයුතු කිරීමට අදහස් කර නොමැති බවත්, නියමිත විභාග ගාස්තුව ගෙවා ඇති බවත්, එම කුවිතාන්සිය අලවා ඇති බවත් සහතික කරමි.

————,
ආයතන ප්‍රධානියාගේ අත්සන.

දිනය :————.

(නිල මුද්‍රාව)

03-931/1

---

**යෞවන කටයුතු හා නිපුණතා සංවර්ධන අමාත්‍යාංශය**

කාර්මික අධ්‍යාපන හා පුහුණු කිරීමේ දෙපාර්තමේන්තුව

කාර්මික අධ්‍යාපන හා පුහුණු කිරීමේ දෙපාර්තමේන්තුවෙහි කළමනාකරණ සහකාර (තාක්ෂණික නොවන) ඛණ්ඩ - 2 සේවා ගණයේ තනතුරුවල පුරප්පාඩු සඳහා (විවෘත) බඳවා ගැනීම - 2013

කාර්මික අධ්‍යාපන හා පුහුණු කිරීමේ දෙපාර්තමේන්තුවේ පහත සඳහන් තනතුරුවල පවතින පුරප්පාඩු පිරවීම සඳහා නියමිත සුදුසුකම් සපුරා ඇති අයවලුන්ගෙන් අයදුම්පත් කඳවනු ලැබේ.

| බඳවා ගන්නා තනතුර | පුරප්පාඩු සංඛ්‍යාව |
|---|---|
| 1. පරිශ්‍ර පාලක | 17 |
| 2. වැඩහල් සහකාර | 27 |

01. බඳවා ගැනීමේ ක්‍රමය.-

ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක ප්‍රතිඵල මත කුසලතා අනුපිළිවෙල සහ පවතින පුරප්පාඩු සංඛ්‍යාව අනුව අදළ තනතුරේ III ශ්‍රේණියට බඳවා ගනු ලැබේ.

ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණය

| ලකුණු ලබා දෙනු ලබන ප්‍රධාන ශීර්ෂ | උපරිම ලකුණු ප්‍රමාණය |
|---|---|
| අතිරේක අධ්‍යාපන සුදුසුකම් | 20 |
| අතිරේක වෘත්තීය සුදුසුකම් | 35 |
| අතිරේක පළපුරුද්ද | 30 |
| භාෂා ප්‍රවීණතාවය | 10 |
| සම්මුඛ පරීක්ෂණයේ දී දක්වන කුසලතාවය | 05 |
| එකතුව | 100 |

02. අධ්‍යාපන සුදුසුකම් :

1. සිංහල/දෙමළ/ඉංග්‍රීසි භාෂාව, ගණිතය සහ තවත් විෂයයන් දෙකකට සම්මාන සාමාර්ථයක් සහතිව එක් වරකදී විෂයයන්

හය (06) කින් අධ්‍යයන පොදු සහතික පත්‍ර (සා. පෙ.) විභාගය සමත් වී තිබීම ; සහ

2. අධ්‍යයන පොදු සහතික පත්‍ර (උ. පෙ.) විභාගයේ දී අවම වශයෙන් විෂයයන් එකක්වත් (01) (සාමාන්‍ය පොදු පරීක්ෂණය හැර) සමත්ව තිබීම.

3. එක් එක් තනතුරට අදාළ වෘත්තීය සුදුසුකම් හා රාජකාරි ස්වභාවය :

(අ) *පරිශ්‍ර පාලක*

(i) **වෘත්තීය සුදුසුකම් :**

1. කර්මාන්ත තාක්ෂණිකයින් සඳහා වූ ජාතික (සිවිල් ඉංජිනේරු) සහතිකය ලබා තිබීම; හෝ

2. ගොඩනැගිලි ඉදිකිරීම් තාක්ෂණ ශිල්පි ජාතික සහතිකය ලබා තිබීම ; හෝ

3. තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව පිළිගත් ආයතනයකින් ඉදිකිරීම් ක්ෂේත්‍රයේ ජාතික වෘත්තීය කුසලතාවයන්හි (NVQ) පූර්ණ කාලීන 4 වන මට්ටමේ පාඨමාලාවක් හදාරා සහතිකයක් ලබා තිබීම.

(ii) **රාජකාරි ස්වභාවය :**

(i) විද්‍යාලයේ පුහුණු හා නුපුහුණු ප්‍රාථමික සේවක සංචිතයේ කටයුතු අධීක්ෂණය.
(ii) විද්‍යාල පරිශ්‍රයේ ගොඩනැගිලි හා භූමි භාගයේ නඩත්තු කිරීම කටයුතු සංවිධානය හා අධීක්ෂණය.
(iii) නිෂ්පාදන හා සේවා ඒකක කටයුතු සඳහා සහභාගී වීම.
(iv) ආයතන ප්‍රධානියා විසින් තනතුරට අදාළව පවරනු ලබන අනෙකුත් රාජකාරි.

(ආ) *වැඩහල් සහකාර*

(i) වෘත්තීය සුදුසුකම් :

තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව පිළිගත් ආයතනයකින් යාන්ත්‍රික/සිවිල් ක්ෂේත්‍රයේ ජාතික වෘත්තීය කුසලතාවයන්හි (NVQ) පූර්ණ කාලීන 4 වන මට්ටමේ පාඨමාලාවක් හදාරා සහතිකයක් ලබා තිබීම.

(ii) **රාජකාරි ස්වභාවය :**

(i) තාක්ෂණ/කාර්මික විද්‍යාලවල ඇති වැඩහල්වල වට්ටෝරු පොත් පරීක්ෂා කිරීම හා වාර්තා කිරීම.
(ii) වැඩහල්වල පවතින ඌණතා අතිරික්තතා වාර්තා කිරීම.
(iii) වැඩහල්වල කළ යුතු අළුත්වැඩියාවන් හා සේවාවන් පිළිබඳ වාර්තා කිරීම.
(iv) ආයතන ප්‍රධානියා විසින් තනතුරට අදාළව පවරනු ලබන අනෙකුත් රාජකාරි.

04. *සේවා පළපුරුද්ද :*

රජයේ හෝ රජයේ ලියාපදිංචි ආයතනයක අදාළ තනතුරේ/ක්ෂේත්‍රයේ වසර 01 ක පළපුරුද්දක් ලබා තිබීම.

05. වයස් සීමාව.-අයදුම්පත් භාර ගන්නා අවසාන දිනට වයස අවුරුදු 18 ට නොඅඩු හා අවුරුදු 30 ට නොවැඩි විය යුතු ය.

06. *වැටුප :-*

මෙම තනතුරු සඳහා රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 6/2006 (iv) පරිදි, වැටුප් කේත අංකය : MN -1-2006 (ඒ) රු. 13,120 - 10 x 145 - 11 x 170 - 10 x 240 - 10 x 320 - රු. 22,040 වැටුප් පරිමාණය හිමිවේ.

07. ඉහත තනතුරු සඳහා ඉල්ලුම් කරන අයදුම්කරුවන් සියළුදෙනා විශිෂ්ඨ චරිතයකින් හා ශ්‍රී ලංකාවේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමටත් තනතුරේ රාජකාරි ඉටු කිරීමටත් ප්‍රමාණවත් ශාරීරික හා මානසික සෞඛ්‍යයකින් යුක්ත ශ්‍රී ලාංකික පුරවැසියන් විය යුතු ය. එක් එක් තනතුරට බඳවා ගැනීම සඳහා අවශ්‍ය සියළු සුදුසුකම් අයදුම්පත් භාර ගන්නා අවසාන දිනට සෑම ආකාරයකින්ම සම්පූර්ණ කර තිබිය යුතු ය.

08. *අයදුම් කිරීමේ ක්‍රමය :*

(i) අයදුම්පත් 2014.04.28 දිනට හෝ එදිනට ප්‍රථම "අධ්‍යක්ෂ ජනරාල් කාර්මික අධ්‍යාපන හා පුහුණු කිරීමේ දෙපාර්තමේන්තුව, තැ. පෙ. 557, ඕල්කොට් මාවත, කොළඹ 10," යන ලිපිනයට ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් ඉදිරිපත් කළ යුතුවේ. එදිනට පසුව ලැබෙන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

(ii) ඉදිරිපත් කළ යුතු අයදුම්පත්‍රයේ ආදර්ශ ආකෘතියක් මෙම නිවේදනයේ අවසානයේ දැක්වේ. අයදුම්කරුවන් ඔවුන්ගේ අයදුම්පත් A4 ප්‍රමාණයේ කඩදාසියක සකස් කර මුල් පිටුව අංක 01 සිට 07 දක්වාත් දෙවන පිටුව අංක 08 සිට 11 දක්වාත් අනිකුත් කරුණු ඊළඟ පිටුවලටද වන ආකාරයෙන් පිළියෙල කර තමාගේ අත්අකුරින්ම සම්පූර්ණ කළ යුතු ය.

(iii) අයදුම්පත් බහා එවන ලියුම් කවරයේ ඉහළ වම් කෙළවරේ"....... (අදාල තනතුර සඳහන් කළ යුතුය) තනතුර සඳහා අයදුම්පත්‍රය" යන්නන පැහැදිලිව ලියා තිබිය යුතු ය.

(iv) අයදුම්පත්‍රයේ අපේක්ෂකයාගේ අත්සන රජයේ විද්‍යාලයක විදුහල්පතිවරයෙකු/සාමදාන විනිශ්චයකාරවරයෙකු/දිවුරුම් කොමසාරිස්වරයෙකු/නීතිඥවරයෙකු/ප්‍රසිද්ධ නොතාරිස්වරයෙකු/ත්‍රිවිධ හමුදාවේ අධිකාරීලත් නිලධාරියෙකු හෝ රු. 22,935 ක මාසික ඒකාබද්ධ වැටුපක් ලබන රජයේ ස්ථිර තනතුරක් දරන නිලධාරියෙකු විසින් සහතික කළ යුතු ය.

(v) දැනට රාජ්‍ය සේවයේ හෝ පළාත් රාජ්‍ය සේවයේ නියුක්ත නිලධාරීන් තම අයදුම්පත් තමන් සේවය කරන දෙපාර්තමේන්තුවේ දෙපාර්තමේන්තු ප්‍රධානියා මඟින් ඉදිරිපත් කළ යුතුය.

(vi) මේ සමඟ ඇති ආදර්ශ අයදුම්පත්‍රයේ ආකෘතියට අනුකූල නොවන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ. අයදුම්පත් නැතිවීම හෝ ප්‍රමාදවීම ගැන කිසිදු පැමිණිල්ලක් භාරගනු නොලැබේ. තැපැල් මාර්ගයෙන් එවීමේ දී සිදුවන ප්‍රමාදයන් වලක්වා ගැනීම සඳහා කල්වේලා ඇතිව ඉල්ලුම්පත් තැපැල් කිරීමට අයදුම්කරුවන්ට උපදෙස් දෙනු ලැබේ. අයදුම්පත් ලද බව දන්වා එවනු නොලැබේ. නියමිත සුදුසුකම් සපුරා නැති අයදුම්පත් සහ නියමාකාරයෙන් සම්පූර්ණ කර නොමැති අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

09. *සාවද්‍ය තොරතුරු සැපයීම :*

(i) ඔබ විසින් එවන ලද අයදුම්පත්‍රයේ සඳහන් කර ඇත්තා වූ යම් තොරතුරක් අසත්‍ය හෝ වැරදි බව බඳවා ගැනීමට පෙර අනාවරණය වුවහොත් ඔබගේ අපේක්ෂකත්වය අවලංගු කරනු ලැබේ. එබඳු අසත්‍ය හෝ වැරදි තොරතුරු බඳවා ගැනීමෙන් පසුව අනාවරණය වුවහොත් ඊට අදාළ ක්‍රියාමාර්ගයන්ට යටත්ව සේවයෙන් පහ කිරීමට කටයුතු කරනු ලැබේ.

10. රාජ්‍ය භාෂා ප්‍රතිපත්ති ක්‍රියාමත්ක කිරීම :

රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 07/2007 හා ඊට ආනුෂාංගික චක්‍රලේඛ අනුව අදාළ මට්ටමේ අනෙක් රාජ්‍ය භාෂාව පිළිබඳව ප්‍රවීණතාවයක් සේවයට බැඳී වසර 05 ක් තුල ලබාගත යුතු ය.

11. සේවයේ නියුක්ත කරවීමේ කොන්දේසි :-

(i) මෙම තනතුර ස්ථිරය. විශ්‍රාම වැටුප් සහිතය. වැන්දඹු අනත්දරු/වැන්දඹු පුරුෂ අනත්දරු විශ්‍රාම වැටුප් අරමුදලට දායක මුදල් ගෙවිය යුතු ය.

(ii) නියම කරනු ලබන පරිදි මෙම දෙපාර්තමේන්තුවට අයත් ඕනෑම තාක්ෂණ/කාර්මික විද්‍යාලයක වුව ද සේවය කිරීමට හැකි විය යුතු ය.

(iii) තෝරාගනු ලබන අපේක්ෂකයින් තනතුරට අදාළ බඳවා ගැනීමේ පරිපාටියේ විධිවිධානවලට ද, ආයතන සංග්‍රහයේ විධිවිධානවලට ද මුදල් රෙගුලාසිවලට ද රජය හෝ රේඛීය අමාත්‍යාංශය හෝ කාර්මික අධ්‍යාපන හා පුහුණු කිරීමේ දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල් විසින් නිකුත් කරනු ලබන නීති හා රෙගුලාසිවලට ද යටත් විය යුතු ය.

(iv) අංක 1589/30 හා 2009.02.20 දිනැති අතිවිශේෂ *ගැසට් පත්‍රයෙන්* රාජ්‍ය සේවා කොමිෂන් සභාව මගින් ප්‍රකාශිත කාර්ය පරිපාටික රීතිවල දැක්වෙන පොදු කොන්දේසි හා විධිවිධාන අදාළ වේ.

12. පුරප්පාඩුවලින් කොටසක් හෝ සියල්ලම හෝ පිරවීමේ අයිතිය කාර්මික අධ්‍යාපන හා පුහුණු කිරීමේ දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල් සතුවේ.

13. මෙම *ගැසට්* නිවේදනයේ සිංහල, දෙමළ හා ඉංග්‍රීසි භාෂා පාඨ අතර යම් අනනුකූලතාවයක් ඇතිවුවහොත්, එවිට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුත්තේ ය.

එස්. බාලසුබ්‍රමනියම්,
අධ්‍යක්ෂ ජනරාල්.

2014 මාර්තු මස 28 වැනි දින,
කාර්මික අධ්‍යාපන හා පුහුණු කිරීමේ දෙපාර්තමේන්තුව,
කොළඹ 10.

ආදර්ශ අයදුම්පත්‍රය

| |
|---|
| |

කාර්යාලයීය ප්‍රයෝජනය සඳහා

කාර්මික අධ්‍යාපන හා පුහුණු කිරීමේ දෙපාර්තමේන්තුවේ කළමනාකරණ සහකාර (තාක්ෂණික නොවන) බණ්ඩ - 2 සේවා ගණයේ ………………තනතුර සඳහා (විවෘත) බඳවා ගැනීම 2013 සඳහා අයදුම්පත්‍රය

1. අයදුම්කරුගේ නම :

 (i) මුලකුරු අගට යොදා මුලකුරු සමග නම (ඉංග්‍රීසි කැපිටල් අකුරින්) :————.
 (ii) සම්පූර්ණ නම (ඉංග්‍රීසි කැපිටල් අකුරින්) :————.
 (iii) සම්පූර්ණ නම (සිංහලෙන්/දෙමළෙන්) :————.

2. ලිපිනය හා දුරකථන අංකය :

 1. කාර්යාලයීය ලිපිනය :————.
 දුරකථන අංකය :————.
 2. පෞද්ගලික ලිපිනය :————.
 දුරකථන අංකය :————.
 (ලිපිනයේ හෝ දුරකථන අංකයේ වෙනසක් වුවහොත්, වහාම දැන්විය යුතු ය.)

3. උපන් දිනය :
 අවුරුද්ද :————. මාසය :————. දිනය :————.

4. අයදුම්පත් භාරගන්නා අවසාන දිනට වයස :
 අවුරුදු :————. මාස :————. දින :————.

5. ජාතික හැඳුනුම්පත් අංකය :————.

6. ස්ත්‍රී/පුරුෂ භාවය :————.

7. විවාහක/අවිවාහක/වැන්දඹු ද යන වග :————.

8. අධ්‍යාපන සුදුසුකම් :

*අ.පො.ස. (සා.පෙ.) විභාගය :————.*

වර්ෂය :————. විභාග අංකය :————.

| *විෂයය* | *ශ්‍රේණිය* |
|---|---|
| | |
| | |
| | |
| | |
| | |
| | |
| | |
| | |
| | |
| | |

*අ.පො.ස. (උ. පෙ.) විභාගය :————.*

වර්ෂය :————.විභාග අංකය :————.

| *විෂයය* | *ශ්‍රේණිය* |
|---|---|
| | |
| | |
| | |
| | |
| | |

9. වෘත්තීය සුදුසුකම් :

| *විභාගය/ඩිප්ලෝමාව* | *වර්ෂය* | *පෙනීසිටි විෂයයන්* | *සාමාර්ථය* | *ආයතනයේ/විශ්ව විද්‍යාලයේ නම* |
|---|---|---|---|---|
| | | | | |

10. පළපුරුද්ද පිළිබඳ විස්තර :

| *සේවය කළ ආයතන* | *තනතුර* | *සේවය කළ කාලය* | *රාජ්‍ය අංශය/ අර්ධ රාජ්‍ය අංශය/ පෞද්ගලික අංශය යන වග* |
|---|---|---|---|
| | | | |

11. පහත සඳහන් විෂයයන්ගෙන් සමත් උසස්ම පරීක්ෂණය :

සිංහල :————.

දෙමළ :————.

ඉංග්‍රීසි :————.

12. (i) ඔබ ශ්‍රී ලංකාවේ පුරවැසියෙකු වන්නේ නම් පෙළපතින්ද/ලියාපදිංචි කිරීමෙන්ද යන්න සඳහන් කරන්න.
(ලියාපදිංචි කිරීමෙන් නම් විස්තර සපයන්න) :————.

(ii)ජන වර්ගය (කොටුව තුළ නියමිත අංකය සටහන් කරන්න.)

සිංහල -1 ශ්‍රී ලංකා දෙමළ-2 ශ්‍රී ලංකා මුස්ලිම් -3 ☐

ඉන්දියානු සම්භාවයක් ඇති -4 වෙනත් -5

13. ඔබ රජයේ තනතුරක් දරමින් සිට එයින් පහ කර තිබේද ?:—————.

14. දැනටමත් රජයේ සේවයේ නියුක්ත නම් ඔබට විරුද්ධව දෙපාර්තමේන්තු විනයානුකූල පරීක්ෂණ කිසිවක් තිබේ ද ?:—————.

15. ඔබ යම් චෝදනාවක් සම්බන්ධයෙන් උසාවියේ වරදකරු වී තිබේ ද? එසේ නම් විස්තර සඳහන් කරන්න. :—————.

මෙම අයදුම්පතෙහි මා විසින් සපයා තිබෙන තොරතුරු සත්‍ය හා නිවැරදි බව මෙයින් සහතික කරමි. මෙහි ඇතුළත් තොරතුරුවලින් කිසිවක් අසත්‍ය හෝ නිවැරදි නොවන බව මා තෝරා ගැනීමට පෙර දැනගතහොත් නුසුදුස්සෙක් වීමට යටත් වන බවත් පත්කිරීමෙන් පසු ඒ බව දැනගතහොත් මා කිසිදු වන්දියක් නොලබා සේවයෙන් පහ කිරීමටත් යටත් වන බවත් මම දනිමි.

—————,
අයදුම්කරුගේ අත්සන.

දිනය :—————.

16. *අයදුම්කරුගේ අත්සන සහතික කිරීම*

මෙම අයදුම්පත ඉදිරිපත් කරනු ලබන ................................... මයා/මිය/මෙනවිය මා පෞද්ගලිකව දන්නා හඳුනන බවත්, ඔහු/ඇය .................. දින මා ඉදිරිපිටදී ඔහුගේ/ඇයගේ අත්සන තැබූ බවත් සහතික කරමි.

—————,
අත්සන සහතික කරන
නිලධාරියාගේ අත්සන.

දිනය :—————.
සහතික කරන නිලධාරියාගේ සම්පූර්ණ නම :—————.
තනතුර :—————.
ලිපිනය :—————.

(මෙම කොටස අදාල වනුයේ රජයේ රැකියාවක නියුක්ත වූවන්ට පමණි)

දෙපාර්තමේන්තු/ආයතන ප්‍රධානියාගේ සහතිකය

මෙම අමාත්‍යාංශයේ/දෙපාර්තමේන්තුවේ/ආයතනයේ සේවය කරන ............................. මයා/මිය/මෙනවිය දැනට ............... තනතුරේ සේවය කරන බවත්, ඔහුගේ වැඩ සහ හැසිරීම සතුටුදායක වන බවත් විනයානුකූල කටයුතු කිසිවක් නොමැති බවත්, ඒ පිළිබඳව කටයුතු කිරීමට අදහස් කර නොමැති බවත් සහතික කරමි. ඔහු මෙම තනතුර සඳහා තෝරා ගතහොත් සේවයෙන් නිදහස් කළ හැකිය/නොහැකිය.

—————,
දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ හෝ බලය පැවරුණු නිලධාරියාගේ අත්සන.

දිනය :—————.

(නිල මුද්‍රාව)

03-931/2

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.